# පටුන


| | | | පිටු අංකය |
|---|---|---|---|
| 1. | ගුවන් හමුදාධිපතිතුමාගේ පණිවිඩය | | 03 |
| 2. | කළමනාකරණ මණ්ඩලය සහ අනෙකුත් විධායක පත්වීම් | | 04 - 09 |
| 3. | කළමනාකාරිත්වයේ තීරණය හා විශ්ලේෂණය | | 10 |
| | අ. | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 10 |
| | (1) | දැක්ම පිලිබඳ ප්‍රකාශය | 10 |
| | (2) | මෙහෙවර පිලිබඳ ප්‍රකාශය | 10 |
| | (3) | මුඛ්‍ය හැකියාවන් | 10 |
| | (4) | අපගේ කාර්යභාරය | 11 |
| | ආ. | සේවක සංයුතිය සහ සේවක සංඛ්‍යාව | 11 |
| | ඇ. | ශ්‍රී ලංකා ගුවන් හමුදා කාර්යසාධනය | 12-13 |
| | ඈ. | කාර්යසාධන කළමනාකරණය සඳහා වන උපායමාර්ගික රාමුව | 13 |
| | ඉ. | උපායමාර්ගික අරමුණු හා ප්‍රතිඵල | 13-17 |
| | ඊ. | මූල්‍ය තත්වය පිලිබඳ විශ්ලේෂිත සාරාංශය | 17-26 |
| | උ. | අභ්‍යන්තර පාලනයන්, මූල්‍ය කළමනාකරණ පද්ධති සහ නීති රෙගුලාසි වලට අනුකූල වීම | 26-27 |
| | ඌ. | 2018 වර්ෂයේ අධ්‍යක්ෂකයන්ගේ හා විධායක අංශයන්ගේ කාර්යසාධන සාරාංශය | 28 |
| | (1) | ගුවන් මෙහෙයුම් අධ්‍යක්ෂකය | 28-39 |
| | (2) | ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂකය | 40-41 |
| | (3) | ගුවන්යානා ඉංජිනේරු අධ්‍යක්ෂකය | 41-64 |
| | (4) | සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂකය | 65-80 |
| | (5) | විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යක්ෂකය | 81-94 |
| | (6) | සැපයුම් අධ්‍යක්ෂකය | 95 |
| | (7) | පරිපාලන අධ්‍යක්ෂකය | 95- 99 |
| | (8) | සිවිල් ඉංජිනේරු අධ්‍යක්ෂකය | 100-103 |
| | (9) | පුහුණු අධ්‍යක්ෂකය | 104-107 |
| | (10) | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකය | 107-109 |
| | (11) | සුභසාධක අධ්‍යක්ෂකය | 110-115 |
| | (12) | දන්ත සේවා අධ්‍යක්ෂකය | 116 |
| | (13) | විනයාරක්ෂක අධ්‍යක්ෂකය | 117-118 |
| | (14) | ප්‍රසාංගික කලා අධ්‍යක්ෂකය | 118-119 |
| | (15) | ගුවන් බුද්ධි අධ්‍යක්ෂකය | 120 |

| | | |
|---|---|---|
| (16) | මාධ්‍ය අධ්‍යක්ෂකය | 121-123 |
| (17) | තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂකය | 124-133 |
| (18) | ක්‍රීඩා අධ්‍යක්ෂකය | 134-135 |
| (19) | මුදල් අධ්‍යක්ෂකය | 136 |
| (20) | සිවිල් පරිපාලන අධ්‍යක්ෂකය | 136 |
| (21) | අයවැය අධ්‍යක්ෂකය | 136 |
| (22) | විධායක බඳවාගැනීමේ අංශය | 136-137 |
| (23) | විධායක ගුවන් ආරක්ෂණ පරීක්ෂණ ඒකකය | 137-138 |
| (24) | විධායක තත්ව නිර්ණ නිරීක්ෂණ ඒකකය | 139-142 |
| (25) | විධායක නීති දෙපාර්තමේන්තුව | 142-144 |
| (26) | අභ්‍යන්තර විගණන අංශය | 145-153 |
| (27) | විධායක පර්යේෂණ හා සංවර්ධන අංශය | 154-155 |
| (28) | එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් අංශය | 155-156 |
| 4. | මූල්‍ය ප්‍රකාශන | 157-175 |
| 5. | ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිදු කල ආයතනික සමාජ වගකීම් පිලිබඳ ව්‍යපෘති ක්‍රියාකාරකම් | 176-208 |
| 6. | ආයතනික ව්‍යුහය | 209 |
| 7. | විගණන හා කළමනාකරණ කමිටුව | 209-211 |
| 8. | සමාප්තිය | 212 |
| 9. | කෙටි යෙදුම් | 213-215 |
| 10. | ඇමුණුම් | 216 |

# 1. ගුවන්හමුදාධිපතිතුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන්හමුදාධිපති හා ගණන්දීමේ නිලධාරියා ලෙස පත්ව ගෙවී යන දෙවන මූල්‍ය වර්ෂය වන 2018 වර්ෂයට අදාලව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වාර්ෂික කාර්යසාධන වාර්තාව සඳහා පණිවිඩයක් එක් කිරීමට ලැබීම සම්බන්ධයෙන් මා ඉතා සතුටු වන අතර එය මා ලද ගෞරවයක් ලෙස සලකමි. සමස්ථයක් ලෙස ගත් කල 2018 වර්ෂය අභියෝගාත්මක වර්ෂයක් වූ නමුත් මා විශ්වාස කරන පරිදි අඛණ්ඩ ප්‍රගතියක් ද අත් කර ගත හැකි වූ වර්ෂයකි.

පාර්ලිමේන්තු පාලන සීමාවන් තුල රැඳී සිටිය හැකි පරිදි අප විසින් අපගේ සම්පත් ඉතා සුපරීක්ෂාකාරීව හසුරවා ඇත. මුලෝපායික පෙර දැක්ම අනුව මාගේ අරමුණ වන්නේ වාර්ෂික ඇස්තමේන්තු මගින් ලද අයවැය ප්‍රතිපාදන සීමාවන් තුල හිඳිමින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට වඩාත් තිරසාර ප්‍රවේශයක් සහිත දැඩි නමුත් යථාර්තවාදී ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කිරීමයි.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත මහජන මුදල් වියදම් දැරීම සඳහා අනුමැතිය ලැබෙනුයේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරගන්නා වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගිනි. වෙන් කල ප්‍රතිපාදන වලට සාපේක්ෂව වියදම් දැරීම මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද බලතල අනුව සිදු කරනු ලබයි. 2018 වර්ෂය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා ගැනීමේ අරමුණින් 2017 අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් තම ඇස්තමේන්තු කෙටුම්පත් ඉදිරිපත් කරන ලදී. තවද, 2018 වර්ෂයේ දෙපාර්තමේන්තුගත වියදම් සැලසුම් 2018-2020 තුන් අවුරුදු සංයුක්ත සැලැස්ම මත පදනම් විය.

මූල්‍ය වර්ෂයක් ආරම්භයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අයවැය ප්‍රතිපාදන එහි අධ්‍යක්ෂවරුන් හා විධායක නිලධාරීන් අතර බෙදා හරිනු ලබයි. ශ්‍රී ලංකා ගුවන් හමුදා සංයුක්ත සැලැස්මෙන් දක්වා ඇති ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා වන වාර්ෂික අයවැය ප්‍රතිපාදන, කාර්යක්ෂම හා සඵලදායි ලෙස උපයෝගී කරගැනීමට ගණන්දීමේ නිලධාරියා ලෙස මා විසින් අධ්‍යක්ෂවරුන් හා විධායක නිලධාරීන් හට ඔවුන්ගේ විෂයපථයන් ප්‍රකාරව වගකීම් පවරන ලදී. එබැවින් එවැනි අධ්‍යක්ෂවරුන් හා විධායක නිලධාරීන් තමන් වගකීම දරන විෂය ක්ෂේත්‍ර වලට අදාළව අවශ්‍ය කරන ජයග්‍රහණ හා දෙපාර්තමේන්තු අභ්‍යන්තර පාලන හා ආරක්ෂණ රාමුවෙහි අවශ්‍යතාවන් ලඟා කරගැනීමට බැඳී සිටියි.

ආදායම් උත්පාදනය පිලිබඳ සලකන කල්හි,ශ්‍රී ලංකා ගුවන් හමුදා බලඇණි 02ක් දකුණු සුඩානයේ හා මධ්‍යම අප්‍රිකානු ජනරජයේ ක්‍රියාත්මක එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා යොදවන ලද අතර මහා භාණ්ඩා -ගාරයට දැඩි අවශ්‍යතාවයක්ව පවතින විදේශ විනිමය ඉපැයීම් වර්ධනය සඳහා මෙම සාමසාධක මෙහෙයුම් කටයුතු තවත් පුළුල් කිරීමට අපේක්ෂිතය.

මෙහෙයුම් වලට අමතරව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව 2018 වර්ෂය තුල ජාතිය ගොඩනැඟීමට සහය වීම, ජාතික සංහිඳියාව ඇති කිරීම ආදී නොයෙකුත් විශේෂ අවස්ථාවන් සඳහා දායකත්වය ලබා දී ඇත. ලංකා ගුවන් හමුදාවට ඉදිරි වර්ෂයේදීද තවත් අභියෝග වලට මුහුණ දීමට ඉඩප්‍රස්තාව ඇති නමුත් වර්තමානයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාව සිදු කරන මෙහෙවර තුලින් ගම්‍ය වන්නේ මව්බිම වෙනුවෙන් සේවය කරන අපගේ නිර්භය විරුවන් අනාගතයේදී තමන්ගේ කාර්යභාරය වඩාත් ඵලදායිව සිදු කිරීමට හැකියාව ලබා ගනු ඇති බවයි.

එයාර් මාර්ෂල් කපිල ජයම්පති
WWV, RWP, RSP & three Bars, VSV, USP, MSc(Int Rel), MMSc (Strat Stu-China), M (SL), fndu (China), qhi
ගුවන්හමුදාධිපති
2019 අප්‍රේල් 30

## 2. කළමනාකරණ මණ්ඩලය සහ අනෙකුත් විධායක පත්වීම්

### අ. කළමනාකරණ මණ්ඩලය

ශ්‍රී ලංකා ගුවන් හමුදාව පාලනය කරනු ලබන්නේ කළමනාකරණ මණ්ඩලයක් විසිනි. 2018 වර්ෂයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් පහත පරිදිය.

(1) ගුවන් හමුදාධිපති

එයාර් මාර්ෂල් කේ වි බි ජයම්පති WWV, RWP, RSP and three Bars, VSV, USP, MSc (Int Rel), MMSc(Strat Stu-China), M (SL), fndu (China), qhi

(2) මාණ්ඩලික ප්‍රධානී

එයාර් වයිස් මාර්ෂල් ඩි එල් එස් ඩයස් RSP and three Bars, MSc (Def Strat Stu), ndc, psc

(3) නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී

එයාර් වයිස් මාර්ෂල් ඒ එම් ද සොයිසා MSc, (Def & Strat Stu), MSc (NSWS-Pak), ndc (Pak), ctf-ndu,psc

(4) ගුවන් මෙහෙයුම් අධ්‍යක්ෂ

එයාර් වයිස් මාර්ෂල් එස් කේ පතිරණ RWP and Bar, RSP and three Bars, USP, MSc (MOA) USA, MSc (Def Stu) in Mgt, M Phil(Ind), M(SL), ndc(Ind), psc, qfi

(5) ගුවන්යානා ඉංජිනේරු අධ්‍යක්ෂ

එයාර් වයිස් මාර්ෂල් එම් ඩි රත්නායක MSc (Def Stu) in Mgt, MDS, psc

(6) සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂ

එයාර් වයිස් මාර්ෂල් ඒ ඩබ් ඊ විජේසූරිය USP, MSc (MOA), USA, MSc (Def Stu) in Mgt, MSc (MSWS-Pak), MDS, ndc (Pak), psc.

(7) විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යක්ෂ

එයාර් වයිස් මාර්ෂල් ඒ ඩබ් ඊ විජේසූරිය USP, MSc (MOA), USA, MSc (Def Stu) in Mgt, MSc (MSWS-Pak), MDS, ndc (Pak), psc (2018.07.22 දින දක්වා)

ගුවන් කොමදෝරු කේ ඒ එල් රණතුංග USP, MSc (Def Stu) in Mgt, MSc (l Stu), MDS, fndu (China), psc (2018.07.23 දින සිට)

(8) සැපයුම් අධ්‍යක්ෂ

එයාර් වයිස් මාර්ෂල් එච් එම් එස් කේ බී කොටකදෙනිය WWV, RWP, RSP, USP, MSc (Def & Strat Stu), fndu, psc

(9) පරිපාලන අධ්‍යක්ෂ

එයාර් වයිස් මාර්ෂල් සී පී වැලිකල USP (2018.06.03 දින දක්වා)

එයාර් වයිස් මාර්ෂල් පී ඩි කේ ටී ජයසිංහ RWP, RSP and two Bars, USP, MSc (War Stu & Def Mgt-Pak), MSc (Def Stu) in Mgt, MoSS (Ban), LLB, aowc (Pak), ndc (2018.06.04 දින සිට)

(10) ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂ

එයාර් වයිස් මාර්ෂල් කේ එෆ් ආර් ප්‍රනාන්දු RSP, USP, MDS, ctf-ndu, psc

(11) සිවිල් ඉංජිනේරු අධ්‍යක්ෂ

එයාර් වයිස් මාර්ෂල් එම් ආර් කේ සමරසිංහ Eng, USP, BSc (Def Stu), AE(SL)

(12) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

එයාර් වයිස් මාර්ෂල් එල් ආර් ජයවීර USP, MBBS (Sri Lanka), MSc (Def & Strat stu), Dip (AV med-USA), psc

(13) පුහුණු අධ්‍යක්ෂ

එයාර් වයිස් මාර්ෂල් පී ඩි කේ ටී ජයසිංහ RWP, RSP and Bar, USP, MSc (War Stu & Def Mgt-Pak), MSc (Def stu) in Mgt, MoSS (Ban), LLB, aowc (Pak), ndc. (2018.05.29 දින සිට)

එයාර් වයිස් මාර්ෂල් ඩබ් එම් කේ එස් පී වීරසිංහ USP, MMS, MSc (Def & Strat Stu), MBA, MA (Fin & Econ), BA (Def Stu), Pg Dip (IR), SMM, M(SL), hdmc, psc (2018.05.30 දින සිට)

(14) සුභසාධක අධ්‍යක්ෂ

එයාර් වයිස් මාර්ෂල් පී ඩි ඒ මාරිස්ටෙලා MBBS (Sri Lanka)

## ආ. කළමනාකරණ මණ්ඩලයට අයත් නොවන අධ්‍යක්ෂ පත්වීම්

(1) ගුවන් බුද්ධි අධ්‍යක්ෂ

එයාර් වයිස් මාර්ෂල් එච් එම් එස් කේ බී කොටකදෙනිය WWV, RWP, RSP, USP, MSc (Def & Strat Stu), fndu, psc

(2) අයවැය අධ්‍යක්ෂ

ගුවන් කොමදෝරු එස් එම් එස් පී කොස්වත්ත USP,BA (Def Stu)

(3) නීති අධ්‍යක්ෂ

ගෲප් කපිතාන් එස් එන් එස් එන් ඩයස් LLM, LLB, BA, (Leg Pol) Attorney at Law, Notary Public, Comssioner for Oaths, Company Secretary

(4) මාධ්‍ය අධ්‍යක්ෂ

ගෲප් කපිතාන් එම් ඩි ඒ ජී සෙනෙවිරත්න USP, MDS, BSc (Aero Eng-USA), psc

(5) විනයාරක්ෂක අධ්‍යක්ෂ

ගුවන් කොමදෝරු වී පී බාලසූරිය USP, MDS, BA (Def Stu), M (SL), psc, (2018.06.13 දක්වා)

ගෲප් කපිතාන් පී එන් ද කොස්තා (2018.06.14 දින සිට 2018.09.13 දින දක්වා)

එයාර් වයිස් මාර්ෂල් එම් ඩබ් ටී අයි ද සිල්වා RSP, psc (2018.09.14 දින සිට)

(6) ප්‍රසාංගික කලා අධ්‍යක්ෂ

ගෲප් කපිතාන් එම් සී අමරසිංහ

(7) ක්‍රීඩා අධ්‍යක්ෂ

ගුවන් කොමදෝරු අයි කේ වීරරත්න USP, BA (Def Stu)

(8) තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ

ගුවන් කොමදෝරු ඒ එස් විතාන USP, MSc (Def Stu) in Mgt, BSc (Hons), psc

## ඇ. විධායක පත්වීම්

(1) සමූහ ගුවන් ආරක්ෂණ මෙහෙයුම් ආඥාපති

එයාර් වයිස් මාර්ෂල් එම් ඩි ඒ පී පායෝ RWP, RSP, USP, MSc (NSWS-Pak), ndc (pak), psc

(2) අණදෙන නිලධාරී, ස්වේච්ඡා ගුවන් හමුදාව

ගුවන් කොමදෝරු සී එච් ආර් සොයිසා USP, MSc (Def & Strat Stu), BA (Def Stu), psc (2018.02.14 දින දක්වා)

ගුවන් කොමදෝරු සී එන් වීරසිංහ USP, BA(Def Stu) (2018.02.15 දින සිට)

(3) අණදෙන නිලධාරී, ශ්‍රී ලංකා ගුවන් හමුදා කාන්තා පක්ෂාංගය

ගුවන් කොමදෝරු ආර් එස් බියන්විල USP, psc

(4) විධායක කෘෂි නිලධාරී

ගෘප් කපිතාන් ඕ ඒ එන් එස් ප්‍රනාන්දු USP, MSc (Def Stu) in Mgt, MDS, BSc, (Def Stu) in mgt, MHRM,psc

(5) විධායක විගණන නිලධාරී

ගෘප් කපිතාන් එම් ඒ එස් එන් විජේසිංහ USP, MSc (Def Stu) in Mgt, BSc (Pub Adn), CBA (ICASL)

(6) විධායක දන්ත වෛද්‍ය නිලධාරී

ගෘප් කපිතාන් ඩබ් කේ එම් වීරසේකර MS (Orthodontics), BDS (Sri Lanka)

(7) විධායක සංවර්ධන ව්‍යාපෘති නිලධාරී

ගුවන් කොමදෝරු ටී ඒ විමලරත්න USP, MSc (Def Stu) in Mgt, BSc (Def Stu), psc.

(8) විධායක ගුවන් ආරක්ෂක නිලධාරී

ගුවන් කොමදෝරු ආර් පී ලියනගමගේ WWV, RWP, USP, MSc (Strat Stu-Pak), MDS, fawc (Pak), psc (2018.08.27 දින දක්වා)

ගුවන් කොමදෝරු ආර් එස් වික්‍රමරත්න RWP and two Bars , RSP and two Bars ,USP, MSc (Strat Stu), ndc (Ind), fawc , qfi (2018.08.28 දින සිට)

(9) විධායක උපකරණ වර්ගීකරණ පරීක්ෂක (F/W)

ගෑප් කපිතාන් ඒ වී ජයසේකර WWV and Bar, RWP, RSP and two Bars, psc, qfi

(10) විධායක උපකරණ වර්ගීකරණ පරීක්ෂක (R/W)

ගෑප් කපිතාන් වී බී එදිරිසිංහ WWV, RWP, RSP and three Bars, psc, qhi

(11) විධායක අභ්‍යන්තර විගණක (සේවා)

විංග් කමාන්ඩර් ආර් ආර් සෝමතිලක MBS (Col), B.Com (Sp) Hons, Pg Dip (Def Mgt), CBA (ICASL), MAAT (SL), FPFA, CPFA

(12) විධායක ප්‍රකාශන නිලධාරී

ගුවන් කොමදෝරු කේ ජී ඩී එන් ජයසිංහ Msc (Def & Strat Stu), BSC (Def Stu) in Mgt, psc

(13) විධායක තත්ත්ව නිරීක්ෂණ නිලධාරී

ගුවන් කොමදෝරු ටී ඒ ඩී ආර් සේනානායක RWP, RSP, USP

(14) විධායක බඳවාගැනීමේ නිලධාරී

ගුවන් කොමදෝරු ඒ ජේ අමරසිංහ RSP, USP, MDS, MHRM, BSc (Def Stu) in Mgt, psc

(15) විධායක පර්යේෂණ හා සංවර්ධන නිළධාරි

ගුවන් කොමදෝරු ජේ පී බාලසූරිය USP, MSc (Def Stu) in Mgt, BSc (Def Stu) in Mgt

(16) විධායක සුහසාධක ව්‍යාපෘති නිලධාරී

ගෑප් කපිතාන් ඩී සී අයි වීරසූරිය USP, isc, psc

## ඇ. සිවිල් මාණ්ඩලික පත්වීම්

(1) සිවිල් පරිපාලන අධ්‍යක්ෂ

ඊ එම් ඩී එස් විජේසූරිය මිය SLAS (2018.05.30 දින දක්වා)

ඒ ඒ අයි කේ අමරසිංහ මිය BA (2018.08.01 දින සිට)

(2) මුදල් අධ්‍යක්ෂ

ජී ආර් එල් වසන්ත මයා B. Com (sp), MA (Econ), FMAAT, DIPPCA, CBA, APFA, AMA, CPFA, Dip in Accy

(3) ප්‍රධාන අභ්‍යන්තර විගණක (සිවිල්)

කේ ඒ ඩී ඩී ඒ කුමාරපේලි මිය BBMgt (Acc) Sp, MA (Econ)

# 3. කළමනාකාරිත්වයේ තීරණය හා විශ්ලේෂණය

## අ. ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### (1) දැක්ම පිළිබඳ ප්‍රකාශය

"ගුවන් බලය සඵලව යෙදවීමෙන් ජාතික ආරක්ෂාව තහවුරු කිරීම"

### (2) මෙහෙවර පිළිබඳ ප්‍රකාශය

"ගුවන් මෙහෙයුම් ක්‍රියාත්මක කරවීමෙහිලා අපගේ සුවිශේෂී නිපුණතාවයන් මත පදනම් වූ වෘත්තීය සුවිශිෂ්ඨතාවයෙන් අනූන ගුවන් හමුදාවක් මඟින් ජාතික ආරක්ෂක මෙහෙවර සාක්ෂාත් කිරීම"

### (3) මූලාශ්‍ය හැකියාවන්

ආයතනයක මූලාශ්‍ය හැකියාවන් එහි ඉලක්කගත අරමුණු ලඟා කරගැනීම සඳහා ආයතනය මෙහෙයවන ප්‍රධාන නිර්නායකයන් වේ. ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතුවද එවැනි මූලාශ්‍ය හැකියාවන් පවතින අතර ඒවා පහත පරිදිය.

(අ) යුධමය පියාසර කිරීම් හා ගුවන් ආරක්ෂක හැකියාව ශ්‍රී ලංකාව තුල යුධමය පියාසර කිරීම් සහ ගුවන් ආරක්ෂක මෙහෙයුම් සිදු කිරීමේ හැකියාව ඇති එකම ආයතනය ශ්‍රී ලංකා ගුවන් හමුදාව වේ.

(ආ) සීමිත සම්පත් නවෝත්පාදාත්මක ලෙස උපයෝජනය ශ්‍රී ලංකා ගුවන් හමුදාව අතීතයේ සිට විවිධ වූ තත්වයන් යටතේ සීමිත සම්පත් උපයෝජනය කිරීම හා යෙදවීම තුලින් උපරිම ප්‍රතිඵල ලඟා කරගැනීමේ අද්විතිය හැකියාවක් පෙන්නුම් කර ඇත.

(ඇ) අනේකවිධ මෙහෙයුම් අත්දැකීම්වලින් සන්නද්ධ වූ වෘත්තිමය, අභිප්‍රේරිත ශ්‍රම බලකායක් බ්‍රිතාන්‍ය රාජකීය ගුවන් හමුදාවේ පොහොසත් සම්ප්‍රධායන්ට උරුමකම් කියන, වෘත්තිමය සංවර්ධන ව්‍යුහයක් හා සුවිශේෂී පුහුණුවක් සහිතව ආරම්භයේ සිටම විවිධ මෙහෙයුම් කාර්යයන් සඳහා ගුවන් බලය ලබා දීමෙන් ලද අත්දැකීම් සම්භාරයක් ද කැටිකර ගත් ශ්‍රී ලංකා ගුවන් හමුදාව, සේවය වෙනුවෙන් කැප වූ, අභිප්‍රේරිත සහ අනුවර්තිත හැකියාවෙන් ඉහල වෘත්තිමය බලකායක් බිහිකර ඇත.

(ඈ) ජාතික ආරක්ෂාව සඳහා සයිබර් අවකාශය හා විද්‍යුත් චුම්භක වර්ණාවලිය සඵලදායිව, ආරක්ෂාකාරීව හා වගකීමෙන් යුක්තව උපයෝජනය කිරීම.

(ඉ) දීපව්‍යාප්ත විදුලි සංදේශ, තොරතුරු තාක්ෂණ සහ රේඩාර් ජාලයේ හිමිකාරිත්වය හරහා සන්නිවේදන හා ගුවන් නිරීක්ෂණ සඳහා විද්‍යුත් චුම්භක වර්ණාවලියත්, තොරතුරු කළමනාකරණය සඳහා සයිබර් අවකාශයත් ප්‍රයෝජනයට ගැනීමට ගුවන් හමුදාව සතුව අද්විතීය හැකියාවක් ඇත.

### (4) අපගේ කාර්යභාරය

(අ) යුධ හා නාවික හමුදාවන්ට උපායශීලී ගුවන් ආධාර සහ ගමනාගමන පහසුකම් සැලසීම.

(ආ) රජයේ ඉල්ලුම මත මුදලට ගැනීමේ පහසුකම් හා ගමනාගමන පහසුකම් සලසාදීම.

(ඇ) ගුවන් යානා, මාර්ග ගමනාගමන, විද්‍යුත් උපකරණ, වෙනත් පිරියත හා යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම සඳහා ඉංජිනේරු හා සැපයුම් කටයුතු සම්පාදනය කිරීම.

(ඈ) අභ්‍යන්තර ආරක්ෂක මෙහෙයුම් සඳහා භට පිරිස් සැපයීම.

(ඉ) යුධමය නොවූ ගුවන් මෙහෙයුම් වල නිරතවීම හා ජාතික සංවර්ධනය සඳහා වූ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාවට නැංවීම.

(ඊ) එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා භට පිරිස්, ගුවන්යානා හා වාහන ලබා දීම තුලින් සක්‍රීයව දායක වීම.

## ආ. සේවක සංයුතිය සහ සේවක සංඛ්‍යාව

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2018 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු පහත (1) සහ (2) වගු තුල දක්වා ඇත.

### (1) සේවා කාර්ය මණ්ඩලය

| විස්තරය | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය | අතිරික්ත (පුරප්පාඩු) |
|---|---|---|---|
| නිලධාරීන් (නිත්‍ය/ස්වේච්ඡා) | 2,156 | 2,057 | (99) |
| සෙසු නිලයන් (නිත්‍ය/ස්වේච්ඡා) | 35,844 | 34,006 | (1,838) |
| **එකතුව** | **38,000** | **36,063** | **(1,937)** |

වගුව :1

### (2) සිවිල් කාර්ය මණ්ඩලය

| විස්තරය | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය | අතිරික්ත (පුරප්පාඩු) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 8 | 7 | (1) |
| තෘතික මට්ටම | 4 | 3 | (1) |
| ද්විතික මට්ටම | 176 | 113 | (63) |
| ප්‍රාථමික මට්ටම | 2,900 | 2,710 | (190) |
| **එකතුව** | **3,088** | **2,833** | **(255)** |

වගුව :2

## ඇ. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කාර්යසාධනය

### (1) හැඳින්වීම

2018 මුදල් වර්ෂයේ දී , ජාතික ආරක්ෂාව සැපයීමේ මූලික කාර්යභාරය සඳහා ගුවන් බලය ඵලදායී ලෙස මෙහෙයවීමට අතිරේක වශයෙන්, සංවර්ධන ක්‍රියාදාමයන් සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව දායකත්වය ලබා දී ඇත. විශේෂයෙන්ම 2018 වර්ෂය තුල සංචාරක කර්මාන්තයේ උන්නතිය උදෙසා අවශ්‍ය යැයි හඳුනාගත් අභ්‍යන්තර ගුවන් ප්‍රවාහන කටයුතු සංවර්ධනයේ ප්‍රමුඛත්වය උසුලා ක්‍රියාකොට ඇත. එමෙන්ම ශ්‍රී ලංකා ගුවන් හමුදාව ජාතික ආපදා හා ව්‍යසන තත්ත්ව වලදී තුවාලකරුවන් ඉවත් කිරීම ඇතුළු හට කණ්ඩායම් යෙදවීම ආදිය සඳහා ක්‍රියාකාරී සහභාගිත්වයක් ලබා දී ඇත. 2018 වාර්ෂික කාර්යසාධන වාර්ථාවේ වාර්ෂික මුදල් වෙන් කිරීම් හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ විශ්ලේෂණය ඇතුළත් වේ. තවද, 2018 වර්ෂය තුළ සපුරා ලිය යුතු ආයතන ගත කාර්යයන් පවත්නා කාර්යසාධනයට එරෙහිව විශ්ලේෂණය කර ඇති අතර 2018 වර්ෂයේ අපේක්ෂා කළ සැලැස්ම සඳහා මෙය විශේෂ කොට සකස් කර ඇත.

### (2) වාර්ෂික අයවැය වාර්තාව සමග වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම විශ්ලේෂණය කිරීම.

(අ) වාර්ෂික කාර්යසාධන වාර්තාව වාර්ෂික අයවැය වාර්තාව හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව සකස් කර ඇති අතර, වර්ෂ 2018 සිට 2020 දක්වා වූ සංයුක්ත සැලැස්මේ විදහා දක්වන ඉලක්ක පරයා ගිය කාර්යයන් වාර්ථා කරයි. සෑම අංශයකම කාර්යයන් පිළිබඳ කෙටි සාරාංශයක් හා ඇගයීමක් මෙන්ම වර්ෂය තුළදී ආරක්ෂාව හා සම්බන්ධ කටයුතු වල සමහර අදාල අංශවල සවිස්තරාත්මක තොරතුරු වලංබිම සපයන අතිරේකයන් අඩංගු වේ.

(ආ) උසස් මට්ටමේ ප්‍රමුඛස්ථානයන් හා වෙනස්කම් වත්මන් කාලය ඉස්මතු වන අයුරින් වාර්ෂික අයවැය සිතාමතා සැලසුම් කිරීමේ ආකාරය මත මෙම අංශය සංවිධානය වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමස්ත ව්‍යුහය ස්ථිර ලෙස පැවතුනද, අරමුණ මුදුන් පමුණුවා ගැනීමේලා යම් ප්‍රමාණයක උසස් මට්ටමේ වෙනස්කම් එක් අයවැයක සිට ඊළඟ අයවැයට යාම නොවැළැක්විය හැකි අතර එයාකාරයෙන් ඒවා එකිනෙක බැඳී ඉදිරිපත් කෙරේ.

(ඇ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අරමුණු ඉතාමත් ඉහල මට්ටමින් 2018-2020 සංයුක්ත සැලසුමේ පෙන්වා දී ඇත. වාර්ෂික කාර්යසාධන වාර්තාව 2018 සිට 2020 දක්වා වූ වර්ෂවල සංයුක්ත සැලසුමේ සඳහන් ඉලක්ක වලට එරෙහිව වර්ෂ 2018 දෙසැම්බර් 31 දින තෙක් වූ කාර්යසාධනයේ සාරාංශයට අදාළව ආරම්භ කෙරේ. වාර්තාව මුළුල්ලෙහි වියදම් පිළිබඳව විග්‍රහයක් සිදු කර ඇත.

### (3) දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශන 2018

(අ) අවුරුද්ද තුළ ලබා ගත් මුදල් ප්‍රතිපාදන, මෙහෙයුම් ප්‍රතිපාදන, සහ වියදම් කළ ආකාරය පිළිබඳ විස්තරයක් සහිතව සෑම මුදල් වර්ෂයක් සඳහාම මූල්‍ය ප්‍රකාශණ පිළියෙළ කිරීම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. මූල්‍ය ප්‍රකාශණ මුදල් රෙගුලාසි හා මහා භාණ්ඩාගාර නිර්ණායකවලට අනුකූලව මුදල් මත පදනම් වන පරිදි පිළියෙල කෙරේ.

(ආ) දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු වල පවත්නා තත්වය, ශුද්ධ සම්පත් නිපැයුම, අරමුණු උදෙසා යොදා ගත් සම්පත්, හඳුනාගත් ලාභ හා අලාභ, මුදල් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහය පිළිබඳ සත්‍ය හා සාධාරණ අදහසක් ලබා දිය යුතු වේ. 2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශණ මෙම වාර්ථාවට අමුණා ඇත.

## ඇ. කාර්යසාධන කළමනාකරණය සඳහා වන උපායමාර්ගික රාමුව

(1) මෙහිදී, කාර්යසාධන කළමනාකරණය යනු උපායමාර්ගික අරමුණු හා ප්‍රමුඛතාවයන් නියම කිරීම, එහිලා වැඩසටහන් නිර්මාණය කිරීම, එම වැඩසටහන් වල ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම,ඉලක්කගත අරමුණු සාක්ෂාත් කරගැනීම කෙරෙහි දත්ත රැස්කිරීම හා ප්‍රගතිය මැන බැලීම, සම්පත් විභජනය හා එකී වැඩසටහන් කෙරෙහි බලපෑ හැකි පරිදි කාර්යසාධන හා ඇගයුම් තොරතුරු උපයෝගී කර ගැනීම සහ ආයෝජකයන් වෙත එහි ප්‍රතිඵල සන්නිවේදනය කිරීම ආදී බහු අදියරයන්ගෙන් යුක්ත ක්‍රියාවලියකි.

(2) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කාර්යසාධන කළමනාකරණය, 2018-2020 වර්ෂ සඳහා වන ශ්‍රී ලංකා ගුවන් හමුදා තුන් අවුරුදු ආයතනික සැලැස්ම හා 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව මෙහෙයවා ඇත.

## ඉ. උපායමාර්ගික අරමුණු හා ප්‍රතිඵල

ශ්‍රී ලංකා ගුවන් හමුදා **2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම** හා **2018 - 2020 සඳහා වන සංයුක්ත සැලැස්ම** මඟින් පිහිටුවාගත් අරමුණු හා පරමාර්ථ ලඟා කර ගැනීම සඳහා 2018 වර්ෂය තුලදී පහත කාර්යයන් ඉටු කර ඇත.

**(1) අරමුණ 01** ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු පියාසර හා මෙහෙයුම් ශක්‍යතාවයන් ඉහල නැංවීම හා ශක්තිමත් කිරීම.

<u>ප්‍රධාන ඉටුකර ගැනීම්</u>

(අ) ජාතික ගුවන් ආරක්ෂක ශක්‍යතාවන් වර්ධනය කිරීම සඳහා ROHONI 3D CAR රේඩාරය හා එහා මෙහා ගෙනයා හැකි ගිනි පාලක රේඩාර් පද්ධතිය, මිසයිල ඒකක සහ ස්වයංප්‍රචාලිත ගුවන්යානා නාශක මිසයිල පද්ධතියක් අත්කරගැනීමේ ක්‍රියාවලිය.

(ආ) ගුවන් මෙහෙයුම් හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා දැනට ශ්‍රීලංගුහ සතු ප්‍රහාරක ගුවන්යානා ඇණිය යාවත්කාලීන කරමින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට Multirole ප්‍රහාරක ගුවන් යානා හා බර උසුලාගෙන යා හැකි (උපායශීලි හා උපායමාර්ගික) ගුවන්යානා ලබා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම. තවද, 2018 වර්ෂයේදී ගුවන්යානා පිරිවැඩියා කිරීමේ ව්‍යාපෘතිය හරහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු F7-B සහ F7- G multi-role ප්‍රහාරක ගුවන්යානා පිරිවැඩියා කිරීම.

(ඇ) මානුෂිය ආධාර හා ආපදා සහන කටයුතු වලදී කලාපීය සහයෝගිතාවය ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු ගුවන් වත්කම් හා තිබෙන සම්පත් උපයෝජනය කරමින් අනෙකුත් කලාපීය ගුවන් හමුදා හා එක්ව මානුෂිය ආධාර හා ආපදා සහන කටයුතු වල නිරත වීම.

## (2) අරමුණ 02 අනන්‍ය ආර්ථික කලාපය ද ඇතුළුව ශ්‍රී ලංකා භූමිය තුළ උපායමාර්ගික හා උපායශීලි ගුවන් නිරීක්ෂණ හා සෝදිසි හැකියාවන් වර්ධනය කිරීම.

<u>ප්‍රධාන ඉටුකර ගැනීම්</u>

(අ) කලාපීය ගුවන්හමුදා සමඟ සහයෝගිත්වය ඇතිකරගනිමින් ශ්‍රී ලංකා නාවික හමුදාව හා අනෙකුත් කලාපීය ආයෝජකයින් සමඟ එක්ව ඒකාබද්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීම, තාක්ෂණික දියුණුව අත් කර ගැනීම මෙන්ම සමුද්‍රීය ගුවන් හැකියාව වර්ධනය සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවට පහසුකම් සලසමින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සමුද්‍රීය හැකියාව වර්ධනය කිරීම සඳහා අංක 3 සමුද්‍රීය බලඝනය පිහිටුවීම.

(ආ) ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතුව දැනට පවතින නියමුවන් රහිත ගුවන්යානා පද්ධතිය වැඩිදියුණු කරමින් හා ගුවන් හා නාවික උපායමාර්ගික අණ මධ්‍යස්ථානය සමඟ සම්බන්ධ වන පරිදි තත්කාලීන දත්ත සම්බන්ධතා/සන්නිවේදන මාර්ග පිහිටුවමින් උපායමාර්ගික නියමුවන් රහිත ගුවන්යානා පද්ධතියක් ලබා ගැනීම සඳහා වන යෝජනාව ආරම්භ කිරීම. එමෙන්ම පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ දේශීයව වැඩිදියුණු කරන ලද නියමුවන් රහිත ගුවන් යානා පද්ධතිය සාර්ථකව නිමා කිරීම.

## (3) අරමුණ 03 EW ශාඛාව පිහිටුවීම හා ජාල කේන්ද්‍රීය යුධ මෙහෙයුම් (Network Centric Warfare) හඳුන්වා දීම.

<u>ප්‍රධාන ඉටුකර ගැනීම්</u>

ශ්‍රීලංගුහ හා අනෙකුත් ආරක්ෂක ආයතන වලට සම්බන්ධ සයිබර් ආරක්ෂක සිද්ධීන් හඳුනා ගැනීම හා අධීක්ෂණය සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක වන ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයක් ලෙස ආරක්ෂක අමාත්‍යංශයේ සයිබර් මෙහෙයුම් මධ්‍යස්ථානය ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේදී පිහිටුවීම.

## (4) අරමුණ 04 අත්‍යවශ්‍ය ගුවන් වත්කම් හා පිහිටුවීම් සඳහා පුළුල් පිරිස් ආරක්ෂාවක් ලබා දීම හා VAs හා VPs සඳහා ආරක්ෂාව සැපයීම.

<u>ප්‍රධාන ඉටුකර ගැනීම්</u>

නියමිත ප්‍රදේශ ආවරණය වන පරිදි නව ගුවන් ආරක්ෂණ ඒකකයන් යෙදවීම මඟින් භූමිගත ගුවන් ආරක්ෂණ ආවරණය ශක්තිමත් කිරීම, ගුවන් ආරක්ෂණ අණ හා පාලන මධ්‍යස්ථාන ප්‍රතිස්ථානගත කිරීම, පරිමිත ආරක්ෂාව වැඩි කිරීම සඳහා ශ්‍රීලංගුහට අයත් ආයතන සඳහා CCTV කැමරා හා ඒ ආශ්‍රිත උපකරණ ලබාගැනීම හා ප්‍රතිපාදනය.

## (5) අරමුණ 05 දිවා/ රාත්‍රී/ සියලුම කාලගුණික තත්ත්ව වලදී මෙහෙයුම් අතිරික්තතාව අත් කර ගැනීම සඳහා ශ්‍රීලංගුහ ගුවන් තොටුපළ පරිශ්‍ර සංවර්ධනය කිරීම.

<u>ප්‍රධාන ඉටුකර ගැනීම්</u>

(අ) අයි.සී.ඒ.ඕ. නියමයන් ප්‍රකාරව සියලුම ගගනයාත්‍රාංගන සලකුණු හා හෙලිපැඩ් සලකුණු ප්‍රමිත කිරීම. අධ්‍යක්ෂ ජෙනරාල්, සිවිල් ගුවන්සේවා මඟින් සියලුම සිවිල් ගුවන්යානා ක්‍රියාකරවන්නන් වෙත ඔවුන්ගේ ගිනි වැළැක්වීමේ සම්මත මෙහෙයුම් පටිපාටි පිළිබඳව ගුවන් යානා ගොඩබෑස්සවීමේ ස්ථානවල රාජකාරියේ යෙදී සිටින ශ්‍රීලංගුහ ගිනි නිවන භටයින් දැනුවත් කරන ලෙස දැන්වීම.

(ආ) ගුවන්ධාවන පථ හා ගුවන්ධාවන පථයට පිවිසෙන මාර්ග වල අවශ්‍ය අලුත්වැඩියාවන් සිදු කිරීම සමඟ වායුපිඩනමාන, සුළං වේග දර්ශක සහ ගගනයාත්‍රාංගන ප්‍රදීප වැනි අයි.සී.ඒ.ඕ. සම්මත උපකරණ භාවිතයෙන් ගුවන් ගමන් පාලන කුළුණු වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම.

**(6) අරමුණ 06** මිත්‍ර හමුදාවන් හට සයිබර් අවකාශය භාවිතයේ නිදහස තහවුරු කරමින් හා සතුරු පාර්ශවයන් හට එය භාවිතය/අයථා භාවිතය ප්‍රතික්ෂේප කරමින් සයිබර් අවකාශය උපරිම අයුරින් භාවිතයට ගැනීම.

<u>ප්‍රධාන ඉටුකර ගැනීම්</u>

අභ්‍යන්තර ජාලය භාවිතයේදී පැමිණෙන වෛරස් සහ වෙනත් පරිගණක පද්ධතියේ ආරක්ෂාවට තර්ජනයක් විය හැකි වැඩසටහන් හඳුනාගැනීමේ හා වැලැක්වීමේ හැකියාව දියුණු කරන firewall හි ස්ථිරාංග අනුවාද වැඩිදියුණු කිරීම. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අභ්‍යන්තර පද්ධති වල මෙන්ම hosted websites වල ආරක්ෂාව තීව්‍ර කිරීම සඳහා අවදානම් ඇගයුම් සහ විනිවිදබව පරීක්ෂා කල හැකි මෙවලම් කිහිපයක් මිලදී ගැනීම.

**(7) අරමුණ 07** අතිරේක සුභසාධන ක්‍රියාකාරකම් ඇති කිරීම මගින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුල ප්‍රවාසතාව අවම කිරීම හා ඉහල චිත්ත ධෛර්යයක් පවත්වාගෙන යාම.

<u>ප්‍රධාන ඉටුකර ගැනීම්</u>

සුභසාධන අධ්‍යක්ෂකය හා ශ්‍රීලංගුහ සේවා වනිතා ඒකකය මගින් සියලුම අංශ වල ප්‍රමාණවත් පරිදි සුභසාධන කටයුතු ඉහල නැංවීම. තවද, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය ඉහල චිත්ත ධෛර්යයකින් යුක්ත කරවීමට අවශ්‍ය පුහුණුව ලබා දීම.

**(8) අරමුණ 08** ජාතික අවශ්‍යතාවයට සහය වීම සඳහා ශ්‍රීලංගුහ සතු සම්පත් ප්‍රශස්තිකරණය.

<u>ප්‍රධාන ඉටුකර ගැනීම්</u>

(අ) ගුවන් හා ගොඩබිම් මුදවා ගැනීමේ පද්ධතිය ශ්‍රී ලංකාවට හඳුන්වා දීම සඳහා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය සමග වන හවුල් ව්‍යාපාරයට පහසුකම් සැලසීම.

(ආ) ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු ගුවන් වත්කම් හා කාර්ය මණ්ඩලය උපයෝගී කරගනිමින් කෘතීම වැසි ඇති කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලංකා විදුලි බල මණ්ඩලයට අවශ්‍ය සහය ලබා දීම.

(ඇ) ශ්‍රී ලංකා රජයේ වනවගා ව්‍යාපෘතියට සහය දැක්වීම පිණිස ශ්‍රී ලංකාවේ පළමු වතාවට ගුවනින් බීජ ඉසීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම.

(ඈ) ඕස්ට්‍රේලියානු සමුද්‍රාරක්ෂක අධිකාරිය හා එක්ව සොයා ගැනීමේ හා බේරා ගැනීමේ පාලන රාමුව සංවර්ධනය සඳහා සිවිල් ගුවන් සේවා අධිකාරියට සහය දැක්වීම හා සොයා ගැනීමේ හා බේරා ගැනීමේ මෙහෙයුම් පිලිබඳ ජාත්‍යන්තර වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා සහභාගී වීම.

(ඉ)	මාලි රාජ්‍යයේ එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා ශ්‍රීලංගුහ සේවා පුද්ගලයින් 150 දෙනෙකු සමග 17 වර්ගයේ හෙලිකොප්ටර් 04ක් (නව හෙලිකොප්ටර් යානා ලැබුණු පසුව)යෙදවීමට නියමිතය.

(ඊ)	ක්ෂණික විහිදුම් බලකායක් ලෙස මාලි රාජ්‍යයේ එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා ශ්‍රීලංගුහ සේවා පුද්ගලයින් 160 දෙනෙකු යෙදවීමට නියමිතය.

(උ)	2018 වර්ෂය තුලදී එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් හරහා රාජ්‍ය භාණ්ඩාගාරය වෙත සැලකිය යුතු ප්‍රමාණයේ විදේශීය ආදායමක් (විදේශ විනිමය ලැබීම්) උත්පාදනය කර දීම.

| | |
|---|---|
| පියාසර පැය ගණන (පැය 2303.57) | - ඇම ඩො 9,813,208.82 |
| ප්‍රධාන උපකරණ සහ ස්වයං පැවැත්ම | - ඇම ඩො 1,329,225.17 |
| හට පිරිස් සඳහා ගෙවීම් | - ඇම ඩො 3,606,866.54 |

(ඌ)	2018 වර්ෂය තුලදී ශ්‍රී ලංකා ගුවන් හමුදාව කුලී ගුවන් ගමන් හා MA-60 ගුවන්යානා ගුවන්ගමන් වාර හරහා ලං රු.54,380,436.32 සහ ලං රු 20,326,616.88 ක ආදායමක් රාජ්‍ය භාණ්ඩාගාරය වෙත උත්පාදනය කරදීම.

(එ)	2019 ජනවාරි 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි ත්‍රිකුණාමලය හරහා කටුනායක සිට පලාලි දක්වා ගමන් කරන MA-60 ගුවන් ගමන් වාර සඳහා අය කරන ගුවන් ගාස්තු අඩු අගයන් සහිතව සංශෝධනය කිරීම.

(ඒ)	මහනුවර ශ්‍රී දළදා මාළිගාවෙහි ගිනි ගැනීම් වලක්වා ගැනීමේ සැලැස්මක් ක්‍රියාත්මක කර ඇති අතර සතියේ දින 7 පුරා, පැය 24ක සේවාවක් ලබා දීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදා ගිනි නිවීමේ හට කණ්ඩායමක් හා ගිනි නිවීමේ රථයක් ශ්‍රී දළදා මාලිගාවේ සේවය සඳහා වෙන් කිරීම.

(ඔ)	ජපානයේ පරිත්‍යාගයක් ලෙස ගිනි නිවීමේ රථ 03ක් හා ගිලන් රථ 01ක් ලබා ගැනීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම. එසේ ලැබුණු ගිනි නිවීමේ රථ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගිනි නිවීමේ හැකියාවන් වැඩිදියුණු කල හැකි පරිදි වඩාත් යෝග්‍ය ස්ථානවලට යොමු කර ඇති අතර ගිලන්රථය ගුවන් හමුදා ප්‍රජා සත්කාරයක් ලෙස අරලගන්විල රෝහලට පරිත්‍යාග කිරීම.

## (9) අරමුණ 09 කාර්යක්ෂමතාව ඉහල නැංවීම හා වෘත්තිමය දක්ෂතා වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ දැනට ක්‍රියාත්මක පුහුණු වැඩසටහන් පද්ධතිය හා එහි ක්‍රියාවලින් සමාලෝචනය.

<u>ප්‍රධාන ඉටුකර ගැනීම්</u>

(අ)	පුහුණු පාඨමාලාවන් නිම කල නිලධාරීන් සහ ගුවන්භටයින්/ ගුවන් කාන්තාවන් සම්බන්ධයෙන් අදාල ශාඛා ප්‍රධානින් හා අණ දෙන නිලධාරීන් මගින් කාර්යසාධන සමාලෝචන පැවැත්වීම.

(ආ)	අනෙකුත් රටවල් හා සහෝදර සේවාවන්ගේ පුහුණු පාඨමාලා පද්ධති සංසන්දනය කිරීම, එම පාඨමාලා හැදෑරීම, සංචාරය කිරීම හා මාණ්ඩලික මට්ටමේ සාකච්ඡා පැවැත්වීම මගින් පුහුණු වැඩසටහන් පිලිබඳ ගෝලීය ප්‍රවණතාවයන් හඳුනා ගැනීම සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ඒවායෙහි ඇති යෝග්‍යතාවය අධ්‍යයනය කිරීමෙන් පසුව අවශ්‍ය පුහුණු පාඨමාලාවන් ක්‍රියාත්මක කිරීම.

(ඇ) පවතින අවශ්‍යතාවය මත අනවශ්‍ය ක්ෂේත්‍ර ඉවත් කර වර්තමාන ප්‍රපංචයන්ට ආමන්ත්‍රණය කරන නව විෂයයන් ඇතුලත් කර, විෂය නිර්දේශයන් සංශෝධනය කිරීම.

(ඈ) "ජාතික ඵලදායිතා සම්මාන තරගාවලිය 2018 රන් සම්මානය ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් දිනා ගැනීම.

**(10) අරමුණ 10** නව තාක්ෂණය හඳුන්වාදීම හා බඳවාගැනීමේ සැලැස්ම සංශෝධනය කිරීම මගින් ශ්‍රී ලංකා ගුවන් හමුදා බලකා ව්‍යුහය නිරවද්‍ය ප්‍රමාණයට ගෙන ඒම.

<u>ප්‍රධාන ඉටුකර ගැනීම්</u>

ගුවන් හමුදාවේ ඉදිරි අවශ්‍යතා ඉටු කරගැනීම සඳහා අවශ්‍ය බඳවාගැනීම් සැලසුම් කරමින් ආයතනික අරමුණු හා පරමාර්ථ කාර්යක්ෂමව ළඟා කරගත හැකි වන පරිදි ශ්‍රී ලංකා ගුවන් හමුදා බලකා ව්‍යුහය සමාලෝචනය කිරීම හා නිරවද්‍ය ප්‍රමාණයට ගෙන ඒම.

## ඊ. මූල්‍ය තත්වය පිලිබඳ සාරාංශගත විශ්ලේෂණය

### (1) මූල්‍ය සමාලෝචනය

ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත 2018 වර්ෂයේ මුළු ආරක්ෂක වියදම් වෙනුවෙන් ලං.රු.මි. 43,200.44 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ආරම්භයේදීම ලැබී ඇත. අනතුරුව ලං.රු.මි. 627.40 මුදලක් අතිරේක ප්‍රතිපාදන වශයෙන් ලබා දී ඇති අතර එය අතිරේක මෙහෙයුම් වියදම් ලෙස දැක්වේ. එවිට මුළු ශුද්ධ ප්‍රතිපාදන වශයෙන් ලබා දී ඇති අතර එය අතිරේක මෙහෙයුම් වියදම් ලෙස දැක්වේ. එවිට මුළු ශුද්ධ ප්‍රතිපාදන ප්‍රමාණය ලං.රු.මි. 43,827.84කි. වර්ෂය සඳහා මුළු සත්‍ය ආරක්ෂක වියදම වුයේ ලං.රු.මි. 41,481.86 කි. මෙය නියෝජනය වන්නේ ලං.රු.මි. 34,624.00 ක් පුනරාවර්තන වියදම් වශයෙන්ද ලං.රු.මි. 6,857.86 ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් ද වේ. කෙසේ හෝ මුළු ශුද්ධ ප්‍රතිපාදනය 9.70% කින් වැඩි වි ඇති අතර 2017 වර්ෂය සමග සැසඳිමේදී සත්‍ය වියදම 4.79% කින් වැඩි වි ඇත. කෙසේ හෝ 2018 වර්ෂයේ සමස්ථ ආරක්ෂක වියදම පාර්ලිමේන්තුවෙන් අනුමත මුළු ප්‍රතිපාදන තුළ පැවති අතර ශ්‍රී ලංකා මුදල් හා සැලසුම් අමාත්‍යාංශයේ මුළු පාලන වියදම් තුළද පැවතුනි.




රූප සටහන - 1

## (2) මූල්‍ය කාර්යසාධනය

2018 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සමස්ථ එකතුකළ ආදායම ලං.රු.මි. 42,526.69 කි. මෙයට ආදායම් ලැබීම් ලෙස ලං.රු.මි. 74.57 ක් හා ආදායම් නොවන ලැබීම් ලෙස ලං.රු.මි. 42,452.11 ක් ඇතුලත්ය. 2017 වර්ෂය හා සැසඳීමේදී සමස්ථ එකතු කල ආදායම 5.37% කින් වැඩි වී ඇත.




රූප සටහන - 2

### (අ) ආදායම් ලැබීම්

2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හුදු ආදායම් ලැබීම් වන්නේ බදු නොවන ආදායම් හා වෙනත් ආදායම් ය. ගුවන් යානා කුලී ගාස්තු පමණක් බදු නොවන ආදායම් වලට ඇතුලත් වන අතර 2018 වර්ෂය ආරම්භයේදී එය ලං.රු.මි. 173ක් ලෙස මුලිකවම ඇස්තමේන්තු කර තිබුණි. කෙසේ නමුත් 2018 වර්ෂය තුලදී ඇස්තමේන්තුගත වටිනාකම ලං.රු.මි. 80.05 ලෙස සංශෝධනය කර ඇත. හිඟ ආදායම් ද ඇතුළුව එකතු කල සමස්ථ ගුවන්යානා කුලී ආදායම ලං.රු.මි. 74.58ක් බවට සටහන් විය.

<u>පුරෝකථනය කල ආදායමට එරෙහිව තත්‍ය ආදායම</u>

| ආදායම් කේතය | 2018 වර්ෂය සඳහා සංශෝධිත අයවැය ගත ආදායම (ලංරුමි) | 2018 වර්ෂයේ තත්‍ය ආදායම (ලංරුමි) | වෙනස |
|---|---|---|---|
| 20-03-02-16 | 80.05 | 74.58 | 5.47 |

වගුව - 1




රූප සටහන - 3

### (ආ) ආදායම් නොවන ලැබීම්

2018 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආදායම් නොවන ලැබීම් වල එකතුව ලං.රු.මි. 42,526.69 කි. එය 2017 වර්ෂය හා සැසඳීමේදී ලං.රු.මි. 2,240 කින් වැඩි වී ඇත.

ආදායම් නොවන ලැබීම් යටතට භාණ්ඩාගාර අග්‍රිම, තැන්පතු, අත්තිකාරම් ගිණුම හා අනෙකුත් ලැබීම් ලෙස පිලිවෙලින් ලං.රු.මි. 39,448.19 ලං.රු.මි. 442.85, ලං.රු.මි. 401.42 හා ලං.රු.මි. 2,159.65 අයත්ය.

### (ඇ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වියදම්

2018 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සමස්ථ වියදම ලං.රු.මි. 41,481.86 ක් වන අතර එයින් ලං.රු.මි. 34,624 ක් පුනරාවර්තන වියදම් ලෙසත්, ලං.රු.මි. 6,857.86 ක් ප්‍රාග්ධන වියදම් ලෙසත්, ලං.රු.මි. 701.49 ක් ප්‍රධාන ලෙජර් වියදම් ලෙසත් වියදම් දරා ඇත. ඒ අනුව පෙර වර්ෂය හා සැසඳීමේදී 2018 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සමස්ථ වියදම 10% කින් වැඩි වී ඇත.




රූප සටහන - 4

## (ඇ) පුනරාවර්තන වියදම්

2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පුනරාවර්තන වියදම් ලෙස ලං.රු.මි.36,512.60 ක මුදලක් වෙන් කර තිබෙන අතර ඊට පුද්ගල වැටුප් ලෙස ලං.රු.මි. 29,271.00 ක් හා අනිකුත් පුනරාවර්තන වියදම් ලෙස ලං.රු.මි. 7,241.60 ක් ඇතුලත්ය. 2018 වර්ෂය තුලදී මුදල් රෙගුලාසි 66 හා 69 ප්‍රකාරව වැටුප් හා වේතන සඳහා වන වෙන් කිරීම් වලින් ලං.රු.මි. 1,362.80 ක් වෙනත් පුනරාවර්තන වියදම්, ස්ථාවර වත්කම් අත්කර ගැනීම් හා ශක්‍යතා ගොඩනැගීම සඳහා මාරු කර ඇත.මෙයින් ලං.රු.මි. 706.00 ක් වෙනත් පුනරාවර්තන වියදම් සඳහා මාරු කර ඇති අතර ඉතිරි ලං.රු.මි. 656.80ක් ප්‍රාග්ධන වියදම් සඳහා නියමිත පරිදි මාරු කර ඇත. මුදල් රෙගුලාසි 66 හා 69 ප්‍රකාරව සිදු කල මාරු කිරීම්ද ඇතුලත්ව සමස්ථ ප්‍රතිපාදන ප්‍රමාණය ලං.රු.මි. 35,855.80 ක් වන අතර ඉන් තත්‍ය වියදම වන්නේ ලං.රු.මි. 34,624.00 කි. මුළු ඇස්තමේන්තු මුදල මුල්‍යකරණය කිරීමට අපේක්ෂා කරනු ලැබුයේ රාජ්‍ය වෙන් කිරීම් මගිනි. භාන්ඩාගාරය වෙත ඉදිරිපත් කළ මුළු ඇස්තමේන්තු වියදම් පහත දක්වා ඇති පරිදි වේ.

| | ලං.රු.මි. |
|---|---|
| පුද්ගල වේතන | 29,271.00 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 7,241.60 |
| මුරෙ 66 හා 69 ප්‍රකාරව සිදු කල මාරු කිරීම් | (656.80) |
| **එකතුව** | **35,855.80** |
| සංශෝධිත (අතිරේක) පුනරාවර්තන ප්‍රතිපාදන | නැත |
| **අතිරේක ප්‍රතිපාදන සමඟ මුළු ශුද්ධ ප්‍රතිපාදන** | **35,855.80** |




රූප සටහන - 5

## (ඉ) ප්‍රාග්ධන වියදම්

i. අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම, ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සහ සිවිල් සේවා නියුක්තිකයන්ගේ සහ හමුදා සේවකයන්ගේ ශක්‍යතාව ගොඩ නැගීම් යන දෑ ලබාදීම සඳහා ප්‍රාග්ධන වියදම් ලෙස ලං.රු.මි. 6,687.84 ක් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ලැබී ඇත. අතිරේක ප්‍රතිපාදන ලෙස 2018 වර්ෂය තුල ලං රු මි 627.40 ක මුදලක් ලැබී ඇත. ඊට අමතරව මුරෙ 66 හා 69 ප්‍රකාරව, ලංරු මි 656.80ක් හා ලංරුමි 70.00 ක් වැටුප් හා වේතන සහ වෙනත් ප්‍රාග්ධන වියදම් වලින් ප්‍රාග්ධන වත්කම් වැඩිදියුණු කිරීම හා පුනරුත්තාපනය, ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම සහ ශක්‍යතාව ගොඩනැගීම සඳහා පිලිවෙලින් ලංරුමි 55ක්, ලංරුමි 526.80ක් සහ ලංරුමි 145.00ක් ලෙස මාරු කර ඇත. කෙසේ වුවද, මුරෙ 66 හා 69 ප්‍රකාරව සිදු කල මාරු කිරීම් හා ඇතිකරන ප්‍රතිපාදනද සමඟ මහා භාණ්ඩාගාරය විසින් අනුමත කල මුළු ප්‍රාග්ධන ප්‍රදානය ලංරුමි 7,972.04 කි. 2017 වර්ෂය සමඟ සැසඳීමේදී 2018 වර්ෂයේ සමස්ථ ශුද්ධ ප්‍රතිපාදනය 7.76% කින් අඩු වී ඇත. ඒ අනුව 2018 වර්ෂයේ සංශෝධිත ප්‍රාග්ධන ප්‍රතිපාදනය පහත පරිදිය.

| | ලං.රු.මි |
|---|---|
| මූලික ප්‍රතිපාදනය | 6,687.84 |
| අතිරේක ප්‍රතිපාදනය | 627.40 |
| මුරෙ 66 හා 69 ප්‍රකාරව සිදු කල මාරු කිරීම් | 656.80 |
| **සංශෝධිත ප්‍රාග්ධන ප්‍රතිපාදනය** | **7,972.04** |




රූප සටහන - 6

ii. තවද 2018 වර්ෂයේ තත්‍ය වියදම ලං.රු.මි. 6,857.86ක් වන අතර එය 2017 වර්ෂය හා සැසඳීමේදී 23.93% ක වැඩිවීමකි.

iii. <u>ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම</u>

ශ්‍රී ලංකා ගුවන් හමුදාව මෙම වර්ෂය තුළ ස්ථාවර වත්කම් නඩත්තු කිරීමේ සහ ඒවායේ නිසි ක්‍රියාකාරිත්වය අරමුණු කොට ගෙන ස්ථාවර වත්කම් පුනරුත්තාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා ලං.රු.මි. 2,549.00 ක මුදලක් ආරම්භයේදී පුරෝකථනය කර ඇත. සමස්ථ ශුද්ධ ප්‍රතිපාදනය ලං.රු.මි. 2,604.00 දක්වා වැඩි කරමින් වර්ෂය තුල මුදල් රෙගුලාසි 66 හා 69 ප්‍රකාරව ලං.රු.මි. 55.00 ප්‍රතිපාදනයක් ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම සඳහා පිලිවෙලින් මාරු කර ඇත. ඒ අනුව 2017 වර්ෂය හා සැසඳීමේදී 2018 වර්ෂයේදී සමස්ථ ප්‍රතිපාදනයේ සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. 2018 වර්ෂය සඳහා තත්‍ය වියදම ලං.රු.මි. 2,003.59 කි.

iv. <u>ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම</u>

ශ්‍රී ලංකා ගුවන් හමුදාවට උපකරණ හා බඩු භාණ්ඩ සපයා ගැනීම හා බර යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම ඇතුළු ලං.රු.මි. 3,218.84 ක වටිනාකමකින් යුත් ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා මුලදී ප්‍රතිපාදන සලසා දී තිබුණි. ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාරය විසින් ලං.රු.මි. 3,218.84 ක මුලික වෙන් කල මුදලක් සඳහා අනුමැතිය ලබා දී ඇත. අනතුරුව මුදල් රෙගුලාසි 66 සහ 69 ප්‍රකාරව වැටුප් හා වේතන වියදම් වලින් ලං.රු.මි. 526.80 ක් ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම සඳහා මාරු කර ඇති අතර අතිරේක ප්‍රතිපාදන වශයෙන් ලං.රු.මි. 27.40 ද ලැබීමෙන් පසු ශුද්ධ වෙන්කිරීම් ලෙස ලං.රු මි 3,773.04 ප්‍රමාණයක් වර්ෂය තුල ලැබී ඇත. වර්ෂය තුල සත්‍ය වියදම් වුයේ ලං.රු.මි. 3,580.99. කි.

v. <u>ශක්‍යතා ගොඩනැගීම</u>

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රාග්ධන වියදම් යටතේ ශක්‍යතාව ගොඩනැගීම සඳහා ලං.රු.මි. 450.00 ක මුදලක් අවශ්‍ය බව මුලදී පුරෝකථනය කර ඇත. කෙසේ හෝ වර්ෂය තුලදී මු.රෙ 66 හා මු.රෙ 99 ප්‍රකාරව ලං.රු.මි. 145.00 මාරු කර ඇති අතර එය ශුද්ධ වෙන් කිරීම් ප්‍රමාණය ලං.රු.මි. 595.00 කින් ඉහළ දමා ඇත. 2018 වර්ෂය සඳහා දැරීමට සිදුව ඇති සත්‍ය වියදම ලං.රු.මි. 577.92කි.

vi. <u>වෙනත් ප්‍රාග්ධන වියදම්</u>

ප්‍රාග්ධන වියදම් යටතේ ලං.රු.මි. 1,000.00 ක් වූ ශුද්ධ මුළු ප්‍රතිපාදන මුදලට එරෙහිව හා මුදල් රෙගුලාසි 66 සහ 69 ප්‍රකාරව ලං.රු.මි. 70.00 ක් මාරු කිරීමෙන් හා අතිරේක ප්‍රතිපාදන ලෙස ලං.රු.මි. 600.00 ලැබීමෙන් වෙනත් ප්‍රාග්ධන වියදම් ලෙස ලං.රු.මි. 695.36 ක මුදල් ප්‍රමාණයක් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් වියදම් දරා ඇත.

vii. <u>පුනරාවර්තන වියදම් වර්ග කිරීම් යටතේ ප්‍රතිපාදන වලට එරෙහිව වියදම්</u>

| කාර්ය විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන (ලං.රු.මි.) | වියදම | වෙනස |
|---|---|---|---|
| පුද්ගල වේතන | 27,908.20 | 27,506.37 | 401.83 |
| වෙනත් පුනරාවර්තන | 7,947.60 | 7,117.63 | 829.97 |
| **එකතුව** | **35,855.80** | **34,624.00** | **1,231.80** |

වගුව - 2




රූප සටහන - 7

viii. <u>වාර්ෂික විසර්ජන ගිණුම්වලට අදාල ප්‍රාග්ධන එක් එක් වැය විෂයන් යටතේ ලද ප්‍රතිපාදන හා දරණ ලද ප්‍රාග්ධන වියදම</u>

| ප්‍රාග්ධන වැය විෂය | කාර්ය විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන (ලං.රු.මි ) | වියදම | වෙනස (ලං.රු.මි ) |
|---|---|---|---|---|
| | <u>ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම</u> | | | |
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 162.00 | 155.60 | 6.40 |
| 2002 | පිරියත යන්ත්‍ර හා උපකරණ | 2,317.00 | 1,739.20 | 577.80 |
| 2003 | වාහන | 125.00 | 108.80 | 16.20 |
| | <u>ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම</u> | | | |
| 2101 | වාහන | 647.08 | 647.03 | 0.05 |
| 2102 | ගෘහ භාණ්ඩ හා සවි කිරීම් | 93.00 | 89.29 | 3.71 |
| 2103 | පිරියත යන්ත්‍ර හා උපකරණ | 910.00 | 877.61 | 32.39 |
| 2104 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 2,122.96 | 1967.06 | 155.90 |
| 2401 | ශක්‍යතා ගොඩනැගීම | 595.00 | 577.92 | 17.08 |
| 2509 | වෙනත් ප්‍රාග්ධන වියදම් | 1,000.00 | 695.36 | 304.64 |
| එකතුව | | **7,972.04** | **6,857.87** | **1,114.17** |

වගුව - 3




රූප සටහන - 8

ix. <u>අත්තිකාරම් "බී" ගිණුම් සම්බන්ධයෙන් නියම කල සීමාවන්ට එරෙහිව තත්‍ය සීමාවන්</u>

රාජ්‍ය නිලධාරීන්ට ණය ප්‍රදානය කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු එක් අත්තිකාරම් ගිණුමක් ඇත. වර්ෂය තුළ මෙම ගිණුමේ කටයුතු හා අත්තිකාරම් ගිණුමේ කොන්දේසි ගත සීමාවන් පහත පරිදි වේ.

| විස්තරය | පවත්නා වර්ෂයේදී නිර්දේශිත සීමාවන් ( ලං.රු.මි. ) | පවත්නා වර්ෂයේ තත්‍ය ( ලං.රු.මි.) | වෙනස |
|---|---|---|---|
| <u>අංක:22401 අත්තිකාරම් ගිණුම "බී"</u> | | | |
| උපරිම වියදම් සීමාව | 520.00 | 384.25 | 135.75 |
| අවම ලැබීම් සීමාව | 396.00 | 401.41 | (5.41) |
| උපරිම හර සීමාව | 1,000.00 | 289.44 | 710.56 |

වගුව - 4




රූප සටහන - 9

x. <u>2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය ප්‍රකාශන</u>

2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය ප්‍රකාශන ගණන් දීමේ නිලධාරී හා ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පිළිවෙලින් 2019 පෙබරවාරි 26 හා 28 දිනවලදී අනුමත කරන ලදී.

## ඉ. අභ්‍යන්තර පාලනයන්,මූල්‍ය කළමනාකරණ පද්ධති සහ නීති - රෙගුලාසි වලට අනුකූල වීම

### (1) කළමනාකරණ සහතිකවීම

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශය විසින් සම්පාදිත ප්‍රතිපත්ති හා රෙගුලාසි වඩාත් පුළුල් වන අතර රජයේ ක්‍රියාකාරකම් ඵලදායිව,කාර්යක්ෂමව, සකසුරුවම් ලෙස සහ අවංකභාවයෙන් යුක්තව හසුරුවන බව තහවුරු කරගැනීම සඳහා, සියලුම දෙපාර්තමේන්තු වෙත ඵලදායි කළමනාකරණ පාලන ක්‍රම ගොඩනැගීමට නියම කරයි. සියලු දෙපාර්තමේන්තුගත මෙහෙයුම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් පාලනයක් තහවුරු කිරීම සඳහා සියලුම කළමනාකරණ මට්ටම් වගකීම දරනු ලබයි.

### (2) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

(අ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශය විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මඟින් දක්වන පරමාර්ථ සපුරාලන ඵලදායි අභ්‍යන්තර පාලනයක් හා මූල්‍ය කළමනාකරණ ක්‍රමවේදයක් ගොඩනැගීමේ හා පවත්වාගෙ නයාමේ වගකීම දරනු ලබයි. ශ්‍රී ලංකා ගුවන් හමුදාව, අභ්‍යන්තර පාලනයේ සඵලතාව පිළිබඳ තම ඇගයුම, මෙහෙයුම් වල කාර්යක්ෂමතාව සේම ඵලදායි බව සහ අභ්‍යන්තර පාලනය පිළිබඳ වන මුදල් රෙගුලාසි, රජයේ පනත්, චක්‍රලේඛ මෙන්ම ප්‍රසම්පාදන උපදෙස් කළමනාකරණයේ වගකීම ප්‍රකාරව අදාළ නීති රෙගුලාසි වලට අනුකූල වීම මත සිදු කර ඇත. එම ඇගයුමෙහි ප්‍රතිඵල මත පදනම් වෙමින්, 1992 වර්ෂයේ නිකුත් කල මුදල් රෙගුලාසි මඟින් දක්වන ලද පරමාර්ථ, තම මෙහෙයුම් වල කාර්යක්ෂමතාව හා ඵලදායි බව සඳහා වන අභ්‍යන්තර පාලනය සහ අදාළ නීති රෙගුලාසි හා මූල්‍ය කළමනාකරණ ක්‍රම කෙරෙහි අනුකූල වීම මත ඉටුවන බවට සාධාරණ සහතිකයක් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ලබා දිය හැක.

(ආ) ඊට අමතරව, වත්කම් සුරක්ෂිත කිරීම සහ අදාළ නීති සහ රෙගුලාසි වලට අනුකූල වීමද ඇතුලත්වන පරිදි මූල්‍ය වාර්තාකරණය සඳහා ඵලදායි අභ්‍යන්තර පාලනයක් ඇති කිරීමට හා පවත්වාගෙන යාමට කළමනාකරණය වගකිව යුතු වේ. මුදල් රෙගුලාසි හා අදාළ භාණ්ඩාගාර චක්‍රලේඛ වලට අනුව මූල්‍ය වාර්තාකරණයේදී වන අභ්‍යන්තර පාලනයේ ඵලදායි බව පිලිබඳ ශ්‍රී ලංකා ගුවන් හමුදාව ඇගයුමක් සිදු කර ඇත.  එම ඇගයුමෙහි ප්‍රතිඵල මත පදනම් වෙමින් 2018 දෙසැම්බර් 31 දින දක්වා සිදු කල මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය ඵලදායිව මෙහෙයවනු ලැබූ බවට හා මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය මෙහෙයවීමේදී හා සැලසුම් කිරීමේදී කිසිදු දුර්වලතාවක් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් හඳුනා නොගත් බවට සාධාරණ සහතිකයක් ලබා දිය හැක.තවද, විගණකාධිපතිවරයාගේ විගණන නිලධාරීන් විසින් දේපල ගණනය කිරීම හා මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ ප්‍රමාණාත්මක දුර්වලතා වාර්තා කිරීම ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් අගය කොට සලකනු ලබයි. අභ්‍යන්තර පාලනයන් සම්බන්ධ අපගේ ඇගයීම් හා පිරිඇගයීම් වලදී ඊට සමාන දුර්වලතාවයන් හඳුනාගත් නමුත් ඒවා ප්‍රමාණාත්මක දුර්වලතා ලෙස නොව විශේෂිත අඩුපාඩුකම් ලෙස වර්ග කර ඇත.ඉදිරියේදී මෙම ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා අප කටයුතු කරන්නෙමු.

(ඇ) මූල්‍ය වාර්තාකරණයේදී අභ්‍යන්තර පාලනය තුල ඊට ආවේනික සීමාවන් පැවතීම හේතුවෙන් කෙතරම් මනා ලෙස සැලසුම් කලද එමඟින් මූල්‍ය වාර්තාකරණයේ පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සම්බන්ධව පූර්ණ සහතිකයක් ලබා දිය නොහැකි අතර වරදවා දැක්වීම් හඳුනාගැනීම හෝ වැලැක්වීමද සිදු නොවනු ඇත. එබැවින්, මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය කෙතරම් ඵලදායි ලෙස නිශ්චය කරගෙන තිබුනද එමඟින් ලබා දිය හැක්කේ මූල්‍ය ප්‍රකාශන සැකසීම හා ඉදිරිපත් කිරීමට අදාළ සාධාරණ සහතිකයන් පමණි.

(ඈ) ගුවන් හමුදා අධ්‍යක්ෂ මණ්ඩලයේ රක්ෂණ ප්‍රකාශන හා විවිධ කාර්යයන් සඳහා සිදු කල අනිසි ගෙවීම් පිලිබඳ අප විසින් සිදු කල සමාලෝචනයන් ද සමඟ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධ අපගේ ඇගයුම්  මත ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් මුදල් රෙගුලාසි සම්බන්ධ ප්‍රධාන වගකීම්, පරමාර්ථ සපුරා ගනිමින් සිටින බවට හා එම පරමාර්ථ ඉටු කරගැනීමේදී සැලකිලිමත් විය යුතු අවදානම් තත්වයන් අවම කරගනිමින් සිටින බවට සාධාරණ සහතිකයක් ලබා දීමට අවකාශය ලබා දී ඇත.

## ඖ. 2018 වර්ෂයේ අධ්‍යක්ෂකයන්ගේ හා විධායක අංශයන්ගේ කාර්යසාධන සාරාංශය

### (1) ගුවන් මෙහෙයුම් අධ්‍යක්ෂකය

#### (අ) හැඳින්වීම

i. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මෙහෙයුම් ක්ෂේත්‍රය ගුවන් මෙහෙයුම් අධ්‍යක්ෂකයේ විෂයපථයට අයත්වේ.ගුවන් මෙහෙයුම් ප්‍රදේශ සහ ගුවන් ආරක්ෂාව කෙරෙහි අධ්‍යක්ෂකය වගකීම දරයි.

ii. ගුවන්යානා රක්ෂණය, ගුවන් කාර්‍ය්‍ය මණ්ඩලයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම, ගිනි නිවීම, ගුවන් ගමන් පාලනය, ගුවන් ක්ෂේත්‍ර අරක්ෂාව, ගුවන් බුද්ධිමය කටයුතු හා යුධ කළමණාකරනය යන ප්‍රධාන ශීර්ෂ යටතේ වූ ප්‍රධාන කාර්යයන් ආවරණය වන පරිදි ගුවන් මෙහෙයුම් අධ්‍යක්ෂකයේ සමස්ත අයවැය ලං.රු.මි. 60.92 ක් විය.

iii. 2018 වර්ෂය තුළ, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සැලසුම් කරන ලද ව්‍යාපෘතීන් බොහෝමයක් ගුවන් මෙහෙයුම් අධ්‍යක්ෂකය නිමා කර ඇත.

#### (ආ) තත්‍ය කාර්යසාධනය වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා සැසඳීම.

i. <u>ගිනි නිවීම්</u>

2018 වර්ෂය තුලදී පහත කාර්යයන් සාර්ථකව නිම කර ඇත.විස්තර පහත පරිදිය.

| ක්‍රියාකාරකම් | තත්‍ය වියදම (රු) |
|---|---:|
| Delivery Hose Coupling (Ea-40) | 304,000.00 |
| 28 Zone Card (Ea-01) | 178,250.00 |
| ගිනි නිවීමේ උපකරණ (Ea-25) | 113,600.00 |
| Fire Alarm Battery (Ea-16) | 48,900.00 |
| GI බකට් (Ea-100) | 110,000.00 |
| Rubber Biding (M-30) | 3,300.00 |
| අධි පීඩන නළ (M-20) | 13000.00 |
| 08 Zone Panel Board (Ea-02) | 173,650.00 |
| SLAF Base Katunayake Fire SVP | 240,000.00 |
| එකතුව | **1,184,700.00** |

ii. 2018 වර්ෂයේදී ගුවන් මෙහෙයුම් සම්බන්ධයෙන් වන මෙහෙයුම් කාර්යසාධනය.

(i). 2018 වර්ෂය තුල ශ්‍රී ලංකා ගුවන් හමුදාව ඊට අයත් ගුවන් යානා සමුහය විශේෂ/ප්‍රභූ පුද්ගල ගුවන් යානා ගමන්,භට කණ්ඩායම්/මගීන් සහ බඩු තොග ප්‍රවාහනය, ගුවන් නිරීක්ෂණ මෙහෙයුම්, වාණිජ හා අභ්‍යන්තර ගුවන් ප්‍රවාහනය ඇතුළු ජාතික අවශ්‍යතාවන් ඉටු කිරීම සඳහා යොදවාගෙන ඇත. කෙසේ නමුදු ඉහත කාර්යයන් ඉටු කිරීම සඳහා ගුවන් බලය හැසිරවීමේදී තම සහෝදර සේනා(යුධ,නාවික, පොලිස්) වල සහයෝගය හා අන්‍යෝන්‍ය සබඳතාව ද එක ලෙස වැදගත් විය.

(ii). පහත සඳහන් ප්‍රධාන මෙහෙයුම් වර්ගීකරණයන් යටතේ 2018 වර්ෂය තුල පියාසර කරන ලද මුළු **පියාසර පැය ගණන 14,645.14 කි.**

| මෙහෙයුම් වර්ගය | පියාසර පැය |
|---|---|
| මෙහෙයුම් | 4,448.40 |
| ඒකාබද්ධ මෙහෙයුම් | 112.20 |
| මෙහෙයුම් විදේශීය | 2,077.55 |
| පුහුණු | 6,412.19 |
| අති විශේෂ පුද්ගල ගුවන් ගමන් | 618.15 |
| විශේෂ පුද්ගල ගුවන් ගමන් | 220.15 |
| වාණිජ | 117.50 |
| මුහුදින් එතෙර ගුවන් ගමන් | 20.00 |
| වෙනත් | 617.40 |
| **එකතුව** | **14,645.14** |

(iii). පසුගිය වසර 05 තුල පියාසර පැය ගණන් සැසඳීම පහත දක්වා ඇත.

| මෙහෙයුම් වර්ගය | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | **2014** | **2015** | **2016** | **2017** | **2018** |
| මෙහෙයුම් | 2,224.24 | 3,700.00 | 6,961.93 | | 4,448.40 |
| ඒකාබද්ධ මෙහෙයුම් | - | - | - | - | 112.20 |
| මෙහෙයුම් විදේශීය | - | - | - | - | 2,077.55 |
| පුහුණු | 8,270.35 | 5,023.30 | 6,588.00 | 5,875.38 | 6,412.19 |
| අති විශේෂ පුද්ගල ගුවන් ගමන් | 422.35 | 382.00 | - | 601.30 | 618.15 |
| විශේෂ පුද්ගල ගුවන් ගමන් | 676.50 | 167.40 | - | 281.35 | 220.15 |
| වාණිජ | 1,582.40 | 427.30 | 396.20 | 278.35 | 117.50 |
| මුහුදින් එතෙර ගුවන් ගමන් | 42.50 | 21.10 | | - | 20.00 |
| වෙනත් | - | - | - | **5,685.50** | **617.40** |
| **එකතුව** | **13,218.34** | **9,721.10** | **13,946.13** | **12,721.88** | **14,645.14** |




රූප සටහන - 10

(iv). 2018 වර්ෂය තුල ගෘහස්ථ වාණිජ ගුවන් ගමන් මගින් ලැබූ ආදායමෙන් ලං.රු.මි. 74.57ක් ජාතික භාණ්ඩාගාරය වෙත බැර කර ඇත.

iii. <u>2018 වර්ෂය තුල සිදු කල ගුවන් මෙහෙයුම් හා වෙනත් ආශ්‍රිත ක්‍රියාකාරකම්</u>

(i). <u>ගිනි නිවීම් (බම්බි බකට් මෙහෙයුම)</u>

2018 වර්ෂය තුලදී ශ්‍රී ලංකා ගුවන් හමුදාව තමන් සතු ගුවන් හා ගොඩබිම් සම්පත් උපයෝගී කරගනිමින් ගිනි නිවීමේ මෙහෙයුම් සිදු කර ඇත. ඒ සඳහා පියාසර කරන ලද මුළු පියාසර පැය ගණන වන්නේ පැය 4.20 කි. 2018 ඔක්තෝම්බර් 11 වන දින බත්තරමුල්ල පැලවත්ත ප්‍රදේශයේ cool planet ගොඩනැගිල්ලෙහි ඇති වූ ගින්න මැඩපැවැත්වීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ බම්බි බකට් සහිත බෙල් 212 හෙලිකොප්ටර් යානාවක්, ගිනි නිවීමේ රථ හා ගිනි නිවීමේ භට පිරිස් යොදවන ලදී. බෙල් 212 හෙලිකොප්ටර් යානාවේ සේවක පිරිස එහි එල්ලා ඇති බම්බි බකට් උපකාරයෙන් ගින්න නිවීම සඳහා මෙහෙයුම් 17 ක් සිදු කර ඇති අතර අවට ගොඩනැගිලි සඳහා ගින්න පැතිරීම වැලැක්වීම සඳහා සහය දක්වන ලදී.



(ii). <u>විශේෂ සෝදිසි මෙහෙයුම්</u>

2018 වර්ෂය තුල ධීවර බෝට්ටු සෙවීමේ, අතුරුදහන් වූ පුද්ගලයින් සෙවීමේ හා මුහුදට මුසුවූ තෙල් ඉවත් කිරීමේ මෙහෙයුම් සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා එක්ව, අවශ්‍ය අවස්ථා වල සිවිල් ප්‍රජාවට සහය ලබා දීමද තහවුරු කරමින් විශේෂ සෝදිසි මෙහෙයුම් ක්‍රියාත්මක කර ඇත. මේ සඳහා පියාසර කරන ලද මුළු පැය ගණන පැය 18.05 කි.



(iii). <u>ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් ගිලන් රථ පියසැරිය</u>

සිවිල් ප්‍රජාවගේ ඉල්ලීම මත ඉතා කෙටි දැනුම් දීමක් තුල උපරිම මට්ටමින් ආරක්ෂාව සහතික කරමින් රෝගීන් ගුවන් මඟින් රැගෙන යාම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් ගිලන්රථ පියසැරිය ක්‍රියාත්මක කර ඇත. මේ සඳහා පියාසර කරන ලද මුළු පියාසර පැය ගණන පැය 11.25 කි.

(iv). <u>ගංවතුර සහන මෙහෙයුම්</u>

ගංවතුරින් විපතට පත්වූවන්ට සහන සැලසීම සඳහා 2018 වර්ෂය තුල ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් විශේෂ පිරික්සුම් මෙහෙයුම් සිදු කර ඇත. මේ සඳහා පියාසර කරන ලද මුළු පියාසර පැය ගණන පැය 12.25 කි.

(v). <u>බේරා ගැනීමේ මෙහෙයුම්</u>

මුලතිව් හි තිත්තන්කුලම් වැවේ වේල්ල බිඳීයාමෙන් විපතට පත් ගොවින් හයදෙනෙකු ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් බේරාගෙන ඇත. මේ සඳහා පියාසර කරන ලද මුළු පියාසර පැය ගණන 01.25 කි.

(vi). <u>පැසිෆික් ඒන්ජල් - 2018 (HCA) වැඩසටහන</u>

පැසිෆික් කලාපයේ අවශ්‍යතා සහිත ප්‍රදේශ සඳහා මානුෂිය සිවිල් ආධාර (HCA) හා සිවිල්-යුධ මෙහෙයුම්(CMO) රැගෙන



ඒම සඳහා නිර්මිත ඇමරිකා එක්සත් ජනපද ගුවන් හමුදාවේ පැසිෆික් ගුවන් අණ හට පිරිස් (USPACOM) විසින් අනුග්‍රහය දක්වන "පැසිෆික් ඒන්ජල්-2018" ඒකාබද්ධ මානුෂිය ආධාර මෙහෙයුම ශ්‍රී ලංකා ගුවන් හමුදාවේද සහය ඇතිව 2018 අගෝස්තු මස 06 දින සිට 20 දින දක්වා වව්නියාව,අනුරාධපුරය හා සීගිරිය යන ප්‍රදේශ වලදී ක්‍රියාත්මක කර ඇත. මෙම වැඩසටහන ප්‍රධාන ලෙසම සිවිල් පුද්ගලයන් සඳහා මූලික සෞඛ්‍ය පහසුකම්,භෞතික චිකිත්සා, දෘෂ්ටි හා දන්ත වෛද්‍ය පහසුකම් සැපයීම සඳහා අරමුණු වුවකි.බංග්ලාදේශ ගුවන් හමුදාව,මාලදිවයින් ආරක්ෂක බලකාය, නේපාල යුධ හමුදාව නියෝජනය කර පැමිණි නියෝජිතයන් හා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වෛද්‍ය/දන්ත නිලධාරීන් හා හෙදියන්ද ඇතුළු පැසිෆික් ගුවන් හමුදාවේ වෘත්තිමය වෛද්‍යවරුන්ගේ ඒකාබද්ධ කණ්ඩායමක් විසින් සුදුසු වෛද්‍ය ප්‍රතිකාර ලබා දී ඇත. වව්නියාව හෙද විද්‍යාලේ හෙද සිසුන් කණ්ඩායමක් සහ රතු කුරුස සංවිධානය මෙයට භාෂණ පරිවර්තකයින් ලෙස එක්වෙමින් සහයෝගය ලබා දී ඇත.

(vii). <u>පැසිෆික් සහයෝගිතාව-2018 (HADR අභ්‍යාසය)</u>

ඇමරිකා එක්සත් ජනපද ගුවන් හමුදාවේ පැසිෆික් ගුවන් අණ හට පිරිස් (PACOM) විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව හා ශ්‍රී ලංකා



නාවික හමුදාව සමඟ සම්බන්ධීකරණයෙන් යුක්තව 2018 මැයි 2 දින සිට 7 දින දක්වා පැසිෆික් සහයෝගිතාව-2018 මානුෂිය ආධාර හා ආපදා සහන පිලිබඳ අභ්‍යාසය පවත්වා ඇත. එමෙන්ම බෙල් 212 හෙලිකොප්ටර් යානා උපයෝගී කරගනිමින් USNS Mercy නෞකාවේ සිට MEDEVAC ඉවත් කිරීමේ අභ්‍යාසය පවත්වන ලදී.

(viii). <u>70 වෙනි නිදහස් දින උළෙල සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ඉදිරිපත් වීම</u>

ගුවන් මෙහෙයුම් අධ්‍යක්ෂකය විසින් Bell 212 හෙලිකොප්ටර් යානා 01ක්, Bell 412 හෙලිකොප්ටර් යානා 03ක්, MI 17 හෙලිකොප්ටර් යානා 04ක්, Cessna 150 ගුවන්යානා 05ක්, PT-6 ගුවන්යානා 03ක්, Y-12 ගුවන්යානා 04ක්, B-200 ගුවන්යානා 02ක්, C-130 ගුවන්යානා 01ක්, AN 32 ගුවන්යානා 01ක්, MA-60 ගුවන්යානා 01ක්, K-8 ගුවන්යානා 03ක්, කෆීර් යානා 01ක් සහ F-7 ගුවන්යානා 03ක් ලෙස ගුවන්යානා 30කින් සමන්විත වන පරිදි පියාසර පෙළපාලිය පවත්වා ඇත. ගුවන් සංදර්ශනයේ අවසානය සනිටුහන් කරමින් ගාලු මුවදොර අහස හරහා කෆීර් යානාවක් පියාසර කරවන ලදී.




(ix). <u>ගුවන් හමුදා ප්‍රදර්ශනය හා සැණකෙළිය -2018</u>

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 67 වැනි සංවත්සරයට සමගාමීව 2018 මාර්තු 05 දින අම්පාර ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරේදී ගුවන් හමුදා සැණකෙළියක් හා අධ්‍යාපන ප්‍රදර්ශනයක් ඉතා සාර්ථක අන්දමින් පවත්වන ලදී.



(x). <u>ඉන්දියාවේ පැවති "SAMVEDNA" බහුඅංශික මානුෂීය ආධාර හා ආපදා සහන සැලසීමේ අභ්‍යාසයේ පියාසර හා ගොඩබිම් පුහුණුවීම්</u>

2018 මාර්තු 12 දින සිට 16 දින දක්වා ඉන්දියාවේ තිරුවනන්තපුරම් හි දකුණු ගුවන් අණ මුලස්ථානයේදී සැලසුම් කල "SAMVEDNA" අභ්‍යාසය බහුඅංශික මානුෂීය ආධාර හා ආපදා සහන සැලසීමේ අභ්‍යාසයකි. ගිනිකොණදිග ආසියානු රටවල හා ඉන්දියානු සාගර කලාපයට අයත් ගුවන් හමුදාවන් මීට සහභාගී විය. මෙම අභ්‍යාසයට හදිසි අවස්ථා පෙර සූදානම් පෙරහුරු මෙන්ම



පියාසර/ගොඩබිම් පුහුණුවීම් ද අන්තර්ගතය. දකුණු ගුවන් විධාන මූලස්ථානයේ දී හදිසි අවස්ථා පෙර සූදානම් පෙරහුරු සහ පියාසර/ගොඩබිම් පුහුණු අදියරයන් පැවැත්වූ අතර පියාසර/ ගොඩබිම් පුහුණුව17 FBSU හි පැවැත්විණි. ඉන්දීය ගුවන් හමුදාවේ ආරාධනය පරිදි ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සේවා පුද්ගලයින් පිරිසක් AN 32B ගුවන් යානාවක්ද සමඟ මෙම ගුවන් අභ්‍යාසයට සහභාගී විය.

(xi) <u>මිනුස්කාහි ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් බලඇණිය විසින් සිදු කල භාණ්ඩ එල්ලගෙන යාමේ මෙහෙයුම</u>

මධ්‍යම අප්‍රිකානු ජනරජය තුල එක්සත් ජාතීන්ගේ බහුජාතික ඒකාබද්ධ ස්ථාවරකරණ මෙහෙයුමට යොදවා ඇති ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් බලඇණිය විසින් කඩා වැටුණු ප්‍රංශයේ නියමුවන් රහිත ගුවන් යානයක් අලුත්වැඩියාව සඳහා එල්ලගෙන යාමේ මෙහෙයුම 2018 මාර්තු 29 වන දින සාර්ථකව සිදු කරන ලදී.



(xii) <u>ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ශෛලමය සිරිපතුල් අනුරුවක් මිහින්තලයට ගුවනින් රැගෙන යාම</u>

අනුරාධපුර ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලික කඳවුරේ අංක 06 බලඝනය විසින් 2018 ජූනි මස 10 වන දින ශෛලමය සිරිපතුල් අනුරුවක් මිහින්තලය වෙත ගුවනින් රැගෙන යාම සඳහා භාණ්ඩ එල්ලගෙන යාමේ මෙහෙයුමක් සිදු කරන ලදී. මෙම සිරිපතුල රජරට විශ්ව විද්‍යාල ක්‍රීඩා පිටියේ සිට මිහින්තලේ විහාරයේ මැදමලුව වෙත 171 SH හෙලිකොප්ටර් යානයකින් රැගෙන යන ලදී.



## (xiii) ශ්‍රී ලංකා ගුවන් හමුදා ප්‍රදර්ශනය හා සැණකෙළිය 2018

ශ්‍රී ලංකා ගුවන් හමුදා ප්‍රදර්ශනය හා සැණකෙළිය 2018, ගුවන් සංදර්ශනය හා අධ්‍යාපනික ප්‍රදර්ශනය 2018 ජූලි මස 20 වන දින ගුවන්හමුදාධිපති විසින් වීරවිල ගුවන් හමුදා කඳවුරේදී විවෘත විය. මෙම ප්‍රදර්ශනය ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රවීණත්වය මෙන්ම ජාතික හා කලාපීය භූතල මත තම භූමිකාව හැසිරවීමේ හැකියාව මනා ලෙස විදහා දක්වන්නකි. ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු බහුකාර්ය ගුවන් වත්කම් ප්‍රදර්ශනය හා ස්වභාවික/ මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් වන විපත් වලදී මානුෂිය ආධාර ලබා දීම මෙන්ම ජාත්‍යන්තර භූමි ප්‍රදේශ ස්ථායිකරණය හා හැඩගැස්වීම සඳහා මෙම ගුවන් වත්කම් යොදා ගන්නා ආකාරය පිලිබඳ ජනතාව දැනුවත් කිරීම මෙමඟින් සිදු කෙරිණි.




## (xiv) අසාධ්‍ය හා කම්පනයට ලක් වූ රෝගීන් ප්‍රවාහනය පිලිබඳ පුහුණුව

ගුවන් වෛද්‍ය සහ ජීවිත බේරා ගැනීම යන සන්දර්භය තුල රෝගීන් ප්‍රවාහනය සඳහා ගුවන් බලය යොදා ගැනීම යනු ප්‍රබල සාධකයකි. මෙය ශ්‍රී ලංකාවේ පැවති යුධමය කාල පරිච්ඡේදය තුල ගුවන් හමුදා සාමාජිකයින් මෙන්ම සිවිල් ජනතාවගේ ද ජීවිත බේරා ගැනීම සඳහා ශ්‍රී ලංකා ගුවන් නියමුවන් හා ගුවන් කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලද අනේකවිධ මෙහෙයුම් මඟින් මනාව සනාථ වේ. මෑත කාලීනව දිවයින තුල දැඩි සත්කාර ඒකකයක ක්‍රියාකාරීත්වය සහිතව ගුවනින් අසාධ්‍ය රෝගීන් රැගෙන යා හැකි ආකාරයේ ගුවන් වෛද්‍ය කට්ටල සවි කරන ලද බෙල් හෙලිකොප්ටර් යානා සතු එකම ගුවන් වෛද්‍ය හා ජීවිත මෙහෙයුම් ක්‍රියාකරවන්නා ලෙස ශ්‍රී ලංකා ගුවන් හමුදාව පෙරමුණ ගෙන සිටී. ඒ අනුව මේ සම්බන්ධයෙන් 2018 අගෝස්තු 02 දින ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලික කඳවුරේදී ශ්‍රී ලංකා නිර්වින්දන වෛද්‍යවරුන් විසින් පුහුණු අභ්‍යාසයක් පවත්වන ලදී.



## (xv) Blue Spear මෙහෙයුම -ඒකාබද්ධ ගුවන් අභ්‍යාසය හා වෙඩි තැබීමේ පුහුණුව

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ඔවුන් සතු තත්‍ය ගුවන් හමුදා ප්‍රහාරකයින් සංඛ්‍යාව හා සටන් සහයක මෙහෙයුම් වත්කම් හඳුනා ගැනීමේ අරමුණින් කුඩා ප්‍රමාණයේ ගුවන් අභ්‍යාසයක් වෙඩි තැබීමේ පුහුණුවක්ද සහිතව විල්පත්තු රක්ෂිතයේ දකුණු පෙදෙසෙහි හා කල්පිටිය ගුවන් හමුදා වෙඩි පිටියේදී 2018 ජුනි 18 හා 19 වන දිනයන්හිදී ක්‍රියාත්මක කරන ලදී. ගුවන් යානා 13ක්, රේඩාර් බලසන, ගුවන් කාර්ය මණ්ඩල සාමාජිකයින්, රෙජිමේන්තු විශේෂ බලකාය හා වෙනත් සහයක පාර්ශවයන් මෙම අභ්‍යාසය ආරක්ෂාකාරීව හා සාර්ථකව පැවැත්වීමට දායකත්වය ලබා දෙන ලදී.



## (xvi) පකිස්තානයේ සිට ශ්‍රී ලංකාවට අශ්වයන් ප්‍රවාහනය

දෙරට අතර ගොඩ නැගෙමින් තිබෙන මිත්‍රත්වයේ සංකේතයක් ලෙස පකිස්තානය විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට නොමිලේ අශ්වයන් 06 දෙනෙකු ලබා දෙන ලදී. මෙම නුමුහුන් අශ්වයින් 2018 ජුනි මස 26 දින පකිස්තානයේ ඉස්ලාමාබාද් නුවර සිට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ C-130 ගුවන් යානයකින් මෙරටට ප්‍රවාහනය කරන ලදී.



## (xvii) ජපාන සමුද්‍රීය ස්වයං ආරක්ෂක බලකාය සමග ඒකාබද්ධ සමුද්‍රීය අභ්‍යාසය

2018 අගෝස්තු මස 5 වන දින ශ්‍රී ලංකා ගුවන් හමුදාව හා ශ්‍රී ලංකා නාවික හමුදාව, ජපාන සමුද්‍රීය ස්වයං ආරක්ෂක බලකාය සමඟ එක්ව ඒකාබද්ධ සමුද්‍රීය අභ්‍යාසයක්



සංවිධානය කරන ලදී. මෙම අභ්‍යාසය සඳහා නාවික සම්පත් සැපයූ ශ්‍රී ලංකා නාවික හමුදාව හා සම්බන්ධ වෙමින් ජපාන සමුද්‍රීය ස්වයං ආරක්ෂක බලකායට අයත් PC- 3 Orion Long Range සමුද්‍රීය පරීක්ෂණ ගුවන්යානය හා ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් B -200 medium range ගුවන්යානය, මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ සිට නැගෙනහිර මුහුදු ප්‍රදේශය දක්වා අභ්‍යාසයේ සැලැස්ම පරිදි මෙහෙයවන ලදී. මෙම ගුවන් අභ්‍යාසය අතරතුරදී ශ්‍රී ලංකා ගුවන් හමුදාව හා ශ්‍රී ලංකා නාවික හමුදාව අතර සමුද්‍රීය නිරීක්ෂණය සම්බන්ධයෙන් වන උසස් තාක්ෂණික දැනුම හුවමාරු කරගැනීමටද අවස්ථාව උදා විය.

(xviii) <u>ගුවන් පියාසර පුහුණු උපදේශක වැඩමුළුව - 2018</u>




2018 අගෝස්තු 18 හා 19 වන දිනයන්හිදී චීන වරාය ශ්‍රී ලංකා ගුවන් හමුදා විද්‍යාපීඨයේ අංක 1 පියාසර පුහුණු පක්ෂාංගයේදී ගුවන් පියාසර පුහුණු උපදේශක වැඩමුළුව 2018 පැවැත්වුණු අතර එහිදී සියලුම පියාසර පුහුණු උපදේශකවරුන් තම පළමු පියාසර අත්දැකීම ලබා ගන්නා ලදී. මෙම වැඩමුළුව සඳහා Fixed සහ Rotary පක්ෂාංගයේ සියලුම පියාසර පුහුණු උපදේශකයින් සහභාගී විය. වැඩමුළුව අතර පියාසර පුහුණුවීම් සම්බන්ධ කරුණු රැසක් පැහැදිලි කරගැනීමට හැකි වුනු අතර පියාසර පුහුණුවීම් උසස් ප්‍රමිතියකින් යුක්තව පවත්වා ගෙන යාමට අදාළ වැදගත් තීරණ
රැසක් ද ගන්නා ලදී.

(xix) <u>දකුණු සුඩානයේදී සිදු කල හෙලිකොප්ටර් යානයට සවි කරන ලද ආධාරක කඹයක් සහ තොටිල්ලක් ආධාරයෙන් ජීවිත ගලවා ගැනීමේ මෙහෙයුම් අභ්‍යාසය</u>




දකුණු සුඩානයේ එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදාව තම පළමු "හෙලිකොප්ටර් යානයට සවි කරන ලද ආධාරක කඹයක් සහ තොටිල්ලක් ආධාරයෙන් ජීවිත ගලවා ගැනීමේ මෙහෙයුම් අභ්‍යාසය" ශ්‍රී ලංකා ගුවන් හමුදා ඒකකයේ සහයෝගයෙන් 2018 සැප්තැම්බර් 11 දින පවත්වන ලදී. නයිල් නදියේ ගමන් කරන පාරුවක සිටින රෝගියකු එයින් මුදවා ගෙන අසල රෝහලක් වෙත ප්‍රතිකාර සඳහා ගුවන් මඟින් රැගෙන යාම දැක්වෙන පෙරහුරුවක් මෙම අභ්‍යාසයෙන් සිදු කරන ලදී.

## (xx) දියකාවා ඒකාබද්ධ යුධ මෙහෙයුම 2018 කුච්චවේලි

2018 දියකාවා ඒකාබද්ධ යුධ මෙහෙයුමේ අවසන් අදියර 2018 සැප්තැම්බර් 26 දින කුච්චවේලි හිදී පැවැත්විණි. මෙහිදී ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ගුවන් මෙහෙයුම් සඳහා ගුවන් මඟින් මුදාහැරීම්, ගුවන් ප්‍රහාර සහ නිස්සාර කිරීමද යොදා ගන්නා ලදී.




## (xxi) ශ්‍රී ලංකා ගුවන් හමුදාව ගුවන් ධාවන පථයන් ආශ්‍රිතව "වෙදර් බඩී" ස්වයංක්‍රිය කාලගුණ අධීක්ෂණ පද්ධති ආරම්භ කිරීම

"වෙදර් බඩී" කාලගුණ මධ්‍යස්ථානය සුළඟේ දිශාව, සුළඟේ වේගය, උෂ්ණත්වය, තෙරපුම, ආර්ද්‍රතාවය සහ වර්ෂාපතනය මනිනු ලබන සංවේදක 06කින් සමන්විත ස්වයංක්‍රියව කාලගුණය අධීක්ෂණය කරනු ලබන මධ්‍යස්ථානයකි. එමඟින් තත්‍ය කාලගුණ දත්ත රැහැන් රහිතව අභ්‍යන්තර දත්ත ලබා ගැනීමේ ඒකකය වෙත හුවමාරු කල හැක. තවද, එම දත්ත අන්තර්ජාලයට උඩුගත කරනු ලබන අතර එමඟින් වෙදර් බඩී වෙබ් අඩවිය හෝ ඇන්ඩ්රොයිඩ් යෙදවුම මඟින් කාලගුණ තොරතුරු ලොව ඕනෑම තැනක සිට නැරඹිය හැකිය. මෙම පද්ධතිය සූර්ය බලයෙන් සහ ආරෝපණය කල හැකි බැටරි මඟින් බල ගැන්වේ. ගුවන්හමුදාධිපතිගේ උපදෙස් මත විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු පක්ෂාංගය විසින් මේ වන විට කාලගුණ මධ්‍යස්ථාන 6ක් පහත සඳහන් ගුවන් ධාවන පථයන් ආශ්‍රිතව ස්ථාපනය කරන ලදී.

- ශ්‍රීලංගුහ විද්‍යාපීඨය චීන වරාය
- ශ්‍රීලංගුහ මූලික කඳවුර අනුරාධපුරය
- ශ්‍රීලංගුහ මූලික කඳවුර හිඟුරක්ගොඩ
- ශ්‍රීලංගුහ කඳවුර පලාලි
- ශ්‍රීලංගුහ කඳවුර කටුකුරුන්ද
- ශ්‍රීලංගුහ කඳවුර වීරවිල



## (xxii) ශ්‍රීලංකා ගුවන් හමුදාව විසින් ප්‍රථම වතාවට සිදු කල ගුවනින් බීජ ඉසීමේ මෙහෙයුම

ගුවනින් බීජ ඉසීමේ පළමු මෙහෙයුම 2018 දෙසැම්බර් 12 වන දින නොච්චියාගම ප්‍රදේශයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ වනාන්තර ගහණය නැවත ස්ථාපිත කිරීම සඳහා ගන්නා ලද ප්‍රයත්නයන් බොහොමයක් සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව තම දායකත්වය සපයා ඇත. ගුවනින් බීජ ඉසීමේ පුරෝගාමී ව්‍යාපෘතිය සඳහාද තම දායකත්වය ලබා දීම හරහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව, වන වගාව කෙරෙහි දක්වන කැපවීම වඩාත් තහවුරු කරයි. ගුවන් බලය ප්‍රඥාවන්ත ලෙස උපයෝගී කරගැනීම හරහා ජාතික ආරක්ෂාව තහවුරු කිරීමේ වගකීම දරණ ශ්‍රී ලංකා ගුවන් හමුදාව, තම රටේ අනාගත පරපුර වෙනුවෙන් හරිත අනාගතයක් දායාද කිරීම පිණිස ඉතා සතුටින් මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධ වී සිටී.



## (2) ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂකය

(අ) හැඳින්වීම

2018 පෙබරවාරි මස 28 වන දින ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂකය නැවත සේවයේ පිහිටුවන ලදී. ශ්‍රී ලංකා ගුවන් හමුදා රෙජිමේන්තුව, සතුරන් මගින් සිදුවන කිසියම් බාහිර/අභ්‍යන්තර පහරදීම් වලින් ආරක්ෂා වීම සහ මෙහෙයුම් සඳහා වැදගත් වන ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් වත්කම් හා උපකරණ ආරක්ෂා කිරීම අරමුණු කරගනිමින් ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂකය යටතේ ස්ථාපනය කල අංශ 29 කින් සමන්විතය.

(ආ) තත්‍ය කාර්යසාධනය වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමග සැසඳීම

ආරක්ෂක උපකරණ, ආරක්ෂක අමුද්‍රව්‍ය, බෝම්බ නිෂ්ක්‍රීය කිරීමේ උපකරණ, පැරෂුට් උපකරණ, රෙජිමේන්තු විශේෂ බලකාය සඳහා අවශ්‍ය උපකරණ සහ ගුවන් සුනඛ වෛද්‍ය උපකරණ මිලදී ගැනීම ආදී ක්‍රියාකාරකම් ආවරණය වන පරිදි 2018 වර්ෂයේ ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂකයේ සමස්ථ අයවැය, ලංරුම් 21.99 කි.

(ඇ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට එරෙහිව 2018 වර්ෂයේ තත්‍ය කාර්යසාධනය

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි අන්තර්ගත පහත සඳහන් යෝජිත ක්‍රියාකාරකම් 2018 වර්ෂය තුලදී සාර්ථකව නිම කර ඇත.

| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් යෝජිත ක්‍රියාකාරකම | තත්‍ය වියදම (ලංරුම්) |
|---|---|
| ගුවන් සුනඛයින් සඳහා ඖෂධ හා උපකරණ මිලදී ගැනීම | 0.84 |
| සටන් උපකරණ අලුත්වැඩියාව | 2.82 |
| ආරක්ෂක උපකරණ මිලදී ගැනීම | 0.33 |
| බෝම්බ නිෂ්ක්‍රීය උපකරණ හා පැරෂුට් උපකරණ නඩත්තුව | 0.63 |
| බෝම්බ නිෂ්ක්‍රිය උපකරණ හා පැරෂුට් උපකරණ මිලදී ගැනීම | 9.93 |
| ආරක්ෂක අමුද්‍රව්‍ය මිලදී ගැනීම | 3.15 |
| ආරක්ෂක අමුද්‍රව්‍ය SVP | 3.67 |
| ගුවන් සුනඛ වෛද්‍ය උපකරණ SVP | 0.25 |
| ගුවන් සුනඛ වෛද්‍ය උපකරණ RPC | 0.30 |
| **එකතුව** | **22.92** |

(ඈ) 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම් වලට අමතරව 2018 වර්ෂය තුල නිම කරන ලද අනෙකුත් ක්‍රියාකාරකම්

| ක්‍රියාකාරකම | තත්‍ය වියදම (ලං.රු.මි.) |
|---|---|
| බෝම්බ නිෂ්ක්‍රිය උපකරණ මිලදී ගැනීම | 7.42 |
| පැරාෂොයිල් පැරෂුට් මිලදී ගැනීම | 15.10 |

## (3) ගුවන්යානා ඉංජිනේරු අධ්‍යක්ෂකය

### (අ) හැඳින්වීම

සම්මත ඉංජිනේරු ප්‍රායෝගික භාවිතයන් යොදාගැනීමත් ඒ තුලින් ගුවන් ගමන් වල ආරක්ෂාව තහවුරු කිරීමත් හරහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු ගුවන්යානාවන් ගුවන් ගමන් වලට යොදාගත හැකි මට්ටමෙන් පවත්වාගෙන යාමට ගුවන්යානා ඉංජිනේරු අධ්‍යක්ෂකය වගකීම දරයි. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන්යානා ලැයිස්තුවේ වර්ග 27ක ගුවන්යානා 107ක් ඇත. මෙම ගුවන් යානා 107, පියාපත් සහිත ගුවන්යානා 61ක් හා හෙලිකොප්ටර් යානා 46ක් ලෙස නැවත බෙදා දැක්විය හැක.

(ආ) ගුවන්යානා ඉංජිනේරු අධ්‍යක්ෂකයේ සමස්ථ අයවැය ලං.රු.මි. 115,391.08 ක් වන අතර එය අයවැයෙහි වැඩි මුදල් ප්‍රමාණයක් දරණ කොටස වේ. අධ්‍යක්ෂකයේ සමස්ථ අයවැය මගින් ගුවන්යානා එන්ජින්, ගියර් බොක්ස්, අවරපෙති හා උපාංග මිලදී ගැනීම, PT-6 ප්‍රාථමික ගුවන්යානා 6ක් මිලදී ගැනීම, AOF (චීනය) ස්ථාපිත කිරීම, ගුවන්යානා නඩත්තු කිරීම, ගුවන්යානා අමතර කොටස් මිලදී ගැනීම ආදී ක්‍රියාකාරකම් සිදු කිරීමට සැලසුම් කර ඇත. භාණ්ඩාගාර වෙන්කිරීම් වශයෙන් ලං.රු.මි. 4,882.33 ක් හා අතිරේක ප්‍රතිපාදන වශයෙන් ලං.රු.මි. 110,508.75 ක් ලෙස අයවැය සඳහා මුදල් යෙදවීමට අධ්‍යක්ෂකය බලාපොරොත්තුවේ. ක්‍රියාකාරී සැලැස්මේ ඇතැම් පුරෝකථනයන් ප්‍රතිඵලදායි ලෙස ක්‍රියාත්මක වූ අතර විවිධ හේතූන් නිසා අනෙකුත් පුරෝකථනයන් සපුරා ගැනීමට නොහැකි වී ඇත.

### (ඇ) කාර්යසාධනය

i. <u>ගුවන්යානා නඩත්තුව</u> 2018 වර්ෂයේදී ගුවන්යානා නඩත්තුව සඳහා ලං.රු.මි. 1,018.15 ක මුදලක් වියදම් දරා ඇත. ගුවන්යානා අමතර කොටස් හා පාරිභෝගික ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ලං.රු.මි. 575.91 ක් හා ගුවන්යානා එන්ජින්, අවරපෙති, ගුවන්යානා මෙවලම් සහ පර්යේෂණ උපකරණ මිලදී ගැනීම සඳහා ලං.රු.මි. 442.24 ක් මීට ඇතුලත්ය.

ii. <u>අලුත්වැඩියාව හා පූර්ණ අලුත්වැඩියාව</u> 2018 වර්ෂයේදී ගුවන්යානා අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම සඳහා ලං.රු.මි. 1,466.53 ක මුදලක් වියදම් දරා ඇත. ගුවන්යානා ප්‍රධාන පූර්ණ අලුත්වැඩියාවන් සිදු කිරීම සඳහා ලං.රු.මි. 1,466.12 ක් හා ගුවන්යානා මෙවලම් අලුත්වැඩියාව හා ක්‍රමාංකනය සඳහා ලං.රු.මි. 0.41ක් මීට ඇතුලත්ය.

iii. <u>අංක 01 පියාසර පුහුණු පක්ෂාංගය ශ්‍රීලංගුභ චීනවරාය</u>
2018 වර්ෂය තුල මෙම බලසනය විසින් PT-6 ගුවන්යානා, Cessna-150 ගුවන්යානා සහ K-8 ගුවන්යානා වල නොයෙකුත් සේවා කිරීම් සිදු කර ඇත. බලසනය විසින් පැය 25 සේවා කිරීම් 45ක්, පැය 100 සේවා කිරීම් 8ක්, පැය 300 සේවා කිරීම් 4ක් සහ පැය 400 සේවා කිරීම් 2ක් සිදු කර ඇත. තවද, පැය

50 සේවා කිරීම් 26ක්, පැය 100 සේවා කිරීම් 17ක් සහ පැය 200 සේවා කිරීම් 10ක් ද සිදු කර ඇත. ඊට අමතරව PT-6 ගුවන්යානා සේවා කිරීම් 15ක් සිදු කර ඇති අතර ඊට පැය 50 සේවා කිරීම් 7ක්, පැය 125 සේවා කිරීම් 3ක්, පැය 150 සේවා කිරීම් 3ක් සහ පැය 250 හා පැය 500 සේවා කිරීම් එක බැගින් සිදු කර ඇත.

iv. <u>අංක 02 බලඝනය ශ්‍රීලංගුහ කටුනායක</u> 2018 වර්ෂය තුල මෙම බලඝනය විසින් AN-32B සහ C-130 ගුවන්යානා වල නොයෙකුත් සේවා කිරීම් සිදු කර ඇත. බලඝනය විසින් පැය 300 සේවා කිරීම් 2ක් හා පැය 900 සේවා කිරීම් 1ක් සිදු කර ඇත. තවද, C-130 ගුවන්යානා වල මාස 6කට වරක් සිදු කරන සේවා කිරීම්, M2 හා M3 සේවා කිරීම් සහ PDM extension සේවා කිරීම්ද මෙම බලඝනය විසින් සිදු කර ඇත. ඊට අමතරව 2018 වර්ෂය තුල බලඝනය විසින් AN-32B ගුවන්යානා 3ක සහ C-130 ගුවන්යානාවක ප්‍රධාන අලුත්වැඩියාවන් සිදු කර ඇත.

v. <u>අංක 04 විශේෂ/ප්‍රභූ පුද්ගල හෙලිකොප්ටර් යානා බලඝනය ශ්‍රීලංගුහ රත්මලාන</u> 2018 වර්ෂය තුල මෙම බලඝනය විසින් Bell412/412EP හෙලිකොප්ටර් යානා, Bell 212 හෙලිකොප්ටර් යානා සහ 171E හෙලිකොප්ටර් යානාව, සේවා කිරීම් 87ක් සිදු කර ඇත. මෙයට පැය 25 සේවා කිරීම්, පැය 50 සේවා කිරීම්, පැය 100 සේවා කිරීම්, පැය 300 සේවා කිරීම්, පැය 500 සේවා කිරීම්, පැය 600 සේවා කිරීම් සහ පැය 1000 සේවා කිරීම් ඇතුලත්ය.

vi. <u>අංක 05 බලඝනය ශ්‍රීලංගුහ කටුනායක</u> 2018 වර්ෂය තුල අංක 5 බලඝනය විසින් F-7 FT-7BS සහ F-7GS ගුවන් යානා වල සේවා කිරීම් 63ක් සිදු කර ඇත. මෙයට පැය 25 එන්ජින් සේවා කිරීම්, පැය 50 එන්ජින් සේවා කිරීම්, පැය 50 ගුවන්යානා රාමුව/E & I සේවා කිරීම්, පැය 100 ගුවන් යානා රාමුව/E & I සේවා කිරීම්, මාස 06 සේවා කිරීම් සහ මල බැඳීම පාලනය කිරීම සඳහා සිදු කරන සේවා කිරීම් ඇතුලත්ය.

vii. <u>අංක 6 හෙලිකොප්ටර් යානා බලඝනය ශ්‍රීලංගුහ අනුරාධපුරය</u>
2018 වර්ෂය තුල මෙම බලඝනය විසින් MI-17 හෙලිකොප්ටර් යානා වල සේවා කිරීම් 30ක් සිදු කර ඇත. මෙයට පැය 25 පරීක්ෂාවන්, පැය 50 පරීක්ෂාවන්, පැය 50 සේවා කිරීම්, පැය 100 සේවා කිරීම්, පැය 200 සේවා කිරීම් සහ පැය 300 සේවා කිරීම් ඇතුලත්ය.

viii. <u>අංක 07 හෙලිකොප්ටර් යානා බලඝනය ශ්‍රීලංගුහ හිඟුරක්ගොඩ</u>
2018 වර්ෂය තුල මෙම බලඝනය විසින් MI-17 හෙලිකොප්ටර් යානා වල සේවා කිරීම් 30ක් සිදු කර ඇත. මෙයට පැය 25 පරීක්ෂාවන්, පැය 50 පරීක්ෂාවන්, පැය 50 සේවා කිරීම්, පැය 100 සේවා කිරීම්,පැය 200 සේවා කිරීම් සහ පැය 300 සේවා කිරීම් ඇතුලත්ය.

ix. අංක 08 සැහැල්ලු ප්‍රවාහන බලසනය ශ්‍රීලංගුහ රත්මලාන
2018 වර්ෂය තුල මෙම බලසනය විසින් Y-12II, Y-12 IV සහ Beech King ගුවන්යානා වල සේවා කිරීම් 454ක් සිදු කර ඇත. මෙයට දින 07 සේවා කිරීම්, පැය 100 සේවා කිරීම්, පැය 200 සේවා කිරීම්, පැය 400 සේවා කිරීම්, පැය 800 සේවා කිරීම්, පැය 1200 සේවා කිරීම්, පැය 200 (අදියර I), පැය 400 (අදියර II) හා පැය 600 (අදියර III) සේවා කිරීම් ඇතුලත්ය.

x. අංක 09 ප්‍රහාරක හෙලිකොප්ටර් යානා බලසනය ශ්‍රීලංගුහ හිඟුරක්ගොඩ
2018 වර්ෂය තුල මෙම බලසනය විසින් MI-24/ MI-35 සහ MI – 171SH හෙලිකොප්ටර් යානා වල සේවා කිරීම් 33ක් සිදු කර ඇත. මෙයට පැය 25 සේවා කිරීම්, පැය 50 සේවා කිරීම්, පැය 100 සේවා කිරීම්, සහ පැය 300 සේවා කිරීම් ඇතුලත්ය.

xi. අංක 10 ප්‍රහාරක බලසනය ශ්‍රීලංගුහ කටුනායක 2018 වර්ෂය තුල මෙම බලසනය විසින් කෆීර් ගුවන්යානා වල සේවා කිරීම් 67ක් සිදු කර ඇත. මෙයට දින 07 පියාසර නොකර සිදු කරන සේවා කිරීම්, දින 15 පියාසර නොකර සිදු කරන සේවා කිරීම්, දින 30 පියාසර නොකර සිදු කරන සේවා කිරීම්, පැය 25 සේවා කිරීම්, පැය 100 සේවා කිරීම්, පැය 25 එන්ජින් සේවා කිරීම්, පැය 50 එන්ජින් සේවා කිරීම් ඇතුලත්ය.

බලසනය සතු ඉංජිනේරු හැකියාවන් වර්ධනය කිරීම නිසා Mano Contactor, ජෙනරේටර් පාලන ඒකකය, ඔක්සිජන් පාලකය සහ පීඩන පාලක වැල්වය, බලසනය තුලදීම අලුත්වැඩියා කරන ලද අතර එමඟින් සැලකිය යුතු මට්ටමේ විදේශ මුදල් ප්‍රමාණයක් ඉතිරි කරගත හැකි විය.

xii. අංක 111 නියමුවන් රහිත ගුවන්යානා බලසනය ශ්‍රීලංගුහ වවුනියාව
මෙම බලසනය විසින් 2018 වර්ෂය පුරාම Searcher MK II නියමුවන් රහිත ගුවන්යානයේ නඩත්තු කටයුතු සිදු කර ඇත. මෙයට සති 06 UAV Preservation, වම් සහ දකුණු පියාපත් එකලස් කිරීම් ඉවත් කිරීම සහ කොටස් එකලස් කිරීම් ඉවත් කිරීම ඇතුලත්ය.

xiii. අංක 61 බලපන්තිය ශ්‍රීලංගුහ රත්මලාන 2018 වර්ෂය තුල මෙම බලපන්තිය විසින් MI-171E ගුවන්යානා වල සේවා කිරීම් 45ක් සිදු කර ඇත. මෙයට පැය 25 පරික්ෂා කිරීම්, පැය 50 සේවා කිරීම්, පැය 100 සේවා කිරීම්, පැය 300 සේවා කිරීම්, පැය 500 සේවා කිරීම් සහ පැය 1000 සේවා කිරීම් ඇතුලත්ය.

xiv. හෙලිටුවර්ස් ශ්‍රීලංගුහ රත්මලාන 2018 වර්ෂය තුල හෙලිටුවර්ස් ශ්‍රීලංගුහ රත්මලාන විසින් M-60 ගුවන්යානා වල සේවා කිරීම් 6ක් සිදු කර ඇත. මෙයට මාස 03 සේවා කිරීම්, මාස 06 සේවා කිරීම්, මාස 12 සේවා කිරීම්, මාස 24 සේවා කිරීම්, මාස 36 සේවා කිරීම්, මාස 72 සේවා කිරීම් ඇතුලත්ය.

## (ඇ) 2018 වර්ෂය තුල ගුවන්යානා ඉංජිනේරු පක්ෂාංගය විසින් සිදු කල දේශීය අලුත්වැඩියාවන් සහ සේවා කිරීම්

i. විශේෂ ව්‍යාපෘතිය 2018 වර්ෂය තුල ගුවන්යානා ඉංජිනේරු පක්ෂාංගය විසින් විවිධ අලුත්වැඩියාවන් හා සේවා කිරීම් පක්ෂාංගය තුලදී සිදුකර ඇත. මිනිස් පැය 10,000 ක් යොදා ගනිමින් ඇ.ඩො. 1,000,000.00ක වියදමින් පැය 1000 සේවා කිරීමක් සිදු කරන ලදී.

ii. ප්‍රමිත කාමරය 2018 වර්ෂය තුල සියලුම ගුවන්යානා වලට අදාළ වන පරිදි කාර්යයන් 1,009 ක් ප්‍රමිත කාමරය මඟින් සිදු කර ඇත. මිනිස් පැය 2,295 ක් යොදා ගනිමින් සිදු කරන ලද මෙම කාර්යයන් සඳහා දරන ලද වියදම ඇ.ඩො. 229,500 කි. Wire –Ropes Sling/ Synthetic web sling inspection සහ proof load test, Torque wrench calibration සහ Calipers සහ crometers වලට අදාළ කාර්යයන් මෙයට ඇතුලත්ය.

iii. විනාශකාරී නොවන පරික්ෂා කිරීම් සිදු කරන පර්යේෂණාගාරය 2018 වර්ෂය තුල සියලුම ගුවන්යානා වලට අදාළ වන පරිදි කාර්යයන් 950ක් මෙම පර්යේෂණාගාරය මඟින් සිදු කර ඇත. මිනිස් පැය 1,371ක් යොදා ගනිමින් සිදු කරන ලද මෙම කාර්යයන් සඳහා දරන ලද වියදම ඇ.ඩො. 137,100 කි. Eddy ධාරා පරික්ෂාව, චුම්භක අංශු පරික්ෂාව සහ X-Ray පරික්ෂාව මෙයට ඇතුලත්ය.

iv. යාන්ත්‍රික අංශය 2018 වර්ෂය තුල ගුවන්යානා වල යාන්ත්‍රික උපකරණ හා ගොඩබිම් පාලන ඒකකයට අදාළ කාර්යයන් 78ක් මෙම අංශය මඟින් සිදු කර ඇත. මිනිස් පැය 6,492ක් යොදා ගනිමින් සිදු කරන ලද මෙම කාර්යයන් සඳහා දරන ලද වියදම ඇ.ඩො. 649,200 කි. මෙයට උෂ්ණත්ව පාලන වැල්වය, සුළං වේග දර්ශකය සහ ගිනි ක්‍රියාකාරී ඒකකයට සම්බන්ධ කාර්යයන් ඇතුලත්ය.

v. රෝද සහ තිරිංග අංශය 2018 වර්ෂය තුල AN-32B C-130 Kfir සහ F-7 ගුවන්යානා වලට අදාළ කාර්යයන් 39ක් මෙම අංශය මඟින් සිදු කර ඇත. මිනිස් පැය 133ක් යොදා ගනිමින් සිදු කරන ලද මෙම කාර්යයන් සඳහා දරන ලද වියදම ඇ.ඩො. 13,300 කි. ප්‍රධාන/මුහුණත රෝද වල පිටත කවරය මාරු කිරීම මෙයට ඇතුලත්ය.

vi. ආරක්ෂක උපකරණ අංශය 2018 වර්ෂය තුල ජීවිතාරක්ෂක කබා, ජීවිතාරක්ෂක පහුරු, පැරෂුට්, ජීවිතාරක්ෂක ද්‍රව්‍ය ඇසුරුම්, Fire Bottle G Suit හා ඉපිලුම් වලට සම්බන්ධ කාර්යයන් 2,543ක් මෙම අංශය මඟින් සිදු කර ඇත. මිනිස් පැය 3,842 ක් යොදා ගනිමින් සිදු කරන ලද මෙම කාර්යයන් සඳහා දරන ලද වියදම ඇ.ඩො. 384,200 කි. මෙයට ගුවන් කාර්ය මණ්ඩල ජීවිතාරක්ෂක කබා, බහු ආසන සහිත ජීවිතාරක්ෂක පහුරු, අධි ත්වරණයට ප්‍රතිරෝධී ඇඳුම් ආදිය ඇතුලත්ය.

vii. ගුවන්යානා අලුත්වැඩියා කිරීමේ හා නැවත සකස් කිරීමේ අංශය 2018 වර්ෂය තුල Bell- 212, Bell- 412, AN- 32B, Y-12, PT-6, -17, K-8, C-130, Cessna-150, B200, Bell 206 යන ගුවන්යානා වල ව්‍යුහගත හා පැනල් අලුත්වැඩියා කිරීම් 107ක් මෙම අංශය මඟින් සිදු කර ඇත. මිනිස් පැය 3,048 ක් යොදා ගනිමින් සිදු කරන ලද මෙම කාර්යයන් සඳහා දරන ලද වියදම ඇ.ඩො. 304,800 කි.

viii. <u>එන්ජින් අංශය.</u> 2018 වර්ෂය තුල Bell 212/412, y-12, B-200, Bell 206, -17, -24, K-8, Kfir ගුවන්යානා වලට සම්බන්ධ කාර්යයන් 180ක් මෙම අංශය විසින් සම්පූර්ණ කර ඇත. PT6-3B වර්ගයේ එන්ජින් වැඩ, PT6A-42 වර්ගයේ එන්ජින් වැඩ සහ Oil soap පරීක්ෂාව ආදිය මීට ඇතුලත්ය. මිනිස් පැය 1,527 ක් යොදා ගනිමින් සිදු කරන ලද මෙම කාර්යයන් සඳහා දරන ලද වියදම ඇ.ඩො. 152,700 කි.

ix. <u>උපාංග අංශය.</u> 2018 වර්ෂය තුල Bell 412/212 සහ Bell 206 ගුවන්යානා වලට සම්බන්ධ කාර්යයන් 132ක් මෙම අංශය මඟින් සිදු කර ඇත. මිනිස් පැය 4,508 ක් යොදා ගනිමින් සිදු කරන ලද මෙම කාර්යයන් සඳහා දරන ලද වියදම ඇ.ඩො. 450,800 කි. මෙයට Pylon Mount, Bell212/412 Tail Rotor Actuator සහ Oil Cooler Blower වලට සම්බන්ධ කාර්යයන් ඇතුලත්ය.

x. <u>උපකරණ අංශය.</u> 2018 වර්ෂය තුල Bell 412, Bell 206, Y 12, BEECHKING, C-130, AN-32B, K-8, -24, PT-6, C-150, F-7 සහ Kfir ගුවන්යානා සම්බන්ධ කාර්යයන් 504ක් මෙම අංශය මඟින් සිදු කර ඇත. මිනිස් පැය 2,003 ක් යොදා ගනිමින් සිදු කරන ලද මෙම කාර්යයන් සඳහා දරන ලද වියදම ඇ.ඩො. 200,300 කි. මෙයට Turn& slip indicator, Altimeter සහ Triple techo indicator වලට සම්බන්ධ කාර්යයන් ඇතුලත්ය.

xi. <u>රොටර් අංශය</u> 2018 වර්ෂය තුල Bell 212, Bell 412 සහ Bell 17 ගුවන්යානා වලට සම්බන්ධ කාර්යයන් 46ක් මෙම අංශය මඟින් සිදු කර ඇත. මිනිස් පැය 1,790 ක් යොදා ගනිමින් සිදු කරන ලද මෙම කාර්යයන් සඳහා දරන ලද වියදම ඇ.ඩො. 179,000 කි. ප්‍රධාන රොටර් බ්ලේඩ් සහ රොටර් බ්ලේඩ් වලට සම්බන්ධ කාර්යයන් මීට ඇතුලත්ය.

xii. <u>සංයුක්ත අංශය</u> 2018 වර්ෂය තුල පැනල් අලුත්වැඩියා කිරීම් 137ක් මෙම අංශය මඟින් සිදු කර ඇත. මිනිස් පැය 629 ක් යොදා ගනිමින් සිදු කරන ලද මෙම කාර්යයන් සඳහා දරන ලද වියදම ඇ.ඩො. 62,900 කි.

## (ඉ) ගුවන් හමුදා කෞතුකාගාරය ශ්‍රීලංගුභ රත්මලාන

i. <u>2018 වර්ෂය තුල ගුවන්යානා වල සිදු කල අලුත්වැඩියාවන් හා සේවා කිරීම්</u> ගුවන් හමුදා කෞතුකාගාරය විසින් 2018 වර්ෂය තුල පහත සඳහන් ගුවන් යානා වල විවිධ ආකාරයේ අලුත්වැඩියාවන් හා සේවා කිරීම් සිදු කර ඇත.

- Tiger moth ගුවන්යානය (CX-123)
- Chipmunk ගුවන්යානය(CT-103)
- Chipmunk ගුවන්යානය (CT-107)
- Siai-Marchetti ගුවන්යානය (CT-123)

ii. මෙයට දින 07 සේවා කිරීම් 45ක්, මලබැඳීම පාලනය කිරීමේ පරීක්ෂාවන් 4ක් සහ මලබැඳීම පාලනය කිරීමේ පරීක්ෂාවන් 3 ක් ඇතුලත්ය.

(ඊ) 2018 වර්ෂයේදී ගුවන්යානා ඉංජිනේරු සහයක පක්ෂාංගය විසින් ගුවන්යානා වල සිදු කල දේශීය අලුත්වැඩියාවන් හා සේවා කිරීම්.

i <u>අවරපෙති වැඩපොළ</u> 2018 වර්ෂය තුලදී Y-12, B- 200, Y-12 II, IV/B-200 යන ගුවන්යානා වලට අදාළ කාර්යයන් 56ක් මෙහිදී සිදු කර ඇත. මෙයට පූර්ණ අලුත්වැඩියාවන්, සුළු අලුත්වැඩියාවන් සහ මූල දාර අලුත්වැඩියාවන් ඇතුලත්ය.

ii <u>එන්ජින් වැඩපොළ</u> 2018 වර්ෂය තුල C-150 හා PT-6 ගුවන්යානා වලට අදාළ කාර්යයන් 22ක් මෙහිදී සම්පූර්ණ කර ඇත. මෙයට Air Starter වැල්ව පරික්ෂාව, එන්ජින් අංක 04 සිලින්ඩර් හා පූර්ණ අලුත්වැඩියාව ඇතුලත්ය.

iii. <u>Com-වැඩපොළ</u> 2018 වර්ෂයේදී Y-12, B-200, AN-32B, C-150, K-8 සහ PT-06 ගුවන්යානා වලට අදාළ කාර්යයන් 277ක් සිදු කර ඇත. මෙයට අලුත්වැඩියාවන්, පිටත කවර මාරු කිරීම් සහ පූර්ණ අලුත්වැඩියාවන් ඇතුලත්ය.

iv. <u>E සහ I වැඩපොළ</u> 2018 වර්ෂය තුල Bell-412, -17, K-8, Bell-212, Bell-206, PT-6, -17, B-200 සහ MA-60 ගුවන්යානා වලට අදාළ කාර්යයන් 460ක් සිදු කර ඇත. මෙයට Triple techo indicator අලුත්වැඩියාව, Hyd Pressure Relay පූර්ණ අලුත්වැඩියාව Single Pointer Indicator ක්‍රමාංකනය සහ Triplex Indicator සේවා කිරීම ඇතුලත්ය.

v. <u>ව්‍යුහ අලුත්වැඩියා වැඩපොළ</u> 2018 වර්ෂය තුල MA-60, Y-12, B-200, Bell-212 සහ Bell-412 ගුවන්යානා වලට අදාළ කාර්යයන් 57ක් සිදු කර ඇත. මෙයට Oil Cooler Panel අලුත්වැඩියාව, මගී දොරටුව අලුත්වැඩියාව සහ Encoder Mounting Bracket අලුත්වැඩියාව ඇතුලත්ය.

vi. <u>විනාශකාරී නොවන පරික්ෂා කිරීම් සිදු කරන පර්යේෂණාගාරය</u> 2018 වර්ෂය තුල චුම්භක අංශු පරීක්ෂාවන් 262ක් සහ Eddy ධාරා පරීක්ෂාවන් 38ක් සහ ලික්විඩ් පෙනිට්‍රන්ට් පරීක්ෂාවන් 14ක් සිදු කර ඇත.

vii. <u>බැටරි වැඩපොළ</u> 2018 වර්ෂය තුල බැටරි අලුත්වැඩියාවන් හා ධාරිතා පරීක්ෂාවන් ඇතුළු කාර්යයන් 6ක් සම්පූර්ණ කර ඇත.

### (උ) 2018 වර්ෂයේදී අංක 01 පියාසර පුහුණු පක්ෂාංගයේ ගුවන්යානා හා ගුවන්ගමන් ආශ්‍රිත ක්‍රියාකාරකම් වල සංවර්ධනය

i. 2018 පෙබරවාරි මස නිදහස් දින පියාසර පෙළපාලිය සඳහා කටුකුරුන්ද ශ්‍රීලංගුහ කඳවුරේ සිට Cessna150 ගුවන්යානා 05ක් පියාසර කරවීම







ii. 2018 පෙබරවාරි මස නිදහස් දින පියාසර පෙළපාලිය සඳහා කටුකුරුන්ද ශ්‍රීලංගුහ කඳවුරේ සිට PT-6 ගුවන්යානා 03ක් පියාසර කරවීම.

iii. 2018 පෙබරවාරි මස නිදහස් දින පියාසර පෙළපාලිය සඳහා කටුනායක ශ්‍රීලංගුහ කඳවුරේ සිට K-8 ගුවන්යානා 03ක් පියාසර කරවීම







iv. 2018 මාර්තු මස පැවති 67 වන ගුවන්හමුදා සංවත්සර පියාසර පෙළපාලිය සඳහා අම්පාර ශ්‍රීලංගුහ කඳවුරේ සිට PT-6 ගුවන්යානා 03ක් පියාසර කරවීම

v. 2018 අප්‍රේල් මස වර්ණ ප්‍රධානෝත්සවයේ පියාසර පෙළපාලිය සඳහා කටුනායක ශ්‍රීලංගුහ කඳවුරේ සිට K-8 ගුවන්යානා 04ක් පියාසර කරවීම හා චීනයේ AVIC Hongdu සමාගමෙන් මිලදී ගත් PT-6 ගුවන්යානා 6ක් නිල වශයෙන් භාරගැනීම






vi. 2018 ජුලි මස වීරවිල ශ්‍රීලංගුහ කඳවුරේ පැවති ගුවන් හමුදා සංදර්ශනය සඳහා PT-6 ගුවන්යානා 3ක් පියාසර කරවීම

vii. අලුතින් මිලදීගත් PT-6 ගුවන්යානා 6ක් එකලස් කිරීම සහ එම අලුතින් මෙහෙයුම් සඳහා එක්වූ PT-6 ගුවන්යානා හයේ පොදු වෙනස්කම් සිදු කිරීම කටුනායක ශ්‍රීලංගුහ කඳවුරේ ගුවන්යානා ඉංජිනේරු පක්ෂාංගයේදී 2018 ඔක්තෝම්බර් මාසයේදී අවසන් කිරීම






viii. 2018 ඔක්තෝම්බර් සිට නොවැම්බර් දක්වා එකලස් කිරීම් හා අදාළ වෙනස්කම් සිදු කිරීමෙන් චීන ජාතික ගුවන් තාක්ෂණික ආනයන හා අපනයන සමාගමෙන් කටුනායක ශ්‍රීලංගුහ කඳවුරේ ගුවන් ඉංජිනේරු පක්ෂාංගය වෙත අලුතින් PT-6 ගුවන්යානා 6ක් ලැබීම.

ix. 2018 නොවැම්බර් සිට දෙසැම්බර් දක්වා අලුතින් මෙහෙයුම් ආරම්භ කරන ලද PT-6 ගුවන්යානා 6හි නව දුමාර පද්ධතියේ වෙනස්කම් සිදු කිරීම.

(ඔ)  2018 වර්ෂයේදී අංක 09 බලසෑණයේ ගුවන්යානා හා ගුවන්ගමන් ආශ්‍රිත ක්‍රියාකාරකම් වල සංවර්ධනය

| අනු අංකය | විස්තරය | සේවා වර්ගය | කාල සීමාව |
|---|---|---|---|
| 01 | SCH880 C-130 | Propeller Root Seal Replace (S/no N 235086,N226115) | 2018.06.06 සිට 2018.06.14 දක්වා |
| 02 | SCH880 C-130 | KTR 908 VHF Communication system Modification | 2018.07.03 |

(එ)  2018 වර්ෂයේදී අංක 04 බලසෑණයේ ගුවන්යානා හා ගුවන්ගමන් ආශ්‍රිත ක්‍රියාකාරකම් වල සංවර්ධනය

APU Ignition Coil විදුලි ධාරා තීව්‍රතා පරීක්ෂකය. 17 ගුවන්යානා වල APU ignition coil හා igniter plug වල ක්‍රියාකාරිත්වය නිර්ණය කර ගැනීම සඳහා මෙම APU Ignition Coil විදුලි ධාරා තීව්‍රතා පරීක්ෂකය බෙහෙවින් ඉවහල් වේ. AN-9B APU හි MM අනුව, සෑම බලගැන්වීම් වාර 500 කට APU ignition coil හා igniter plug පරීක්ෂා කල යුතු අතර අවශ්‍ය වුවහොත් විදුලි ධාරාවේ තිව්‍රතාවය සැකසුම් ඉස්කුරුප්පුවක් භාවිතයෙන් සකස් කල යුතුය. මෙම පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතියට පෙර එවැනි පරීක්ෂා කිරීමේ පහසුකම් බලසනය සතු නොවිය. තවද, කාර්මික දෝෂ නිවැරදි කිරීමේදී, ජ්වලනයේ ක්‍රියාකාරිත්වය පරික්ෂා කරනු ලබන්නේ එය APU වෙත සම්බන්ධ කර ඇති විටයි.මෙය ඉතා අනතුරුදායක, අකාර්යක්ෂම මෙන්ම නිෂ්ඵල කාර්යයකි.ඒ අනුව මෙම පරීක්ෂකය භාවිතා කිරීම මඟින් විදුලි ධාරාවේ දැක්වීම් ලබා ගැනීම මෙන්ම ජ්වලනයේ තීව්‍රතාවය පරික්ෂා කිරීම කාර්මික ශිල්පින් හට පහසු කරවයි.




(ඒ)  2018 වර්ෂයේදී අංක 06 බලසෑණයේ ගුවන්යානා හා ගුවන්ගමන් ආශ්‍රිත ක්‍රියාකාරකම් වල සංවර්ධනය

දිගු කලක් පියාසර කිරීම් නවතා තිබු SMH-588 -171V හෙලිකොප්ටර් යානය නැවත යථා තත්වයට පත් කර මධ්‍යම අප්‍රිකාවේ එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා මෙහෙයුම් සඳහා පිටත් කර යැවීම.

i. දකුණු සුඩානයේ එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරීන්හි නිරත MI-17 හෙලිකොප්ටර් යානා ආදේශනය කිරීම.



ii. මධ්‍යම අප්‍රිකාවේ එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරීන්හි නිරත MI-17 හෙලිකොප්ටර් යානා ආදේශනය කිරීම.



iii. MI-171ය හෙලිකොප්ටර් යානා සම්බන්ධ කරගනිමින් ගුවනේ සිට ගොඩබිම් ප්‍රහාර අභ්‍යාසයක් පැවැත්වීම.





iv. මිහින්තලයේදී හෙලිකොප්ටර් මගින් භාණ්ඩ එල්ලගෙන යාමේ මෙහෙයුමක් සිදු කිරීම








v. SMH-4424 -171E හෙලිකොප්ටර් යානය නැවත ප්‍රකෘති තත්වයට සකස් කිරීමේ ක්‍රියාවලිය සිදු කිරීම.





(ඔ) 2018 වර්ෂයේදී අංක 08 බලසඝණයේගුවන්යානා හා ගුවන්ගමන් ආශ්‍රිත ක්‍රියාකාරකම් වල සංවර්ධනය.

| අනු අංකය | විස්තරය | සටහන් | මූල්‍යමය |
|---|---|---|---|
| 01 | SMR- 843B-200 ගුවන්යානයේ ඇතුලත හා පිටත තත්වයන් වැඩි දියුණු කිරීම | සම්පූර්ණයෙන් නැවත තීන්ත ආලේප කිරීම සිදු කිරීම හා ඇතුලත තත්වය වැඩි දියුණු කිරීම | ආසන්න වශයෙන් රු 250,000.00 |




(ඕ) 2018 වර්ෂයේදී අංක 09 බලසෘණයේ ගුවන්යානා හා ගුවන්ගමන් ආශ්‍රිත ක්‍රියාකාරකම් වල සංවර්ධනය

2018 වර්ෂය තුල මෙම බලසනය විසින් MI - 17 ගුවන්යානා යොදා ගනිමින් ක්‍රියාකාරකම් රැසක් සිදු කර ඇත. විස්තර පහත පරිදිය.

i. පැරෂුට් ආධාරයෙන් පැනීම - දියතලාව ශ්‍රීලංගුහ කඳවුර
ii. පැරෂුට් ආධාරයෙන් පැනීම - වීරවිල ශ්‍රීලංගුහ කඳවුර (ගුවන්හමුදා සංදර්ශනය)
iii. පැරෂුට් ආධාරයෙන් පැනීම - විශේෂ කාර්ය බලකාය
iv. පැරෂුට් පුහුණුව - දියතලාව ශ්‍රීලංගුහ කඳවුර
v. පුහුණු වැඩසටහන - ශ්‍රී ලංකා නාවික හමුදාව විශේෂ යාත්‍රා බලසනය
vi. පැරෂුට් ආධාරයෙන් පැනීමේ පෙරහුරුව - අම්පාර ශ්‍රීලංගුහ කඳවුර
vii. පැරෂුට් ආධාරයෙන් පැනීම - අම්පාර ශ්‍රී ලංකා යුධ හමුදා කඳවුර
viii. රෙජිමේන්තු විශේෂ බලකා විසිරයාමේ පෙළපාලිය මොරවැව ශ්‍රීලංගුහ කඳවුර සංවර්ධනය

(ඖ) 2018 වර්ෂයේදී අංක 111 බලසෘණයේ ගුවන්යානා හා ගුවන්ගමන් ආශ්‍රිත ක්‍රියාකාරකම් වල සංවර්ධනය

බාහිර ගුවන් නියමු පුහුණුවීම් වල අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අවශ්‍ය ගුවන්යානා ආකෘති නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය භාරගෙන ඇත. දැනට එම ව්‍යාපෘතිය මඟින් නිෂ්පාදනය කරන ලද ගුවන්යානා ආකෘති 5 ක් බලසනය සතුව පවතී.

(ක) 2018 වර්ෂයේදී ගුවන්යානා ඉංජිනේරු පක්ෂාංගයේ ගුවන්යානා හා ගුවන්ගමන් ආශ්‍රිත ක්‍රියාකාරකම් වල සංවර්ධනය.

i. <u>Rotor වැඩපොළ</u>

නව TAB de-lanation prevention විශේෂ සවි කිරීම් උපකරණය නිෂ්පාදනය කිරීම කිරීම.



ii. <u>ආරක්ෂක වැඩපොළ</u>

භාණ්ඩ ඉල්ලුම් කිරීමේ පද්ධතිය පහසුව තකා උපකරණ ප්‍රතිපාදන හා ගිණුම් කිරීමේ පරිඝනක පද්ධතියේ (EPAS) ප්‍රවේශය ලබා දීම සහ ආරක්ෂක වැඩපොළට නව ඇතුල්වීමේ දොරටුවක් සවි කිරීම



iii. එන්ජින් වැඩපොළ

(i) AGB housing ඉවත් කිරීමේ හා සවි කිරීමේ ධාරිතාවය වැඩි කිරීම



(ii) නව හදිසි LED ආලෝක පහන් සවි කිරීම



(iii) Engine/RGB පැටවීම හා ගොඩබෑම සඳහා අලුතින් Hands Tracker මිලදී ගැනීම



iv. <u>උපකරණ වැඩපොළ</u>

නව පුහුණුවීම් මුල්ලක් සැකසීම




v. <u>තාක්ෂණික සැලසුම් හා ලේඛන අංශය</u>

ජාල හැකියාවන් වර්ධනය කිරීම සඳහා 3U rack වෙනුවට 7U Rack ප්‍රතිස්ථාපනය කිරීම



vi. සංයුක්ත වැඩපොළ

HS 2034 නියමුවන් රහිත ගුවන්යානා ගොඩබැස්සවීමේ ගියර් පද්ධතිය නිෂ්පාදනය කිරීම 2034 නියමුවන් රහිත ගුවන්යානා ගොඩබැස්සවීමේ ගියර් පද්ධතිය නිෂ්පාදනය කිරීම



vii. ප්‍රමිත කාමරය

ISO 17025 ප්‍රමිතීන්ට අනුව කාමරය තුල නියමිත උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය පවත්වාගෙනයාම සඳහා දොරටු දෙකක් සහිත පද්ධතියක් ස්ථාපිත කිරීම



(බ) 2018 වර්ෂයේදී ගුවන්යානා ඉංජිනේරු සහයාක පක්ෂාංගයේ ගුවන්යානා හා ගුවන්ගමන් ආශ්‍රිත ක්‍රියාකාරකම් වල සංවර්ධනය

i. ගුවන්යානා උපාංග වල දෝෂ හඳුනා ගැනීමේ බහු කාර්ය උපකරණය නිෂ්පාදනය කිරීම(EසහI වැඩපොළ). මුළු වියදම රු. 22,000.00 කි.

ii. උපාංග වැඩපොළ Y-12 ගුවන්යානා බෙයාරිම පිරිසිදු කිරීමේ යන්ත්‍රය

iii. එන්ජින් වැඩපොළ C-150 ගුවන්යානා එන්ජින් දඟරකඳ සීරුමාරු කිරීම පරික්ෂා කිරීමේ මෙවලම. මුළු වියදම රු.14,000.00 කි.

iv. අවරපෙති වැඩපොළ Retention bearing puller මුළු වියදම රු8,000.00 කි.

v. ත්‍රිමාන මුද්‍රණ යන්ත්‍රයක් ස්ථාපිත කිරීම

(ග) 2018 වර්ෂයේදී ගුවන් හමුදා කෞතුකාගාරයේ ගුවන්යානා හා ගුවන්ගමන් ආශ්‍රිත ක්‍රියාකාරකම් වල සංවර්ධනය.

i. Bolton Paul Balliol ප්‍රදර්ශන ගුවන්යානය

පෙර



පසු



මුළු වියදම රු. 28,800.00 කි.

ii. CT-131 SF-260 SIAI Marchetti ප්‍රදර්ශන ගුවන්යානය

පෙර



පසු



මුළු වියදම රු. 12,000.00 කි.

iii. Camov KA-26 ප්‍රදර්ශන හෙලිකොප්ටර් යානය

පෙර



පසු



මුළු වියදම රු. 18,000.00 කි.

iv. <u>CT-128 SF-260 SIAI Marchetti ප්‍රදර්ශන ගුවන්යානය</u>

පෙර පසු





මුළු වියදම රු. 19,000.00 කි.

v. <u>Douglas DC-3 Dakota ප්‍රදර්ශන ගුවන්යානය</u>

පෙර පසු







මුළු වියදම රු. 39,000.00 කි.

vi. <u>MI-24 ප්‍රදර්ශන හෙලිකොප්ටර් යානය</u>

පෙර පසු





මුළු වියදම රු. 32,000.00 කි.

vii. <u>මොරටුව විශ්වවිද්‍යාලයේ ඇති Mig-27 ගුවන්යානය</u>

පෙර පසු





මුළු වියදම රු. 32,000.00 කි.

viii. <u>ආධුනිකයින් සඳහා වන ගුවන්යානා තාක්ෂණික මූලික දැනුම ලබා දීමේ වැඩසටහන.</u>





**(ඝ) 2018 වර්ෂයේදී ගුවන්යානා පූර්ණ වශයෙන් අලුත්වැඩියාකිරීමේ පක්ෂාංගයේ ගුවන්යානා හා ගුවන්ගමන් ආශ්‍රිත ක්‍රියාකාරකම් වල සංවර්ධනය.**

i. <u>PT-6 ගුවන්යානා පූර්ණ වශයෙන් අලුත්වැඩියා කිරීමේ පහසුකම් ස්ථාපනය කිරීම.</u>

BT-187 ගුවන්යානය පූර්ණ අලුත්වැඩියා කිරීම සිදු කරමින් පවතින අතර SBT-1162 ගුවන්යානය අලුත්වැඩියා කිරීම අවසන් කර එන්ජිම නොමැතිවීම හේතුවෙන් ගොඩබිම් ධාවන පරික්ෂාව හා පියාසර පරික්ෂාව සඳහා රඳවාගෙන ඇත.





ii. <u>F-7 සහ K-8 ගුවන්යානා සඳහා උපාංග පූර්ණ අලුත්වැඩියා කිරීමේ පහසුකම් ස්ථාපනය කිරීම</u>

(i) F-7 සහ K-8 ගුවන්යානා උපාංග පූර්ණ අලුත්වැඩියා කිරීමේ පුහුණුව සාර්ථකව නිම කර ඇත.





(ii) Y-12 ගුවන්යානා පූර්ණ අලුත්වැඩියා කිරීමේ පහසුකම් ස්ථාපිත කිරීම.





(iii) <u>F-7 ගුවන්යානා පූර්ණ අලුත්වැඩියා කිරීමේ පහසුකම් ස්ථාපිත කිරීම</u> SFT-705 සහ SFI- 780 F-7 ගුවන්යානා පූර්ණ අලුත්වැඩියා කිරීම සාර්ථකව නිම කර ඇත.





(iv) K-8 ගුවන්යානා පූර්ණ අලුත්වැඩියා කිරීමේ පහසුකම් ස්ථාපිත කිරීම





(v) <u>පාලවී ශ්‍රීලංගුහ කඳවුරේ ජල පවිත්‍රාගාරයක් ස්ථාපිත කිරීම</u>
අනුමත සැලැස්මට අනුව පාලවී ශ්‍රීලංගුහ කඳවුර තුල ජල පවිත්‍රාගාරයක් සහ අපජලය පිරිපහදු කිරීමේ යන්ත්‍රයක් ස්ථාපිත කිරීමේ කටයුතු අවසන් කර ඇත. තවද, උපකරණ සවි කිරීමද අවසන් කර ඇති අතර අවසන් පරීක්ෂණ පවත්වා අධිකාරියට පත් කිරීමට සුදානමින් පවතී.




## (න) 2018 වර්ෂයේදී ඒකල වෘත්තීය පුහුණු පාසලේ ගුවන්යානා හා ගුවන්ගමන් ආශ්‍රිත ක්‍රියාකාරකම් වල සංවර්ධනය

i. ප්‍රායෝගික පුහුණුවීම් සඳහා යොදා ගැනීමේ හා ප්‍රදර්ශනය කිරීමේ අරමුණින් යුතුව SBT- 1610 හා PT 06 ගුවන්යානා අලුත්වැඩියා කිරීම මෙන්ම මෙම ව්‍යාපෘතිය මඟින් ප්‍රධාන වශයෙන්ම ගුවන් රාමු තාක්ෂණික ශිල්පීන්ගේ පුහුණු අවශ්‍යතා සහ හෙලිටුවර්ස් පුහුණු මධ්‍යස්ථානයේ පුහුණුවීම් හරහා අනෙකුත් ගුවන් වෘත්තීන්ගේ පුහුණු අවශ්‍යතා සපුරාලයි. මෙමඟින් මූලික ගුවන්යානා පාලනයන් හා ගුවන් මෙහෙයුම් වලදී ඒවායෙහි භාවිතය මෙන්ම ගුවන්යානා නඩත්තුව පිළිබඳව ද ප්‍රායෝගික දැනුමක් ලබා ගැනීමට අවකාශය සලසා දී ඇත.

ii. තවද අලුත්වැඩියා කරන ලද PT-6 ගුවන්යානය ඒකල වෘත්තීය පුහුණු පාසලේ ප්‍රදර්ශන ඒකකය තුල ප්‍රදර්ශනය පිණිස තැබීමට නියමිතය. ව්‍යාපෘති වියදම රු.54,200.00 කි.






**(ණ) ඒකල ශ්‍රීලංගුහ වෘත්තීය පුහුණු පාසලේ ගුවන්යානා නවතා තැබීමේ ප්‍රදේශයක් නිර්මාණය කිරීම.**

වෘත්තීය පුහුණුවීම් හා හෙලිටුවර්ස් තාක්ෂණික පුහුණු මධ්‍යස්ථානය මඟින් පවත්වන පුහුණුවීම් සඳහා යොදා ගන්නා දැනට පවතින හා අලුතින් හඳුනාගත් අලුත්වැඩියා කල නොහැකි තත්වයේ පවතින ගුවන්යානා නැවත්වීම සඳහා මෙම ප්‍රදේශය නිර්මාණය කර ඇත. ව්‍යපෘති වියදම රු. 254,200.00 කි.



**(ත) ගුවන්යානා සම්බන්ධ විෂයයන් ඉගැන්වීම සඳහා ගුවන්යානා පද්ධති පිලිබඳ වීඩියෝ සහ LED දර්ශන තිර.**

අද වන විට ගුවන්යානා පද්ධති පිලිබඳ උසස් තත්වයේ වීඩියෝ අන්තර්ජාලය හරහා ලබා ගත හැකි අතර මෙම වීඩියෝ පිළිගත් පුහුණු ආයතන විසින් නිපදවා ඇත. මෙම වෘත්තීය පුහුණු පාසල තුල පුහුණු අවශ්‍යතා සඳහා පරිශීලනයට මෙවැනි මට්ටමේ වීඩියෝ දර්ශනවල හිඟයක් පැවතිණි. මෙහි දක්වා ඇති ව්‍යාපෘතිය හරහා වෘත්තීය පුහුණු හා හෙලිටුවර්ස් තාක්ෂණික පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු පාඨමාලා සඳහා අවශ්‍ය LED දර්ශන තිරයක් හා ගුවන්යානා පද්ධති පිලිබඳ වීඩියෝ නිර්මාණය කිරීම මඟින් ඉහත සඳහන් අවශ්‍යතාවය සපුරා ඇත. ව්‍යාපෘතිය සඳහා මුළු වියදම රු. 42,000.00 කි.



**(ද) 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට එරෙහිව තත්‍ය කාර්යසාධනය**

i. <u>ගුවන්යානා මිලදී ගැනීම</u> 2018 වර්ෂයේදී ප්‍රාග්ධන වියදම් යටතේ ගුවන්යානා මිලදී ගැනීම සඳහා ගුවන්යානා ඉංජිනේරු අධ්‍යක්ෂකය විසින් ලංරුම් 100,869.50ක් ඇස්තමේන්තු කර ඇත. කෙසේ නමුදු එයින් ගුවන්යානා මිලදී ගැනීමට අදාලව ප්‍රාග්ධන වියදම් ලෙස ලංරුම් 837.34 ක මුදලක් වියදම් දරා ඇත.

(i) 2018 වර්ෂය තුල ශ්‍රීලංගුහ විසින් ලංරුම් 567.87ක් වටිනා PT-6 ගුවන්යානා 6ක් භාරගැනීම මීට අයත්ය.

(ii) තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව සම්පූර්ණ කිරීමට සහ එම වාර්තාව ආරක්ෂක අමාත්‍යාංශයේ SCAPC කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට තිබූ බැවින් බහු කාර්ය ප්‍රහාරක ගුවන්යානා මිලදී ගැනීම ඉදිරියේදී සිදු කිරීමට නියමිතය.

(iii) C-130 ගුවන්යානා 02ක් මිලදී ගැනීම.

(iv) IL-76 ගුවන්යානා 02ක් මිලදී ගැනීම.

(v) නියමුවන් රහිත ගුවන්යානයක් සහ ගොඩබිම් පාලන ඒකකයක් මිලදී ගැනීමග

(vi) හෙලිකොප්ටර් පුහුණුවීම් සිදු කරන ආකෘති යානා 06ක් මිලදී ගැනීමග

(vii) ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ලැබෙන තුරු ප්‍රහු හෙලිකොප්ටර් යානා 02ක් මිලදී ගැනීම ඉදිරියේදී සිදු කිරීමට නියමිතය.

ii <u>ගුවන්යානා අමතර කොටස් මිලදී ගැනීම</u> 2018 වර්ෂය තුල එන්ජින්, අවරපෙති සහ මෙවලම් ඇතුළු ගුවන් යානා අමතර කොටස් මිලදී ගැනීම සඳහා අධ්‍යක්ෂකය විසින් ලංරුමි.457.06 ක මුදලක් ඇස්තමේන්තු කර ඇත.

(i) එයින් ප්‍රාග්ධන ස්වභාවයෙන් යුතු ලංරුමි 216.22ක් වටිනා අමතර කොටස් මිලදී ගැනීම සාර්ථකව අවසන් කර ඇත. මෙයට ප්‍රධාන වශයෙන් MI-17 ගුවන්යානා සඳහා ලංරුමි 44.34ක් වටිනා Tail Rotor 02ක් සහ ලංරුමි 60.46ක් වටිනා ප්‍රධාන Rotor blade කට්ටල 02ක් ඇතුලත්ය.

(ii) තවද, ප්‍රාග්ධන ස්වරූපයේ අමතර කොටස් ලෙස 61 බලපන්තිය සඳහා ලංරුමි 30.23ක වටිනාකමින් යුත් MI-17 ගුවන්යානා වල ප්‍රධාන rotor blade කට්ටල සහ ලංරුමි 22.99 ක වටිනාකමින් යුත් AN32B ගුවන්යානා වල අවරපෙති මිලදී ගෙන ඇත.

(iii) ඉහත සියල්ලට අමතරව, අධ්‍යක්ෂකය විසින් 2018 වර්ෂය තුල ලංරුමි 58.20ක් වටිනා ප්‍රාග්ධන ස්වරූපයෙන් යුත් වෙනත් අමතර කොටස් ද මිලදී ගෙන ඇත.

(iv) මිලදී ගැනීමට සැලසුම් කල මුළු ප්‍රාග්ධන අමතර කොටස් වලින් ලංරුමි 57.48ක වටිනාකමින් යුත් අමතර කොටස් මිලදී ගැනීම්, 2018 වර්ෂය අවසානය වන විටත් භාණ්ඩ ලැබීම ප්‍රමාද වීම හා මුරෙ 136 ප්‍රකාරව අනුමැතිය ලැබෙන තුරු සිටීම ආදී හේතුන් මත අවසන් කර නොමැත.

(v) ඉතිරි ලංරුමි 148.02ක් වටිනා ප්‍රාග්ධන අමතර කොටස් මිලදී ගැනීම් විවිධ හේතු මත සිදු කර නොමැත.

iii. <u>ගුවන්යානා අමතරකොටස් මිලදී ගැනීම හා නඩත්තුව</u>

2018 වර්ෂය ආරම්භයේදී, පුනරාවර්තන ස්වරූපයෙන් යුතු ගුවන්යානා අමතරකොටස් මිලදී ගැනීමට සහ ගුවන්යානා නඩත්තුව සඳහා ලංරුම් 4,736.74 මුදලක් අධ්‍යක්ෂකය විසින් ඇස්තමේන්තු කර ඇත. මෙයින් ශ්‍රීලංගුහ විසින් 2018 වර්ෂය තුලදී ගුවන්යානා අමතර කොටස් මිලදී ගැනීම් හා නඩත්තුව සඳහා මුළු වටිනාකමින් ලංරුම් 1,487.07ක් වටිනා මුදලක් සාර්ථකව යොදවා ඇත. මෙයට ප්‍රධාන වශයෙන්ම පහත සඳහන් කාර්යයන් ඇතුලත්ය.

(i) ලංරුම් 66.98ක් වටිනා AEFT අමතර කොටස් මිලදී ගැනීම

(ii) Bell 412 හෙලිකොප්ටර් යානා සඳහා ලංරුම් 60.01ක් වටිනා මෙක nozzle replacement 72ක් මිලදී ගැනීම

(iii) අංක 04 බලසනය සහ අංක 07 බලසනය සඳහා ආපදා කළමනාකරණයට අවශ්‍ය එකක් ලංරුම් 48.56ක් වටිනා Internal Rescue Hoist 02ක් මිලදී ගැනීම

(iv) ලංරුම් 40.56ක් වටිනා නියමුවන් රහිත ගුවන්යානා පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතිය මිලදී ගැනීම

(v) එමෙන්ම, 2018 වර්ෂය අවසානය වන විටත් ගුවන්යානා නඩත්තු කිරීම සහ ලංරුම් 1,175.41ක් වටිනා පුනරාවර්තන ස්වරූපයේ ගුවන්යානා අමතර කොටස් මිලදී ගැනීම සිදු කරමින් පැවතිනි. භාණ්ඩ කොටස් වශයෙන් ලැබීම, භාණ්ඩ ලැබෙන තෙක් සිටීම, දෙපාර්තමේන්තුගත ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලැබෙන තෙක් සිටීම සහ ඇගයුම් ලැබෙන තෙක් සිටීම මෙයට හේතු විය.

(vi) ඊට අමතරව, අවලංගු කිරීම හා භාණ්ඩ භාරදීම අවසාන වීම වැනි විවිධ හේතුන් නිසා නඩත්තු කිරීම් සහ ලංරුම් 2,074.26ක් වටිනා ගුවන් යානා අමතර කොටස් මිලදී ගැනීම් සිදු කර නොමැත.

iv. <u>අලුත්වැඩියා හා පූර්ණ අලුත්වැඩියාකිරීමේ වැය ශීර්ෂය (2002)</u>

2018 වර්ෂය ආරම්භයේදී, ගුවන්යානා ඉංජිනේරු අධ්‍යක්ෂකය විසින් ලංරුම් 8,233.28ක ප්‍රාග්ධන වියදම් යටතේ ගුවන්යානා අලුත්වැඩියාවන් සහ පූර්ණ අලුත්වැඩියාවන් සිදු කිරීමට සැලසුම් කර ඇත. නමුත් වර්ෂය අවසානයේදී අධ්‍යක්ෂකය විසින් අලුත්වැඩියාවන් සහ පූර්ණ අලුත්වැඩියාවන් සඳහා ලංරුම් 266.88ක මුදලක් වියදම් දරා ඇත. මෙයට පහත සඳහන් කාර්යයන් ඇතුලත්ය.

(i) MA-60 ගුවන්යානයේ එන්ජිම ලංරුම් 105.00ක වටිනාකමින් අලුත්වැඩියා කිරීම හා පූර්ණ අලුත්වැඩියා කිරීම.

(ii) Bell 212 හෙලිකොප්ටර් යානයේ power section ලංරුම් 48.74ක වටිනාකමින් අලුත්වැඩියා කිරීම හා පූර්ණ අලුත්වැඩියා කිරීම.

(iii) MI-17 හෙලිකොප්ටර් යානයේ MGB ලංරුම් 31.19ක වටිනාකමින් අලුත්වැඩියා කිරීම හා පූර්ණ අලුත්වැඩියා කිරීම.

(iv) SFI-705 F-7BS ගුවන්යානයේ උපාංග වල මතුපිට පිරියම් කිරීම ලංරුැමි 30.08ක වටිනාකමින් සිදු කිරීම.

(v) C-130 ගුවන්යානයේ ටීබයිම මොඩියුල ලංරුැමි 22.18ක වටිනාකමින් අලුත්වැඩියා කිරීම හා පූර්ණ අලුත්වැඩියා කිරීම.

(vi) C-130 ගුවන්යානයේ අවරපෙති ලංරුැමි 16.93 ක වටිනාකමින් අලුත්වැඩියා කිරීම හා පූර්ණ අලුත්වැඩියා කිරීම.

(vii) MI-17 හෙලිකොප්ටර් යානයේ Tail rotor hub ලංරුැමි 12.76ක වටිනාකමින් අලුත්වැඩියා කිරීම හා පූර්ණ අලුත්වැඩියා කිරීම

(viii) ලංසු ලැබෙන තුරු සිටීම, තාක්ෂණික ඇගයුම් කමිටුවේ පැහැදිලි කිරීම් අපේක්ෂාවෙන් සිටීම, කොන්ත්‍රාත් ලැබෙන තුරු සිටීම වැනි හේතු නිසා ලංරුැමි 6,763.86ක වටිනාකමින් යුතු ගුවන්යානා අලුත්වැඩියාවන් හා පූර්ණ අලුත්වැඩියාවන් තවමත් සිදු කිරීමේ අපේක්ෂාවෙන් පවතී.

(ix) තවද, අවලංගු කිරීම හා වෙනත් හේතු මත ලංරුැමි 1,202.54ක් වටිනා ගුවන්යානා අලුත්වැඩියාවන් හා පූර්ණ අලුත්වැඩියාවන් සිදු කර නොමැත.

## (4) සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂකය

### (අ) හැඳින්වීම

i. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාන්‍ය ඉංජිනේරු වෘත්තීන් පරිපාලනය කිරීම සඳහා සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂකය ස්ථාපිත කරනු ලැබ ඇත. මෙමඟින් ප්‍රධාන වශයෙන්ම ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූලික කාර්යය වන පියාසර කිරීම සඳහා අවශ්‍ය වන සහය හා පහසුකම් සපයනු ලැබේ. ප්‍රධාන අංශ 02ක් හා වෘත්තීන් 10ක් මෙම අධ්‍යක්ෂකයේ විෂය පථය යටතේ පාලනය වේ.

ii. සාමාන්‍ය ඉංජිනේරු පක්ෂාංගය සහ මෝටර් රථ කාර්මික හා නඩත්තු කිරීමේ පක්ෂාංගය මෙම ප්‍රධාන අනුඛණ්ඩ දෙක වේ.වෘත්තීන් 10කට අයත් විශේෂඥ දැනුමැති ගුවන්භටයින් මෙම අධ්‍යක්ෂකය සතු නමුත් සාමාන්‍ය ඉංජිනේරු කාර්යයන් හා ගුවන්යානා ඉංජිනේරු සම්බන්ධ කාර්යයන් වල මාරුවෙන් මාරුවට නියැලී සිටින කාර්මික ඉංජිනේරු ශාඛාවේ නිලධාරීන් විසින් මෙහි සේවය සපයයි.

iii. 2018 වර්ෂය ආරම්භයේදී සාමාන්‍ය ඉංජිනේරු ක්‍රියාකාරකම් සඳහා ලංරුම් 692.40ක මුදලක් මෙම අධ්‍යක්ෂකය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මඟින් ඉලක්ක ගතකොට තිබුණි. මෙම වෙන් කිරීම් වලින් පවතින ද්‍රවශීලතාවය මත පදනම් වෙමින් අධ්‍යක්ෂකය විසින් එහි අත්‍යවශ්‍ය කටයුතු 2018 වර්ෂයේදී සිදු කරගෙන ගොස් ඇත. අධ්‍යක්ෂකය විසින් සිදු කල ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

### (ආ) 2018 වර්ෂයේදී සාමාන්‍ය ඉංජිනේරු ක්‍රියාකාරකම් සඳහා දරන ලද වියදම

2018 වර්ෂය තුල සාමාන්‍ය ඉංජිනේරු ක්‍රියාකාරකම් සඳහා දරන ලද මුළු වියදම ලං.රු.මි. 116.57 කි. මෙයට පහත සඳහන් වියදම් ඇතුලත්ය.

i. සාමාන්‍ය ඉංජිනේරු වැඩ සඳහා වියදම ලං.රු.මි. 62.34 කි.

ii. සාමාන්‍ය ඉංජිනේරු වැඩපොළ උපකරණ සහ ඡායාරූප ගැනීම සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා වියදම ලං.රු.මි. 40.90 කි.

iii. වෙනත් සැපයුම් සඳහා වියදම ලං.රු.මි. 13.32 කි (RPC/SVP).

### (ඇ) 2018 වර්ෂයේ ආයුධ සහ පතුරම්, ගෘහස්ථ කණ්ඩායම්, යාන්ත්‍රික හා ඉලෙක්ට්‍රොනික උපාංග සහ වෙනත් සැපයුම් සඳහා සාමාන්‍ය ඉංජිනේරු වැය ශීර්ෂ 1205 යටතට අයත්වන කාර්යසාධන වාර්තාව

2018 වර්ෂය ආරම්භයේදී ආයුධ සහ පතුරම්, ගෘහස්ථ කණ්ඩායම්, යාන්ත්‍රික හා ඉලෙක්ට්‍රොනික උපාංග සහ වෙනත් සැපයුම් සඳහා ලං.රු.මි. 39.90 ක මුදලක් වෙන් කර ඇත. තවද මුළු වෙන් කිරීම් ප්‍රමාණය ලං.රු.මි. 62.35ක් ලෙස ඉහල දමමින් වර්ෂය තුල පරිපූරක ප්‍රතිපාදන වශයෙන් ලං.රු.මි. 22.45ක් ලැබී ඇත. 2018 වර්ෂය තුල ආයුධ සහ පතරොම්, ගෘහස්ථ කණ්ඩායම්, යාන්ත්‍රික හා ඉලෙක්ට්‍රොනික උපාංග සහ වෙනත් සැපයුම් සඳහා වන තත්‍ය වියදම ලං.රු.මි. 62.35කි. මෙයට පහත සඳහන් කාර්යයන් ඇතුලත්ය.

i. 2017 හා 2018 වර්ෂ සඳහා F-7BS/GS සහ K-8 ගුවන්යානා වලට ලං.රු.මි. 21.64ක වටිනාකමින් යුත් PYRO පතරොම් මිලදී ගැනීම

ii. ආයුධ හා පතරොම් වලට අදාළ ප්‍රධාන වියදමෙන් F-7BS සහ F-7GS ගුවන්යානා ඇණිය සඳහා ලං.රු.මි. 3.11ක වටිනාකමින් යුත් පතරොම් මිලදී ගැනීම සහ ලංරුමි 30.04ක වියදමින් මිමි 7.62X39 **MM** ප්‍රමාණයේ හිස් පතරොම් මිලදී ගැනීම

iii. ලං.රු.මි. 1.92ක වටිනාකමින් යුත් 9X19 MM ජීව පතරොම් (ball ammunition) මිලදී ගැනීම.

iv. ඉහත සඳහන් උපාංග වලට අමතරව ලං.රු.මි. 0.74 ක වටිනාකමින් යුත් රයිෆල් බඳ පටි අධ්‍යක්ෂකය විසින් මිලදී ගෙන ඇත.

v. ලං.රු.මි. 0.30ක වටිනාකමින් යුත් දුම් බෝම්බ මිලදී ගැනීම

vi. තවද, ලං.රු.මි. 12.63ක වටිනාකමින් යුත් අමුද්‍රව්‍ය ප්‍රමාණයක් මිලදී ගැනීමට ද අධ්‍යක්ෂකය දායක වී ඇත.

vii. ලං.රු.මි. 10.38 ක වටිනාකමින් යුත් තීන්ත අමුද්‍රව්‍ය මිලදී ගැනීම.

viii. ලං.රු.මි. 2.08 ක වටිනාකමින් යුත් ලෝහ භාණ්ඩ අමුද්‍රව්‍ය මිලදී ගැනීම.

ix. ලං.රු.මි. 1.90 ක වටිනාකමින් යුත් රෙදි මිලදී ගැනීම.

x. ගෘහස්ථ කණ්ඩායම්, යාන්ත්‍රික හා ඉලෙක්ට්‍රොනික උපාංග හා වෙනත් සැපයුම් වලට අදාළව ලං.රු.මි. 4.00ක වටිනාකමින් යුත් විවිධ මිලදී ගැනීම් සිදු කිරීම.

### (ඇ) අංක 02 බලසෙණයට අයත් ගුවන්යානා ව, තීන්ත ආලේප කිරීම පිළිබඳ තොරතුරු

2018 වර්ෂය තුල අධ්‍යක්ෂක විසින් ගුවන්යානා 06ක මලබැඳිම් අධීක්ෂණ කිරීම හා තීන්ත ආලේප කිරීම සිදු කර ඇත. තවද AN32B වර්ගයේ ගුවන්යානා 04ක මූලික අඩුපාඩු සැකසීම හා තීන්ත ආලේප කිරීම් වල අඩුපාඩු සැකසීම සිදු කර ඇත. ඊට අමතරව, C130 වර්ගයේ ගුවන්යානා 03ක මලබැඳිම් අධීක්ෂණය, මූලික අඩුපාඩු සැකසීම හා තීන්ත ආලේප කිරීම් වල අඩුපාඩු සැකසීම ආදිය සාර්ථකව නිම කර ඇත.

### (ඉ) අංක 06 බලසෙණයට අයත් ගුවන්යානා වල තීන්ත ආලේප කිරීම පිළිබඳ තොරතුරු

2018 වර්ෂය තුලදී අධ්‍යක්ෂකය විසින් MI17 හෙලිකොප්ටර් යානා 02ක් මිනුස්කාහි සාමසාධක මෙහෙයුම් සඳහා පිටත් කර යැවීම සඳහා නැවත තීන්ත ආලේප කිරීම සිදු කර ඇත. තවද, MI17 හෙලිකොප්ටර් යානා 3ක එක්සත් ජාතීන්ගේ සංවිධානය (UN) ලෙස සලකුණු කිරීම සහ තීන්ත ආලේප කිරීම් වල අඩුපාඩු සකස් කිරීම සිදු කර ඇත. එමෙන්ම MI 17 හෙලිකොප්ටර් යානා 02ක UN සලකුණු මකා දැමීම හා තීන්ත ආලේප කිරීම් වල අඩුපාඩු සකස් කිරීමද සිදු කර ඇත. 2018 වර්ෂයේ මැද භාගයේදී ගුවන්හමුදාධිපතිගේ අධීක්ෂණය අරමුණු කරගනිමින් අංක 06 බලසෙනය සතු සියලුම ගොඩබිම් උපකරණ සහ එක් හෙලිකොප්ටර් යානයක තීන්ත ආලේප කර ඇත. ඊට අමතරව, 2018 වර්ෂයේදී පියාසර නොකර ගොඩබිම් රඳවා තිබූ MI17 හෙලිකොප්ටර් යානයක ද තීන්ත ආලේප කිරීම සිදු කර ඇත.

## (ඊ) 2018 වර්ෂය තුල අංක 08 බලසනයට අයත් ගුවන්යානා වල තීන්ත ආලේප කිරීම පිලිබඳ තොරතුරු

2018 වර්ෂය තුලදී අධ්‍යක්ෂකය විසින් Y-12 ගුවන්යානා 02කක පැයෙන් පැය සේවා කිරීම අතරතුර තීන්ත ආලේප කිරීම් වල අඩුපාඩු සකස් කිරීම සිදු කර ඇත

## (උ) 2018 වර්ෂය තුල අංක 10 බලසනයට අයත් ගුවන්යානා වල තීන්ත ආලේප කිරීම පිලිබඳ තොරතුරු

2018 වර්ෂය තුලදී අංක 10 බලසනය විසින් පහත තීන්ත ආලේප කිරීම් වලට සම්බන්ධ ක්‍රියාකාරකම් සිදු කර ඇත. කෙසේ නමුත් අවශ්‍ය කරන තීන්ත අමුද්‍රව්‍ය නොතිබීම හේතුවෙන් 2018 වර්ෂය තුල ගුවන්යානා තීන්ත ආලේප කිරීම (අඩුපාඩු සකස් කිරීම හැර) සිදු කර නොමැත.

i. Kfir ගුවන්යානයේ ඉන්ධන ටැංකි සහ අටලුව
ii. ශ්‍රීලංගුහ සංදර්ශනය සඳහා Kfir ප්‍රදර්ශන ගුවන්යානය
iii. Kfir ගුවන්යානා වල ඉදිරි ප්‍රදේශය, වාරෝධකය සහ විශේෂ සලකුණු
iv. g-27 ගුවන්යානයේ ව්‍යාජ බෝම්බ, බෝම්බ තබන රාක්ක සහ ප්‍රදර්ශන අයිතම
v. Kfir ගුවන්යානයේ ව්‍යාජ බෝම්බ සහ බෝම්බ තබන රාක්ක.
vi. LAL ට්‍රක් රථය (G-4711).
vii. Kfir ගුවන්යානා ඇණියට අදාළ සියලු ගොඩබිම් සහයක උපකරණ
viii. කසල ප්‍රවාහනය කරන ට්‍රේලරය (G-4611).

## (ඌ) 2018 වර්ෂය තුල කටුනායක ශ්‍රීලංගුහ මුලික කඳවුරේ සාමාන්‍ය ඉංජිනේරු පක්ෂාංගය විසින් සිදු කල කාර්යයන් (නිම කරන ලද F-6 කාර්යයන්)

2018 වර්ෂය තුල කටුනායක සාමාන්‍ය ඉංජිනේරු පක්ෂාංගය විසින් ගෘහභාණ්ඩ සකස් කිරීමේ අවශ්‍යතා සහ වාහන වල තීන්ත ආලේප කිරීම ආදියට ගෘහස්ථ විසඳුම් ලබා දී ඇත. F-6 සාමාන්‍ය ඉංජිනේරු වැඩපොළ මඟින් පිලිවෙලින් Tech Wood වැඩ සඳහා ලං.රු.මි. 17.83ක්ද, මතුපිට පෘෂ්ඨයේ තාක්ෂණික වැඩ සඳහා ලංරුමි 5.19ක්ද, පැස්සුම් වැඩ සඳහා ලං.රු.මි. 0.82ක්ද, ලෝහ තහඩු වැඩ සඳහා ලංරුමි 0.43ක්ද, යන්ත්‍ර උපකරණ සවි කිරීම් සහ මෙහෙයුම් වැඩ සඳහා ලං.රු.මි. 0.06ක් ද ඇතුලත්ව මුළු වියදම ලං.රු.මි. 24.33ක් වන පරිදි වැඩ 202ක් සිදු කර ඇති සේම සාමාන්‍ය ඉංජිනේරු පක්ෂාංග වැඩපොලෙහි කාර්යයන් සඳහා වන මුළු වියදමින් ලං.රු.මි. 18.85ක මුදලක් ශ්‍රීලංගුහ මුලික කඳවුරු/කඳවුරු වලට අවශ්‍ය උපකරණ හා ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සඳහා වියදම් දරා ඇති අතර ඊට ලංරුමි 9.86ක වටිනාකමින් වැඩපොළ නිෂ්පාදනය කිරීම, ලං.රු.මි. 3.57 ක වටිනාකමින් කබඩ් නිෂ්පාදනය කිරීම සහ ලං.රු.මි. 1.39 ක වටිනාකමින් මේස නිෂ්පාදනය කිරීම ඇතුලත්ය. තවද, 2018 වර්ෂය තුලදී ශ්‍රීලංගුහ වාහන නවතා තැබීමට අවශ්‍ය ලං.රු.මි. 2.35ක් වටිනා ආවරණ සකස් කිරීම සඳහා ලං.රු.මි. 1.29ක් වටිනා තීන්ත ආලේප කිරීමේ වැඩ අධ්‍යක්ෂකය විසින් සිදු කර ඇත. ඒ අනුව අධ්‍යක්ෂකය විසින් එක් එක් ශ්‍රීලංගුහ මුලික කඳවුරු/කඳවුරු වලදී නිම කරන ලද කාර්යයන් හා ඊට දරන ලද වියදම් පහත පරිදිය.

| අනු අංක | විද්‍යාපීඨය/මූලික කඳවුර/කඳවුර | වියදම(ලංරුමි) |
|---|---|---|
| 1 | ශ්‍රීලංගුභ කඳවුර පලාලි | 0.24 |
| 2 | ශ්‍රීලංගුභ විද්‍යාපීඨය චීනවරාය | 0.78 |
| 3 | ශ්‍රීලංගුභ කඳවුර අම්පාර | 1.02 |
| 4 | ශ්‍රීලංගුභ කඳවුර මඩකලපුව | 0.10 |
| 5 | ශ්‍රීලංගුභ මූලික කඳවුර හිගුරක්ගොඩ | 1.25 |
| 6 | ශ්‍රීලංගුභ මූලික කඳවුර වව්නියාව | 0.27 |
| 7 | ශ්‍රීලංගුභ කඳවුර වන්නි | 0.22 |
| 8 | ශ්‍රීලංගුභ කඳවුර සිගිරිය | 0.13 |
| 9 | ශ්‍රීලංගුභ මූලික කඳවුර අනුරාධපුරය | 0.53 |
| 10 | ශ්‍රීලංගුභ මූලික කඳවුර කටුනායක | 11.80 |
| 11 | ශ්‍රීලංගුභ කඳවුර කටුකුරුන්ද | 0.03 |
| 12 | ශ්‍රීලංගුභ කඳවුර කොග්ගල | 0.61 |
| 13 | ශ්‍රීලංගුභ කඳවුර බජාගු | 0.12 |
| 14 | ශ්‍රීලංගුභ කඳවුර පාලවී | 0.18 |
| 15 | ශ්‍රීලංගුභ කඳවුර ඒකල | 1.16 |
| 16 | ශ්‍රීලංගුභ කඳවුර දියතලාව | 0.03 |
| 17 | ශ්‍රීලංගුභ කඳවුර පිදුරුතලාගල | 0.14 |
| 18 | ශ්‍රීලංගුභ කඳවුර පලාලි | 0.96 |
| 19 | ශ්‍රීලංගුභ විද්‍යාපීඨය චීනවරාය | 0.22 |
| 20 | ශ්‍රීලංගුභ කඳවුර අම්පාර | 3.80 |
| 21 | ශ්‍රීලංගුභ කඳවුර මඩකලපුව | 0.74 |
| එකතුව | | **24.34** |

### (එ) ශ්‍රීලංගුභ මූලික කඳවුරේ සාමාන්‍ය ඉංජිනේරු පක්ෂාංගය විසින් නිම කරන ලද F-4426 කාර්යයන්

ඉහත කාර්යයන්ට අමතරව, සාමාන්‍ය ඉංජිනේරු පක්ෂාංගය විසින් F-4466 කාණ්ඩයට අයත් කාර්යයන් 460ක් සිදු කර ඇත. ඒ අතරින් වායුසමීකරණ පැස්සුම් වැඩ සහ යන්ත්‍ර උපකරණ සවිකිරීම් හා මෙහෙයුම් වැඩ පිලිවෙලින් 139ක් හා 154ක් අධ්‍යක්ෂකය මගින් සිදු කර ඇත. ඊට ගොඩබිම් උපකරණ වැඩ 49ක් සහ Tech Wood වැඩ 39ක් ඇතුලත්ය. තවද, 2018 වර්ෂය තුල තඹ හා ලෝහ තහඩු වැඩ අංශය සහ මතුපිට පෘෂ්ඨයේ තාක්ෂණික වැඩ අංශය පිලිවෙලින් වැඩ 34ක් හා 32ක් සිදු කර ඇති අතර සාමාන්‍ය ඉංජිනේරු පක්ෂාංගයේ යුධ උපකරණ අංශය වැඩ 13ක් සිදු කර ඇත.

## (ඒ) 2018 වර්ෂයේදී කටුනායක ශ්‍රීලංගුහ මූලික කඳවුරේ සාමාන්‍ය ඉංජිනේරු පක්ෂාංගය විසින් නිම කරන ලද ව්‍යාපෘතීන්

2018 වර්ෂය තුල මෙම අධ්‍යක්ෂකය විසින් ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂකය සඳහා යුධ සන්නාහ කට්ටල 750ක් සහ සැපයුම් අධ්‍යක්ෂකය සඳහා පරිඝනක මේස 50ක් නිෂ්පාදනය කිරීමට ඉලක්ක කර ඇත.

කෙසේ නමුදු, අධ්‍යක්ෂකය විසින් වර්ෂය තුලදී ඉලක්ක කරගත් පරිඝනක මේස සංඛ්‍යාව නිෂ්පාදනය කරන ලද අතර යුධ සන්නාහ කට්ටල 350 ක් අඩුවෙන් නිෂ්පාදනය කර ඇත.

## (ඔ) 2018 වර්ෂය තුල අනුරාධපුරය ශ්‍රීලංගුහ මූලික කඳවුරේ සාමාන්‍ය ඉංජිනේරු පක්ෂාංගය විසින් සිදු කල ක්‍රියාකාරකම්.

2018 වර්ෂය තුල අනුරාධපුර සාමාන්‍ය ඉංජිනේරු පක්ෂාංගය විසින් ලං.රු.මි. 4.01ක වියදමින් සාමාන්‍ය ඉංජිනේරු කාර්යයන් වලට අදාළ ප්‍රධාන වැඩ 148ක් සිදු කර ඇත. මෙයට ලං.රු.මි. 1.067ක වටිනාකමින් වාහන ටින්කරින් කිරීම හා තීන්ත ආලේප කිරීම, ලං.රු.මි. 0.77ක වටිනාකමින් විශාල ප්‍රමාණයේ යුධ ඇසුරුම් නිෂ්පාදනය කිරීම, ලංරුමි 0.66 ක වටිනාකමින් ආසන කවර නිෂ්පාදනය කිරීම, ලං.රු.මි. 0.64 ක වටිනාකමින් ගෘහ භාණ්ඩ හා උපකරණ නිෂ්පාදනය කිරීම, ලං.රු.මි. 0.57ක වටිනාකමින් වාහන ආවරණ නිෂ්පාදනය කිරීම සහ ලං.රු.මි. 0.15 ක වටිනාකමින් ගෘහ භාණ්ඩ සඳහා පහසුවෙන් ඉවත් කල හැකි ආකාරයේ කවර නිෂ්පාදනය කිරීම ඇතුලත්ය. ශ්‍රීලංගුහ කඳවුරු/මූලික කඳවුරු වල සිදු කරන ලද සාමාන්‍ය ඉංජිනේරු වැඩ වලට අදාළ වියදම පහත පරිදිය.

| අනු අංක | විද්‍යාපීඨය/මූලික කඳවුර/කඳවුර | වියදම(ලංරුමි) |
|---|---|---|
| 1 | ශ්‍රීලංගුහ කඳවුර පලාලි | 0.04 |
| 2 | ශ්‍රීලංගුහ කඳවුර ඉරණමඩු | 0.19 |
| 3 | ශ්‍රීලංගුහ කඳවුර මුලතිවු | 0.01 |
| 4 | ශ්‍රීලංගුහ කඳවුරමොරවැව | 0.16 |
| 5 | ශ්‍රීලංගුහ විද්‍යාපීඨය චීනවරාය | 0.53 |
| 6 | ශ්‍රීලංගුහ මූලික කඳවුර හිගුරක්ගොඩ | 0.45 |
| 7 | ශ්‍රීලංගුහ මූලික කඳවුර වව්නියාව | 0.05 |
| 8 | ශ්‍රීලංගුහ කඳවුර වන්නි | 0.05 |
| 9 | ශ්‍රීලංගුහ කඳවුර සීගිරිය | 0.20 |
| 10 | ශ්‍රීලංගුහ මූලික කඳවුර අනුරාධපුරය | 1.38 |
| 11 | ශ්‍රීලංගුහ කඳවුර කටුනායක | 0.84 |
| 12 | ශ්‍රීලංගුහ කඳවුර පාලවී | 0.12 |
| එකතුව | | **4.01** |

අනුරාධපුරය ශ්‍රීලංගුහ මූලික කඳවුරේ සාමාන්‍ය ඉංජිනේරු පක්ෂාංගය විසින් නිමකල කාර්යයන් හා විශේෂ ව්‍යාපෘති වල ඡායාරූප.

පෙර



පසු



පෙර



පසු



පෙර



පසු



පෙර



පසු



**(ඕ) 2018 වර්ෂය තුල රත්මලාන ශ්‍රීලංගුහ මුලික කඳවුරේ ගුවන් ඉංජිනේරු සහයක පක්ෂාංගය විසින් සිදු කරන ලද සාමාන්‍ය ඉංජිනේරු ක්‍රියාකාරකම්**

2018 වර්ෂය තුල රත්මලාන ශ්‍රීලංගුහ කඳවුරේ ගුවන් ඉංජිනේරු සහයක පක්ෂාංගය විසින් ලංරුම් 0.82ක වටිනාකමින් යුත් සාමාන්‍ය ඉංජිනේරු ක්‍රියාකාරකම් කිහිපයක් සිදු කර ඇත. රත්මලාන ශ්‍රීලංගුහ කඳවුරේ ඉල්ලීම පරිදි වාහන ආවරණ නිෂ්පාදනය, ගෘහ භාණ්ඩ සඳහා පහසුවෙන් ඉවත් කල හැකි ආකාරයේ කවර නිෂ්පාදනය, ගෘහ භාණ්ඩ හා උපකරණ නිෂ්පාදනය සහ විවිධ ආකාරයේ අයිතම නිෂ්පාදනය මීට ඇතුලත්ය.

**(ඖ) 2018 වර්ෂය තුල සාමාන්‍ය ඉංජිනේරු සුළු ක්‍රියාකාරකම්**

i. ඉහත ක්‍රියාකාරකම් වලට අමතරව, 2018 වර්ෂය තුලදී රත්මලාන ශ්‍රීලංගුහ මුලික කඳවුරේ ගුවන් ඉංජිනේරු සහයක පක්ෂාංගය විසින් සාමාන්‍ය ඉංජිනේරු ගණයට ගැනෙන සුළු කාර්යයන් 97ක් නිම කර ඇත. මීට අංක 61 බලපංතියේ කාර්යයන් 23ක්, ඉංජිනේරු සහයක පක්ෂාංගයේ සහ අංක 08 බලසෙණයේ කාර්යයන් 16 බැගින් සහ හෙලිටුවර්ස්, මෝටර් රථ අංශය සහ අංක 04 බලසෙණයේ පිලිවෙලින් කාර්යයන් 11ක්, 10ක් සහ 07ක් ඇතුලත්ය. තවද, ගුවන්හමුදා කෞතුකාගාරයේ සහ පිහිනුම් තටාකයේ ද කාර්යයන් 4 බැගින් සිදු කර ඇත.

ii. 2018 වර්ෂය තුල, රත්මලාන ශ්‍රීලංගුහ කඳවුරේ ගුවන්යානා ඉංජිනේරු සහයක පක්ෂාංගය විසින් ශ්‍රීලංගුහ වේ පැවති විවිධ උත්සව අවස්ථාවන් ඡායාරූපගත කිරීම් 417ක් සහ වීඩියෝගත කිරීම් 123ක් සිදු කර ඇත.

රත්මලාන ශ්‍රීලංගුහ මූලික කඳවුරේ  ගුවන්යානා ඉංජිනේරු සහයක පක්ෂාංගය විසින් නිම කල කාර්යයන් හා විශේෂ ව්‍යාපෘති වල ඡායාරූප


















ANNUAL
GET-TOGETHER 2018

AIR TATTOO 2018




COLOURS NIGHT
2018



### (ක) 2018 වර්ෂය තුල විශේෂ උත්සව සඳහා සැරසිලි කටයුතු සිදු කිරීම

2018 වර්ෂය තුල, ශ්‍රීලංගුභ විසින් පවත්වන ලද විශේෂ උත්සව ගණනාවක් සඳහා අවශ්‍ය සැරසිලි කටයුතු මෙම අධ්‍යක්ෂකය විසින් සිදු කර දී ඇත. ශ්‍රීලංගුභ 67 වැනි සංවත්සරයේ පිවිසුම් තොරණ සහ අම්පාර ප්‍රදර්ශන කුටිය, ජාතික වෙසක් උත්සවය සඳහා කැරකෙන වෙසක් පහන් කුඩුව, වාර්ෂික ගුවන් සම්මේලනයේ සැරසිලි කටයුතු, වාර්ෂික නත්තල් කැරොල් ගී ප්‍රසංගයේ සැරසිලි කටයුතු ආදිය මීට ඇතුලත්ය.

### (ඛ) 2018 වර්ෂයේ ගොඩබිම් උපකරණ/ ඡායාරූප/වැඩමුළු උපකරණ/ යුධ උපකරණ සඳහා සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂකයේ වැය ශීර්ෂ 2103 යටතට අයත්වන කාර්යසාධන වාර්තාව

2018 වර්ෂය ආරම්භයේදී ප්‍රාග්ධන වියදම් යටතේ ගොඩබිම් උපකරණ, ඡායාරූප, වැඩමුළු උපකරණ, යුධ උපකරණ සඳහා ලං.රු.මි. 41.10 ක මුදලක් අධ්‍යක්ෂකය විසින් වෙන් කර ඇත. වර්ෂය තුල පරිපූරක ප්‍රතිපාදන ලැබී නොමැත. එබැවින් 2018 වර්ෂය අවසානය වන විටත් වර්ෂය සඳහා මුළු වෙන් කිරීම ලං.රු.මි. 41.10ක් ලෙසම පැවතිණි. කෙසේ නමුදු, 2018 වර්ෂය සඳහා වන මුළු වියදම ලං.රු.මි. 40.91ක් ලෙස වාර්තා වූ අතර ලං.රු.මි. 19.44ක් වටිනා භූමි බල සැපයුම් ඒකකයක් මිලදී ගැනීම, භූමි බල සැපයුම් ඒකකය සඳහා රේගු ගාස්තු ලෙස ලං.රු.මි. 5.19ක මුදලක් ගෙවීම, ලං.රු.මි. 4.26ක් වටිනා DSLR කැමරාවක් මිලදී ගැනීම, ලං.රු.මි. 2.41ක් වටිනා වෘත්තීය වීඩියෝ කැමරාවක් මිලදී ගැනීම, ලංරුමි 1.95ක් වටිනා වායු සම්පීඩකයක් මිලදී ගැනීම, ලං.රු.මි. 1.34ක් වටිනා Bell212 හෙලිකොප්ටර් යානා ඇදගෙන යාමේ බාහුවක් අංක 7 බලසනය සඳහා මිලදී ගැනීම සහ ලං.රු.මි. 4.66ක් වටිනා විවිධ මිලදී ගැනීම් ඊට ඇතුලත්ය.

### (ග) 2018 වර්ෂයේ වාහන බාහිර අලුත්වැඩියාව සඳහා සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂකයේ වැය ශීර්ෂ 2003 යටතට අයත්වන කාර්යසාධන වාර්තාව

2018 වර්ෂයේ වාහන බාහිර අලුත්වැඩියාව සඳහා අධ්‍යක්ෂකය විසින් ලං.රු.මි. 100.00 ක මුදලක් ඇස්තමේන්තු කර ඇත. වර්ෂය තුල පරිපූරක ප්‍රතිපාදන ලෙස ලං.රු.මි. 25.00ක මුදලක් ලැබී ඇත. ඒ අනුව මුළු ප්‍රතිපාදන ප්‍රමාණය ලං.රු.මි. 125.00ක් වූ අතර එයින් වාහන බාහිර අලුත්වැඩියාව සඳහා ලං.රු.මි. 124.65ක මුදලක් සත්‍ය ලෙස වියදම් දරා ඇත. සියලුම ගොඩබිම් වාහන වර්ග ඇතුලත් වන පරිදි වාහන 156ක් වර්ෂය තුලදී අලුත්වැඩියා කර ඇත.

(ස) 2018 වර්ෂයේ වව්නියාව ශ්‍රීලංගුභ මූලික කඳවුරේ අංක 02 මෝටර් රථ කාර්මික හා නඩත්තු කිරීමේ පක්ෂාංගයේ කාර්යසාධනය පිළිබඳ තොරතුරු

i. අයිතම අංක 1: G-3536 ටාටා 1210 ට්‍රක් රථය



ii. අයිතම අංක 2: G-5046 අත් ට්‍රැක්ටරය

පෙර



පසු



iii. අයිතම අංක 3: G-4780 Tafe ට්‍රැක්ටරය

පෙර



පසු



iv. අයිතම අංක 4 G-5239 ට්‍රැක්ටර් ටේලරය

පෙර



පසු



v. අයිතම අංක 5 G-4403 හීරෝ හොන්ඩා මෝටර් බයිසිකලය

පෙර



පසු



vi. අයිතම අංක 6 G-5137 අත් ට්‍රැක්ටර් ටේලරය

පෙර



පසු



vii. අයිතම අංක 7 G-2833 Mf 240 ට්‍රැක්ටරය

පෙර



පසු



viii. අයිතම අංක 8 G-3666 L/A/L වතුර බවුසරය

පෙර



පසු



ix. අයිතම අංක 9 G-3628 මිට්සුබිෂි රෝසා බස් රථය

පෙර




පසු



x. අයිතම අංක 10 G-3521 L/A/L ට්‍රක් රථය

පෙර



පසු



xi. අයිතම අංක 11 G-3763 EICHER වතුර L/A/L බවුසරය



xii. අයිතම අංක 13 G-3700 ට්‍රක් රථය



xiii. අයිතම අංක 12 G-3394 ISUZU ඩබල් කැබ් රථය

පෙර



පසු



xiv. අයිතම අංක 14 G-4437 YAMAHA DT 175 මෝටර් බයිසිකලය

පෙර



පසු



xv. අයිතම අංක 15 G- වතුර බවුසර් ට්‍රේලරය

පෙර



පසු



xvi. අයිතම අංක 16 G-5132 Farmers GN 12 අත් ට්‍රැක්ටරය

පෙර



පසු



xvii. G-721 අලුත්වැඩියා කිරීමෙන්






## (5) විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යක්ෂකය

### (අ) හැඳින්වීම

i. ශ්‍රීලංගුහ තුල එලදායි ලෙස විද්‍යුත්, විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණික පහසුකම් සැපයීම හා නඩත්තුව මෙන්ම එම කාර්යයන් පරිපාලනය සඳහා විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යක්ෂකය ස්ථාපිත කරන ලදී.

ii. 2018 වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි අන්තර්ගත වී ඇති විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යක්ෂකයේ සම්පූර්ණ අයවැය ලං.රු.මි. 483.61 කි.ඊට අමතරව පරිපූරක ප්‍රතිපාදන ලෙස ලං.රු.මි. 10,162.99ක මුදලක් අපේක්ෂා කර ඇත. ක්‍රියාකාරී සැලැස්ම මඟින් වර්ෂය සඳහා වූ ඉලක්කයන් සපුරා ගැනීමට අධ්‍යක්ෂකය වෙත ප්‍රක්ෂේපණය කර ඇත. 2018 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මඟින් පුරෝකථනය කල බොහොමයක් ව්‍යපෘති ඉතා සාර්ථක අන්දමින් ක්‍රියාවට නැංවීම හරහා අධ්‍යක්ෂකය ඉතා විශිෂ්ට ලෙස තම කාර්යසාධනය පෙන්නුම් කර ඇත. තවද, ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කර ඇති අතර වර්ෂය අවසානය වන විට ඒවා අවසන් කිරීමට අපේක්ෂිත අතර ව්‍යපෘති සුළු ප්‍රමාණයක් වර්ෂය තුල ආරම්භ කර නොමැත. මේ සම්බන්ධයෙන් තොරතුරු පහත පරිදිය.

### (ආ) 2018 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව තත්‍ය කාර්යසාධනය

i. 2017 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ලද ක්‍රියාකාරකම් සඳහා 2018 වර්ෂය ආරම්භයේදී අධ්‍යක්ෂකය විසින් ලං.රු.මි. 112.10 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණි. මීට පහත ක්‍රියාකාරකම් ඇතුලත්ය.

(i) ගුවන් තාක්ෂණික ශිල්පීය ක්‍රම පද්ධති නඩත්තුව/සේවා කිරීම සඳහා ලං.රු.මි. 53.90 ක් වටිනා ගුවන් ශිල්පීය අමතර කොටස් මිලදී ගැනීම.

(ii) ගුවන් තාක්ෂණික ශිල්පීය ක්‍රම පද්ධති නඩත්තුව/අලුත්වැඩියාව/ සේවා කිරීම සඳහා ලං.රු.මි. 27.60ක් වටිනා ගුවන් ශිල්පීය අමතර කොටස් මිලදී ගැනීම.

(iii) ගුවන් තාක්ෂණික ශිල්පීය ක්‍රම පද්ධති නඩත්තුව/අලුත්වැඩියාව/සේවා කිරීම සඳහා යොදා ගන්න උපකරණ ලං.රු.මි. 25.00ක වටිනාකමින් අලුත්වැඩියා කිරීම.

(iv) ගුවන් තාක්ෂණික ශිල්පීය ක්‍රම පද්ධති නඩත්තුව/අලුත්වැඩියාව/ සේවා කිරීම සඳහා ලං.රු.මි. 5.60 වටිනා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම.

| | | රණවිරු සුභසාධක අරමුදල මඟින් 17304 සැරයන් ශාන්තිලාල් (ක්‍රියාකාරී සේවයේදී මිය ගිය) හට රු .500,000.00 ක පොළී රහිත ණය මුදලක් ලබා දීම |
| | | රණවිරු සුභසාධක අරමුදල මඟින් 13672 කෝප්‍රල් ශ්‍රියානන්ද (ක්‍රියාකාරී සේවයේදී මියගිය) හට රු.499,182.00 ක පොළී රහිත ණය මුදලක් ලබා දීම |
| | | රණවිරු සුභසාධක අරමුදල මඟින් 10569 කෝප්‍රල් ජයලත් (ක්‍රියාකාරී සේවයේදී ආබාධිත) හට රු.300,000.00 ක පොළී රහිත ණය මුදලක් ලබා දීම |
| | | රණවිරු සුභසාධක අරමුදල මඟින් 21724 කෝප්‍රල් අනුර ප්‍රියන්ත (ක්‍රියාකාරී සේවයේදී ආබාධිත) හට රු 500,000.00 ක පොළී රහිත ණය මුදලක් ලබා දීම |
| | | රණවිරු සුභසාධක අරමුදල මඟින් 21783 කෝප්‍රල් අසංක (ක්‍රියාකාරී සේවයේදී මියගිය) හට රු. 300,000.00 ක පොළී රහිත ණය මුදලක් ලබා ගැනීම |
| | | රණවිරු සුභසාධක අරමුදල මඟින් 17688 කෝප්‍රල් දුෂාන්ත (ක්‍රියාකාරී සේවයේදී ආබාධිත) හට රු.100,000.00 ක පොළී රහිත ණය මුදලක් ලබා දීම |
| | | රණවිරු සුභසාධක අරමුදල මඟින් 17681 කෝප්‍රල් රාමනායක (ක්‍රියාකාරී සේවයේදී මියගිය) හට රු.200,000.00 ක පොළී රහිත ණය මුදලක් ලබා දීම |
| | | රණවිරු සුභසාධක අරමුදල මඟින් 011297 කෝප්‍රල් රූපසිංහ (ක්‍රියාකාරී සේවයේදී මියගිය) හට රු.400,000.00 ක පොළී රහිත ණය මුදලක් ලබා දීම |

(ආ) 2018 වර්ෂය තුලදී පහත සඳහන් අමතර ක්‍රියාකාරකම් ද සාර්ථකව නිම කර ඇත.

i පෙර පාසල් ගුරුවරියන් සඳහා වැඩමුළු 04ක් පැවැත්වීම

ii විරුසර වරප්‍රසාද කාඩ්පත් බෙදා හැරීම

iii විශ්‍රාමික සේවා පුද්ගලයින් සඳහා රැකියා බැංකුවක් පවත්වාගෙන යාම

iv ගුවන්හමුදාධිපතිගේ අනුමැතිය මත අවශ්‍යතා සහිත සේවා පුද්ගලයින් සඳහා මුල්‍ය සහනාධාර/ණය පහසුකම් ලබා දීම

v ක්‍රියාකාරී සේවයේදී මියගිය හා ආබාධිත සේවා පුද්ගලයින් සඳහා ත්‍යාග කට්ටල/දින දර්ශන/දින පොත් බෙදා හැරීම

vi පෙරපාසල් ගුරුවරියන් සඳහා සාරි දීමනාව ලබා දීම

## (12) දන්ත වෛද්‍ය සේවා අධ්‍යක්ෂකය

### (අ) හැඳින්වීම

i. රෝග වැලැක්වීමේ හා සුව කිරීමේ අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවක් ලෙස දන්ත වෛද්‍ය සේවය ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සෑම පුද්ගලයෙකුටම පහසුවෙන් හා වෘත්තිමය අයුරින් ලඟා කරගත හැකි විය යුතුය. දන්ත වෛද්‍ය අධ්‍යක්ෂකය විසින් තම සේවාවන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සියලුම ආයතන වලට ව්‍යාප්ත කිරීමට කටයුතු කරන අතර දන්ත වෛද්‍ය සේවාවේ ගුණාත්මක භාවය වර්ධනය කිරීමට නිරන්තරයෙන්ම කටයුතු කරමින් සිටී.

ii. 2018 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව 2018 වර්ෂය සඳහා අධ්‍යක්ෂකයේ මුළු අයවැය ප්‍රමාණය ලං.රු.මි. 21.00 ක් වන අතර එය 2018 වර්ෂයේ අයවැය වෙන්කිරීම් මඟින් මුදල් දැරීමට අපේක්ෂිතය.

### (ආ) 2018 වර්ෂය තුල ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම පහත පරිදිය.

| අනු අංකය | අයිතම | මුදල (ලංරුමි) |
|---|---|---|
| 01 | දන්ත ඒකකය සහ ආසනය | 0.73 |
| 02 | Anatocal Articulator With Adjustable Condyler | 0.45 |
| 03 | Dental Flask Press Hydraulic | 0.14 |
| 04 | Thyrocervical Lead Collar | 0.35 |
| 05 | Dental Lead Apron | 0.55 |
| 06 | cro Motor Laboratory | 0.20 |
| 07 | Dental Endo cro Motor | 0.28 |
| 08 | Dental RVG Unit | 0.83 |
| 09 | Sterilizer Electric | 0.04 |
| එකතුව | | **3.55** |

(13) විනයාරක්ෂක අධ්‍යක්ෂකය

(අ) 2018 වර්ෂයේ කාර්යසාධනය පහත පරිදිය.

i දැනට පවතින ඉල්ලුම සලකා පොලිස් නිලධාරීන් හා කාන්තා පොලිස් නිලධාරිනියන් සඳහා අත් පටි 400ක් ද විනයාරක්ෂක නිලධාරීන් සහ බලලත් නිලධාරීන් සඳහා අත් පටි 100ක් සහ කාන්තා පොලිස් නිලධාරිනියන් සඳහා සුදු පැහැ බඳ පටි 100ක්, Brass Cross Strap 250ක්, Peaked Cap 400ක්, සුදු උර පලඳනා 200ක්, Marshaling Torches 25ක්, පිරික්සුම් පහන් 50ක්, ආපදා පහන් 25ක් සහ Road Cones 100ක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. මෙම සියලු අයිතමයන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර ඇති අතර එම අයිතම කටුනායක සැපයුම් හා නඩත්තු ඩිපෝව වෙත නියමිත පරිදි භාරදී ඇත.

ii මත්ව සිටින පුද්ගලයින් වඩාත් නිවැරදිව හඳුනා ගැනීම සඳහා Alcovisors 02ක් මිලදී ගැනීම

iii. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කරනු ලබන ආරක්ෂක මැදිරි ලේඛන වර්ග 14ක්, එකකින් පිටපත් 250 බැගින් මිලදී ගැනීමට කටයුතු යොදා ඇත.

iv. විනයාරක්ෂක අධ්‍යක්ෂකයට Canon වර්ගයේ අධි කාර්ය ඡායාපිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීම

v. විනයාරක්ෂක පෙරගමන් යතුරුපැදි කණ්ඩායම සඳහා නව නිල ඇඳුම් මැසීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම

vi. 2017 වර්ෂය තුල X Dot Matrix වර්ගයේ මුද්‍රණ යන්ත්‍ර (80 columns, 24 pin, Bi directional) 20ක් මිලදී ගැනීමට අරමුණු කොට ගෙන තිබුනු අතර එයින් යන්ත්‍ර 12ක් 2017 වර්ෂයේදී මිලදී ගෙන ඇත. ඉතිරි යන්ත්‍ර 08, 2018 වර්ෂයේදී මිලදී ගැනීමට තීරණය කර තිබුනද ඊට අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවිණි. එබැවින් Dot Metrix මුද්‍රණ යන්ත්‍ර 08 ක් මිලදී ගැනීමේ අවශ්‍යතාවය 2019 වර්ෂයේදී ඉටු කරගැනීමට නියමිතය.

vii. පොලිස් ඒකක වල භාවිතය සඳහා 2018 වර්ෂයේදී තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂකය හරහා UPS සහිත පරිගණක 08ක් ලබා ගැනීම

(ආ) පොලිස් නිලධාරීන් අනුයුක්ත කරන ලද එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් පිලිබඳ විස්තර පහත පරිදිය.

| අනු අංකය | මෙහෙයුම | පත් කිරීම් සංඛ්‍යාව |
|---|---|---|
| 1. | මධ්‍යම අප්‍රිකානු ජනරජයේ එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම (MINUSCA) | 02 |
| 2. | දකුණු සුඩානයේ එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම (UNMISS) | 02 |

(ඇ) 2018 වර්ෂය තුල සිදු කල කාර්යයන් වල සාරාංශය

| විස්තරය | කාර්යය | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | අධ්‍යක්ෂකය විසින් ආරම්භ කල විමර්ශන | පෙත්සම් මූලික විමර්ශන | හදිසි පරීක්ෂා කිරීම | වාහන පරීක්ෂා කිරීම | F.252 | කැඩෙට් නිලධාරී නිරීක්ෂණ | |
| කාර්යයන් සංඛ්‍යාව | 64 | 68 | 11 | 175 | 113 | 144 | 575 |

(ඈ) මීට අමතරව, 2018 වර්ෂයේදී නිලධාරීන් 08 දෙනෙකුට විනයාරක්ෂක ශාඛාවට පදවි පිරිනැමීම

(ඉ) විනයාරක්ෂක ශාඛාවට කැඩෙට් නිලධාරීන් 04 දෙනෙකු බඳවා ගත් අතර ඔවුන් මේ වන විට දියතලාව ශ්‍රීලංගුහ සටන් පුහුණු පාසලේ මූලික සටන් පුහුණු පාඨමාලාව හදාරමින් සිටි.

## (14) ප්‍රසාංගික කලා අධ්‍යක්ෂකය

(අ) ගුවන්හමුදාධිපතිගේ මඟපෙන්වීම මත 2017 ජුලි 13 දින ප්‍රසාංගික කලා අධ්‍යක්ෂකය ස්ථාපිත කරන ලදී.

(ආ) ගුවන්හමුදාධිපතිගේ මඟපෙන්වීම මත ප්‍රසාංගික කලා අධ්‍යක්ෂකය ස්වාධින ඒකකයක් ලෙස ක්‍රියාත්මක වේ.

(ඇ) 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා තත්‍ය කාර්යසාධනය සැසඳීම

i. 2018 නිදහස් දින පෙළපාලිය සඳහා තූර්යවාදක කණ්ඩායම සහ නර්තන කණ්ඩායම් ලබා දීම

ii. 2018 ගුවන් හමුදා සංදර්ශනය සඳහා තූර්යවාදක කණ්ඩායම සහ නර්තන කණ්ඩායම් ලබා දීම

iii. ගුවන් හමුදා දින සැමරුම් උත්සවය සඳහා තූර්යවාදක කණ්ඩායම් සහ නර්තන කණ්ඩායම ලබා දීම

iv. 2018 විවිධ ආකාරයේ ප්‍රභූ උත්තමාචාර සඳහා ගුවන් හමුදා තූර්යවාදක කණ්ඩායම් ලබා දීම

v. 2018 අවුරුදු උත්සවය සඳහා තූර්යවාදක කණ්ඩායම සහ නර්තන කණ්ඩායම් ලබා දීම

vi. 2018 වෙසක් භක්ති ගීත සංදර්ශනය සඳහා තූර්යවාදක කණ්ඩායම සහ නර්තන කණ්ඩායම ලබා දීම

vii. 2018 පොසොන් පොහෝදින ආගමික උත්සවය සඳහා තූර්යවාදක කණ්ඩායම් සහ නර්තන කණ්ඩායම ලබා දීම

viii. විශිෂ්ටතා සම්මාන උළෙල සඳහා තූර්යවාදක කණ්ඩායම් සහ නර්තන කණ්ඩායම ලබා දීම

ix. 2018 වර්ණ ප්‍රධානෝත්සවය සඳහා තූර්යවාදක කණ්ඩායම් සහ නර්තන කණ්ඩායම ලබා දීම

x. 2018 ශ්‍රීලංකා ගුවන් හමුදා නර්ථන ප්‍රසංගය සඳහා තූර්යවාදක කණ්ඩායම් සහ නර්තන කණ්ඩායම ලබා දීම

xi. 2018 නත්තල් කැරොල් ගී ප්‍රසංගය සඳහා තූර්යවාදක කණ්ඩායම් ලබා දීම

xii. සේවා පුද්ගලයින්ගේ විවාහ මංගල්‍ය උත්සව සඳහා තූර්යවාදක කණ්ඩායම් සහ නර්තන කණ්ඩායම ලබා දීම

xiii. 2018 ආගමික උත්සව සඳහා තූර්යවාදක කණ්ඩායම් ලබා දීම

xiv. 2018 ගුවන්හමුදාධිපතිගේ වාර්ෂික පරීක්ෂණ පෙළපාලි සඳහා තූර්යවාදක කණ්ඩායම් ලබා දීම

xv. 2018 විසිරයාමේ පෙළපාලි සඳහා තූර්යවාදක කණ්ඩායම් ලබා දීම

xvi. 2018 නොයෙකුත් ආකාරයේ සමාරම්භක උළෙල සඳහා තූර්යවාදක කණ්ඩායම් සහ නර්තන කණ්ඩායම ලබා දීම

xvii. 2018 ශ්‍රීලංගුහ හා ජාතික මට්ටමේ ක්‍රීඩා උළෙල සඳහා තූර්යවාදක කණ්ඩායම් සහ නර්තන කණ්ඩායම ලබා දීම

xviii. 2018 උපාධි ප්‍රධානෝත්සව සඳහා තූර්යවාදක කණ්ඩායම් ලබා දීම

xix. 2018 විවිධ රාජ්‍ය උත්සව සඳහා තූර්යවාදක කණ්ඩායම් ලබා දීම

xx. 2018 වාද්‍ය භාණ්ඩ සම්බන්ධ සියලු ප්‍රසම්පාදන කටයුතු හැසිරවීම

xxi. 2018 සියලු වාද්‍ය භාණ්ඩ අලුත්වැඩියා කිරීම

## (15) ගුවන් බුද්ධි අධ්‍යක්ෂකය

### (අ). හැඳින්වීම.

ශ්‍රීලංකා ගුවන් හමුදාවේ සියලුම බුද්ධි තොරතුරු සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා 2017 මැයි 23 දින ගුවන් බුද්ධි අධ්‍යක්ෂකය ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විෂය පථයට ගැනෙන ගුවන් හා නාවික උපායමාර්ගික අණ මධ්‍යස්ථානය සහ ගුවන් නිරීක්ෂණ මෙහෙයුම්, ගොඩබිම් බුද්ධිය, ගෝලීය බුද්ධිය සහ සයිබර් බුද්ධිය ඇතුළු ගුවන් බුද්ධිය කාර්යක්ෂමව හා ඵලදායිව සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂකය වගකියනු ලැබේ.

(ආ) 2018 වර්ෂය තුළ ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම

| විස්තරය | මුදල (රු) |
|---|---|
| External Hard Disk 2TB මිලදී ගැනීම | 96,285.00 |

(ඇ) වර්ෂය තුල කාර්යසාධනය පහත පරිදිය.

i <u>ගුවන් නිරීක්ෂණ මෙහෙයුම්</u> සැකසහිත ගොඩබිම් හා නාවික ක්‍රියාකාරකම්/ස්ථාන 389 ක් පරික්ෂා කිරීම සඳහා වර්ෂය තුල පියාසර පැය 1,002.46ක් යොදාගනිමින් ගුවන් නිරීක්ෂණ මෙහෙයුම් 407ක් සිදු කර ඇත. ඒ අතරින් පරික්ෂා කිරීම් 158 ක්ම නීති විරෝධී ක්‍රියාකාරකම් ලෙස ගොඩබිම් නිරීක්ෂණ මෙහෙයුම් මඟින් තහවුරු කොට ඇත. ගුවන් නිරීක්ෂණ මෙහෙයුම් වලින් බොහොමයක් කංසා වගාවන් සෙවීම අරමුණු කර ගෙන සිදු කොට ඇති අතර වන විනාශය, නීතිවිරෝධී නාවික කටයුතු, නීතිවිරෝධී වැලිගොඩ දැමීම්, නීති විරෝධී කැනීම් හා හෑරීම් සම්බන්ධ නිරීක්ෂණ අනෙකුත් පරික්ෂා කිරීම් වලට අයත්ය. ගුවන් නිරීක්ෂණ මෙහෙයුම් වාර්තා මත පදනම් වෙමින් පර්චස් 9,371ක් වන සමස්ත කංසා වගාබිම් ප්‍රමාණයක් විශේෂ කාර්ය බලකාය විසින් 2018 වර්ෂය තුල වටලා ඇත.

ii. <u>ගොඩබිම් නිරීක්ෂණ මෙහෙයුම්</u> නීති විරෝධි ක්‍රියා සඳහා චෝදනා ලබා අත්අඩංගුවට ගෙන සිටින පුද්ගලයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට සහය ලබා දීම සඳහා ගුවන් බුද්ධි අධ්‍යක්ෂකය යටතේ ක්‍රියාත්මක වන ගොඩබිම් බුද්ධි/ නිරීක්ෂණ මෙහෙයුම් මඟින් ලබා ගන්නා බුද්ධි තොරතුරු දායක කර ගෙන ඇත. මත්ද්‍රව්‍ය ජාවාරම, වන විනාශය, නීතිවිරෝධී ලෙස වැලි ගොඩ දැමීම, නීතිවිරෝධී ලෙස දැව ප්‍රවාහනය සහ යුධ සමයේ වල දමන ලද අවි ආයුධ ගොඩ ගැනීම සම්බන්ධ සිද්ධීන් 90ක් මෙහෙයුම් හරහා අනාවරණය වී ඇත.

iii. <u>මූලික ක්ෂේත්‍ර සහ සයිබර් බුද්ධිය.</u> සයිබර් බුද්ධිය හා මූලික ක්ෂේත්‍ර බුද්ධිය ආදී වෙනත් බුද්ධි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් 2018 වර්ෂය තුල රැස් කරගත් තොරතුරු ගුවන් බුද්ධි කටයුතු සඳහා බෙහෙවින් දායක වී ඇත. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කීර්තිනාමයට හානි කිරීමට උත්සහ දැරූ වැරදිකරුවන් හඳුනා ගැනීමටද සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත.

## (16) මාධ්‍ය අධ්‍යක්ෂකය

(අ) **මාධ්‍ය අධ්‍යක්ෂකය පුළුල් කිරීම.** ගුවන්හමුදාධිපතිගේ මඟ පෙන්වීම යටතේ අධ්‍යක්ෂකය සතු ඉඩ ප්‍රමාණය පුළුල් කිරීම සහ අධ්‍යක්ෂකයේ කාර්යමණ්ඩලය සඳහා යෝග්‍ය පරිසරයක් නිර්මාණය කිරීමට සියලු අංශයන් ප්‍රතිස්ථාපනය කිරීම සිදු කර ඇත.

(ආ) **සියලු තොරතුරු ප්‍රචාරය හා කළමනාකරණය කිරීම** ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිල වෙබ් අඩවියද ඇතුළුව ජන මාධ්‍ය හරහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ බාහිර/අභ්‍යන්තර ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පුවත් 4442ක් 2018 වර්ෂය තුල පළ වී ඇත. මාධ්‍ය අධ්‍යක්ෂකය විසින් 2018 වර්ෂය තුල ආසන්න වශයෙන් පුවත් 32ක් බාහිර මාධ්‍ය ආයතන වෙත සෘජුවම මුදා හැර ඇති අතර සියලුම දේශීය පුවත්පත් නියෝජිත ආයතන විසින් එම පුවත් ඔවුන්ගේ අදාළ ප්‍රකාශන වල පළ කර ඇත.

(ඇ) **ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රතිරූපය ගොඩනැංවීමේ ක්‍රියාකාරකම්** වෙළඳ දැන්වීම් ප්‍රචාරණයට අමතරව පොදු මාධ්‍ය හරහා තම ප්‍රතිරූපය ගොඩනැංවීම සඳහා ශ්‍රීලංකා ගුවන් හමුදාව විසින් සිදු කල ක්‍රියාකාරකම් පහත පරිදිය.

i. විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා මාධ්‍ය ප්‍රචාරයක් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදා මුලස්ථාන/කඳවුරු වල විවිධ වැඩසටහන් 10ක් ආවරණය කිරීම සඳහා මාධ්‍ය අධ්‍යක්ෂකය විසින් සිවිල් මාධ්‍යකරුවන් වෙත ආරාධනා කර ඇත.

ii. සියලු මාධ්‍ය පිරිස් හට අවශ්‍ය සැලකිල්ල ලබා දෙමින් සුහදව පිළිගෙන සංග්‍රහ කිරීම

(ඈ) **ශ්‍රීලංගුහ නිල වෙබ් අඩවිය කළමනාකරණය** ගුවන්හමුදධිපතිගේ සෘජු උපදෙස් මත මාධ්‍ය අධ්‍යක්ෂ විසින් වර්ෂය තුල ගුවන් හමුදා පුවත් 471ක් නිල වෙබ් අඩවියෙහි පළ කර ඇත. පුවත් පළ කිරීමෙහි ඇති ගුණාත්මක ප්‍රතිචාර්යතාව හා සමස්ථ ඵලදායිතාව, ශ්‍රීලංගුහ නිල වෙබ්අඩවිය 2018 වර්ෂයේ ශ්‍රී ලංකාව තුල වඩාත් පිළිගත් රාජ්‍ය වෙබ් අඩවිය ලෙස නම් දැරීමට හේතු විය.

(ඉ) **පියාසර සඟරාව.** 'පියාසර' ත්‍රෛමාසික සඟරාව සැලසුම් කිරීම, තොරතුරු රැස් කිරීම, සංස්කරණය කිරීම, ප්‍රකාශයට පත් කොට අභ්‍යන්තරව හා තෝරාගත් බාහිර ආයතන වෙත බෙදා හැරීම.

i ශ්‍රීලංකා ගුවන් හමුදාව තුල හා තෝරාගත් බාහිර ආයතන වෙත පිටපත් 2000ක් බෙදා හරින ලදී.

(ඊ) **තොරතුරු ප්‍රචාරණය** ඉලෙක්ට්‍රොනික මාධ්‍ය භාවිතා කරමින් ශ්‍රීලංගුහ/ජාතික උත්සව සම්බන්ධ තොරතුරු අභ්‍යන්තරව ප්‍රචාරය කිරීම පහත පරිදිය.

i. මාධ්‍ය අධ්‍යක්ෂකය විසින් www.airforce.lk නිල වෙබ් අඩවිය හරහා පළ කරන සියලුම වෙබ් පුවත් ඊට සමාන්තරව (intraweb.slaf.int) ඉන්ට්‍රා වෙබ් හරහාද ප්‍රචාරය කිරීම

ii. අවශ්‍ය අවස්ථා වලදී වැදගත් තොරතුරු සේවා පුද්ගලයින් හට දැනුම් දීම සඳහා කෙටි පණිවිඩ 347ක් වර්ෂය තුල යැවීම

iii. තොරතුරු බෙදාහැරීමේ පද්ධතියට නව අංගයක් ලෙස වයිබර් මාධ්‍ය හරහා ගුවන් පුවත් සංඥා (Guwan News Aleft) හඳුන්වා දීම

(උ) **සුහදශීලි සබඳතා පවත්වාගෙන යාම** දේශීය හා ජාත්‍යන්තර මාධ්‍ය සමඟ සුහදශීලී සබඳතා පවත්වාගෙන යාම පහත පරිදිය.

i. 2018 වර්ෂය තුල ශ්‍රී ලංකා ගුවන් හමුදාව බාහිර මාධ්‍යයන්ගෙන් කිසිදු ආකාරයේ සෘනාත්මක ප්‍රතිචාරය හෝ විවේචන අත්විඳ නොමැත.

ii. අධ්‍යක්ෂකය විසින් බාහිර මාධ්‍ය ආයතන වෙත ආසන්න වශයෙන් පුවත් 32ක් ලබා දී ඇති අතර ඒ සියල්ලක්ම ඔවුන් විසින් ඔවුන්ගේ අදාළ ප්‍රකාශන වල පළ කර ඇත.

(ඌ) **දේශීය/විශේෂිය මාධ්‍ය අධීක්ෂණය කිරීම** ශ්‍රී ලංකා ගුවන් හමුදාව සම්බන්ධයෙන් වෙබ් අඩවිද ඇතුළුව දේශීය/විදේශීය මාධ්‍ය දරන මතය සම්බන්ධයෙන් මාධ්‍ය අධ්‍යක්ෂකය විසින් අධීක්ෂණය කිරීම

i. මාධ්‍ය අධ්‍යක්ෂකය විසින් සියලුම දේශීය පුවත්පත්, රූපවාහිනී නාලිකා සහ ජාත්‍යන්තර වෙබ් අඩවි දෛනිකව අධීක්ෂණය කරන අතර පවතින මාධ්‍ය නැඹුරුතාවයන් හා අනුකූලතාවයන් පිලිබඳ ගුවන්හමුදාධිපතිව දැනුවත් කරයි.

ii. ශ්‍රී ලංකා ගුවන් හමුදාව හා එහි කාර්යයන් සම්බන්ධයෙන් පළ කර ඇති සියලුම පුවත්, අධ්‍යක්ෂකය විසින් විශ්ලේෂණය කරන අතර ගුවන්හමුදාධිපතිගේ මඟපෙන්වීම යටතේ ඒවාට සුදුසු පරිදි ප්‍රතිචාර දැක්වීම සිදු කරයි.

iii. මාධ්‍ය අධ්‍යක්ෂකය විසින් දෛනික පුවත් පහසුවෙන් අන්තර්ජාලයට එක් කල හැකි පරිදි පරිඝනක දත්ත ගබඩාවක් පවත්වාගෙන යන අතර එමඟින් පහසුවෙන් පුවත් විචාරය කිරීමද සිදු කරයි.

(එ) **නිවේදක කණ්ඩායම සම්බන්ධීකරණය** ශ්‍රීලංගුහ තුල නිවේදක කණ්ඩායම සම්බන්ධීකරණය කිරීම සහ අවශ්‍ය අවස්ථා වලදී නිවේදන කටයුතු සඳහා පත් කිරීම මෙමඟින් සිදු කරන අතර 2018 වර්ෂයේදී ගුවන්හමුදා කඳවුරු වල පැවති වැඩසටහන් 102ක හා ගුවන්හමුදා මුලස්ථානයේ පැවති වැඩසටහන් 67ක නිවේදන කටයුතු සඳහා නිවේදකයින් පත් කිරීම මෙම අධ්‍යක්ෂකය විසින් සිදු කර ඇත

(ඒ) **වීඩියෝ වාර්තා වැඩසටහන් නිෂ්පාදනය** ශ්‍රීලංගුහ වැඩසටහන් සඳහා අවශ්‍ය වූ වීඩියෝ වාර්තාමය වැඩසටහන් හා රූපවාහිනි දැන්වීම් නිෂ්පාදනය පහත පරිදිය.

i. 2018 වර්ෂය තුල ඉතිහාසය පිලිබඳ වාර්තා වැඩසටහන්, එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් පිලිබඳ වාර්තා වැඩසටහන්, ක්‍රීඩා සම්බන්ධ වාර්තා වැඩසටහන්, විශිෂ්ටතා සම්මාන ප්‍රදානය සම්බන්ධ වාර්තා වැඩසටහන් ඇතුළුව වාර්තා වැඩසටහන් 49ක් නිෂ්පාදනය කර ඇත.

ii. බාහිර මාධ්‍ය නියෝජිතයන්ගේද සහයෝගය ඇතිව පළමු ගුවන් නියමුවරිය පිලිබඳ වාර්තා වැඩසටහන් සැකසීම (ඩිජිටල් හා මුද්‍රිත මාධ්‍ය)

iii. ජනාධිපති ලේකම් කාර්යාලය විසින් පවත්වන ලද "මතින් නිදහස් රටක්" වැඩසටහන රූපගත කිරීම

iv. ශ්‍රීලංගුහ එක් එක් වැඩසටහන් හා විශේෂ අවස්ථා සම්බන්ධයෙන් ඡායාරූප එකතුවක් සකස් කිරීම සඳහා මුලික පියවර ගෙන ඇති අතර එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතී.

v. සාමාන්‍ය ජනතාව වෙත ඉක්මනින් ලගා විය හැකි වඩාත් කාර්යක්ෂම හා ඵලදායි මාධ්‍යයක් බවට සමාජ මාධ්‍ය ජාලා පත්ව ඇති බැවින් යුටියුබ්, ෆෙස්බුක් හා අනෙකුත් සමාජ මාධ්‍ය ජාලා වල පළ කල හැකි පරිදි කෙටි වීඩියෝ වාර්තා වැඩසටහන් නිර්මාණය කිරීමේ නව සංකල්පය හඳුන්වා දීමග

**(ඔ) ත්‍රෛමාසික ගුවන්හමුදා දින දර්ශනය සැකසීම** මාධ්‍ය අධ්‍යක්ෂකය විසින් ත්‍රෛමාසික ගුවන් හමුදා දින දර්ශන සහ විශේෂ පොත්පිංච සැකසීම (ගුවන් හමුදා නර්තන සිහිවටන, සේවා වනිතා අරමුදල් රැස් කිරීමේ වැඩසටහන් සිහිවටන ආදිය)

**(ඕ) කැමරාකරණ හා ඡායාරූපකරණ ආවරණය සඳහා සහය**

ශ්‍රීලංකා ගුවන්හමුදාව තුල හා ඉන් පිටත පැවැත්වූ වැඩසටහන් 406ක් සඳහා කැමරාකරණ හා ඡායාරූපකරණ ආවරණය සඳහා සහය ලබා දීම

**(ඖ) ජාතික උත්සව පෙළපාලි වලදී මාධ්‍ය ආවරණය හැසිරවීම**

මාධ්‍ය අධ්‍යක්ෂකය විසින් ප්‍රධාන ජාතික පෙරට්ටු 02ක් කැමරාකරණ හා ඡායාරූපකරණ ආවරණ සහයද සහිතව හසුරුවා ඇත. මෙම අධ්‍යක්ෂකය ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා එක්ව 2018 වර්ෂයේ නිදහස් දිනය හා රණවිරු අනුස්මරණ පෙළපාලි වල විස්තර විචාරය ගෙන ඒම ආරම්භ කර ඇත.

## (17) තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂකය

### (අ) 2018 වර්ෂය තුල තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂකයේ කාර්යසාධනය

i. තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂකය ස්ථාපිත කිරීම

ii. තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ශාඛාව ස්ථාපිත කිරීම

iii. ආරක්ෂක අමාත්‍යංශයේ සයිබර් මෙහෙයුම් මධ්‍යස්ථානය ශ්‍රී ලංකා ගුවන් හමුදා මුලස්ථානය තුල ස්ථාපිත කිරීම

iv. ශ්‍රීලංගුහ විද්‍යාපීඨය චීනවරය, ශ්‍රීලංගුහ මූලික කඳවුර කටුනායක, අනුරාධපුරය, වව්නියාව හා හිඟුරක්ගොඩ සඳහා තොරතුරු තාක්ෂණ අණදීමේ නිලධාරීන් පත් කිරීම

v. ශ්‍රීලංගුහ කොළඹ කඳවුරේ තොරතුරු තාක්ෂණ ඒකකයක් ස්ථාපිත කිරීම

vi. තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂකයේ විගණන හා ක්‍රියාත්මක කිරීමේ ඒකකයක් ස්ථාපිත කිරීම

vii. අසමත්වීම් නිවැරදි කිරීම සඳහා Virtual Server for Cluster Environment 'File Share Witness' (FSW) ස්ථාපිත කිරීම

viii. නිෂ්පාදන පර්ෂද පරිසරයක් ඇති කිරීමට ප්‍රථම ඊට ඇති ශක්‍යතාව විමසීමේ අරමුණින් පර්ෂද පරිසරයක් හඳුන්වා දීම

ix. දත්ත ගබඩා උපස්ථ පරිසරයක් හා දත්ත ධාරිතාව තුලනය කිරීමක් සිදු කිරීමේ අරමුණින් විකල්ප දත්ත ගබඩා සර්වර් හඳුන්වා දීම

x. සියලුම දත්ත ගබඩා සර්වර් (Database Servers) වල උපස්ථ ක්‍රියාවලිය (Backup Procedure) තහවුරු කිරීම සඳහා දැනුම්දීමේ පද්ධතියක් (Notification System) ඇති කිරීම

xi. ආපදා ප්‍රතිසාධන ඒකක වල Cluster Environment හි අක්‍රමිකතා ප්‍රතිසාධනය කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දීම

xii. ගුවන් හමුදා මුලස්ථානයේ සර්වර් කාමරයට රැක් සර්වර් 02ක් සවි කිරීම

xiii. ශ්‍රීලංගුහ මුලස්ථාන/කඳවුරු සඳහා Manageable switches 08ක් සවි කිරීම

xiv. සියලු ඩයලොග් WiMax අන්තර්ජාල සබඳතා ඩයලොග් 4G වලට මාරු කිරීම

xv. ගුවන් හමුදා දත්ත මධ්‍යස්ථානයේ ආරක්ෂක විගණනය අවසන් කිරීම

xvi. සයිබර් මෙහෙයුම් මධ්‍යස්ථානයේ සිද්ධි කළමනාකරණය සහ ප්‍රතිචාර පද්ධතිය වැඩි දියුණු කිරීම

xvii. 2018 වර්ෂය තුල පද්ධති හා සයිබර් ආරක්ෂණ මාසික විගණන පැවැත්වීම

xviii. පරිඝනක තාක්ෂණ ශිල්පීන් සඳහා දැනුවත් කිරීමේ හා මයික්‍රොසොෆ්ට් කාර්යාල යෙදවුම් පාඨමාලා 168ක් පවත්වා අවසන් කිරීම.

xix. පරිඝනක තාක්ෂණ ශිල්පීන් සඳහා සයිබර් ආරක්ෂාව පිලිබඳ දැනුවත් කිරීමේ පාඨමාලා 02ක් පවත්වා අවසන් කිරීම

xx. පරිඝනක තාක්ෂණික ශිල්පීන් සඳහා වන උසස් වෘත්තීය පුහුණු පාඨමාලාව අවසන් කිරීම

xxi. පරිඝනක තාක්ෂණික ශිල්පීන් සඳහා වන මූලික වෘත්තීය පුහුණු පාඨමාලාවන් 02ක් අවසන් කිරීම

xxii. පරිඝනක තාක්ෂණ ශිල්පීන් ලෙස ගුවන්භටයින් සහ කාන්තා ගුවන් 47 දෙනෙකු බඳවා ගැනීම.

xxiii. වෙනත් වෘත්තීන් වල නියැලුණු ගුවන්භටයින් 18 දෙනෙකු පරිඝනක තාක්ෂණ ශිල්පීන් ලෙස නැවත එක් කර ගැනීම

### (ආ) මෘදුකාංග සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම

i. බීමහල් වල බිල්පත් නිකුත් කිරීමේ පද්ධතිය (ණය පදනම මත හා ක්‍රෙඩිට් කාඩ් හරහා ගෙවීම් සිදු කිරීම මත මත්පැන් හා අනෙකුත් බිම වර්ග පරිභෝජනය කිරීමට මෙම පද්ධතිය පහසුකම් සපයයි)

ii. වෛද්‍ය කළමනාකරණ පද්ධතිය (වෛද්‍යවරුන්, රෝගීන්, ඖෂධාගාර වැනි විවිධ වූ ආකාරයන්ගෙන් රෝහල් වෛද්‍ය කළමනාකරණය පාලනය කිරීම සඳහා මෙය පූර්ණ විසඳුමකි)

iii. වැඩසටහන් ප්‍රේක්ෂක ප්‍රතිචාර පද්ධතිය (වැඩසටහන්/උත්සව සඳහා ඇතුල්වීමේ අවසරය ලබාදීමට හා වැඩසටහන පුරාවට පැමිණ සිටින පිරිස හඳුනා ගැනීමට මෙම යෙදවුම පහසුකම් සපයයි)

iv. ඇමතුම් හුවමාරු සටහන් කරගැනීමේ පද්ධතිය (ඇමතුම ලබා දෙන්නා කවුරුන්ද යන්න හඳුනාගැනීම සඳහා මෙම පද්ධතිය පහසුකම් සපයයි)

v. ඉංග්‍රීසි භාෂා පුහුණු පද්ධතිය (ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ).

vi. නිලධාරීන්ගේ/විශ්‍රාමික නිලධාරීන්ගේ නිවාඩු නිකේතන වෙන් කරවා ගැනීමේ පද්ධතිය (නිලධාරීන්ගේ/විශ්‍රාමික නිලධාරීන්ගේ නිවාඩු නිකේතන කලින් වෙන් කරවා ගැනීම සඳහා මෙම පද්ධතිය පහසුකම් සපයයි)

vii. තොරතුරු තාක්ෂණ විගණන කළමනාකරණ පද්ධතිය (කාලසටහනකට අනුව සිදු කල යුතු කාර්යයන් වෙන් කිරීම හා විගණන කළමනාකරණය සඳහා මෙම පද්ධතිය පහසුකම් සපයයි)

viii. සාමාන්‍ය පුහුණු කළමනාකරණ පද්ධතිය (සාමාන්‍ය සේවා පුහුණු/සාමාන්‍ය අඛණ්ඩ පුහුණු/ශාරීරික පුහුණු සඳහා සේවා පුද්ගලයින්ගේ පැමිණීම කළමනාකරණය සඳහා මෙම පද්ධතිය පහසුකම් සපයයි)

ix. සුභසාධක කළමනාකරණ පද්ධතිය (සේවා පුද්ගලයින්ට අදාළ සුභසාධක කරුණු සම්බන්ධයෙන් වන තොරතුරු කළමනාකරණය සඳහා මෙම පද්ධතිය පහසුකම් සපයයි)

x. විදේශ පුහුණු කළමනාකරණ පද්ධතිය (පුහුණුවීම් වලට අදාලව සේවා පුද්ගලයින්ගේ තොරතුරු කළමනාකරණය සඳහා මෙම පද්ධතිය පහසුකම් සපයයි)

xi. පුර්ව උසස්වීම් මණ්ඩලය යෙදවුම (සේවා පුද්ගලයින්ගේ තොරතුරු පරික්ෂා කිරීම සඳහා මෙම පද්ධතිය පහසුකම් සපයයි)

xii. පෞද්ගලික තොරතුරු වාර්තා කිරීමේ පද්ධතිය (නිවාඩු, කඳවුර තුල වාසය කිරීම්/කඳවුරෙන් පිටත වාසය කිරීම්/ ගෙවල් කුලී ආදිය පිලිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා මෙම පද්ධතිය පහසුකම් සපයයි)

xiii. දුරකථන නාමාවලි යෙදවුම (ජංගම යෙදවුමක් මඟින් අවශ්‍ය දුරකථන අංක ලබා ගැනීම සඳහා මෙම යෙදවුම් පහසුකම් සපයයි)

xiv. වෙබ් අඩවි සංවර්ධනය (ගුවන් බාලදක්ෂ වෙබ් අඩවිය, ගුවන්හමුදාධිපති කුසලාන වෙබ් අඩවිය, ගුවන් සම්මේලන වෙබ් අඩවිය)

(ඇ) 2018 වර්ෂයේ තොරතුරු තාක්ෂණ උපකරණ, පද්ධති සහ සයිබර් ආරක්ෂාව සම්බන්ධ විගණනයන්.

| අනු අංකය | ස්ථානය | විගණනය සිදු කල දිනය |
|---|---|---|
| 1 | ශ්‍රීලංගුහ කඳවුර බජාගු | 2018 පෙබරවාරි |
| 2 | ශ්‍රීලංගුහ කඳවුර මොරවැව | 2018 පෙබරවාරි |
| 3 | ශ්‍රීලංගුහ විද්‍යාපීඨය චීන වරාය | 2018 අප්‍රේල් |
| 4 | ශ්‍රීලංගුහ මුලික කඳවුර හිඟුරක්ගොඩ | 2018 මැයි |
| 5 | ශ්‍රීලංගුහ කඳවුර සිගිරිය | 2018 මැයි |
| 6 | ශ්‍රීලංගුහ මුලික කඳවුර වව්නියාව | 2018 මැයි |
| 7 | ශ්‍රීලංගුහ රෙජිමේන්තු පුහුණු පාසල වන්නි | 2018 මැයි |
| 8 | ශ්‍රීලංගුහ මුලික කඳවුර අනුරාධපුරය | 2018 ජුනි |
| 9 | ශ්‍රීලංගුහ මුලික කඳවුර කටුනායක | 2018 ජුනි |
| 10 | ශ්‍රීලංගුහ කඳවුර කටුකුරුන්ද | 2018 ජුනි |
| 11 | ශ්‍රීලංගුහ කඳවුර කොග්ගල | 2018 ජුනි |
| 12 | ශ්‍රීලංගුහ වෘත්තීය පුහුණු පාසල ඒකල | 2018 අගෝස්තු |
| 13 | ශ්‍රීලංගුහ කඳවුර පාලවී | 2018 අගෝස්තු |
| 14 | ශ්‍රීලංගුහ මුලික කඳවුර රත්මලාන | 2018 සැප්තැම්බර් |
| 15 | ශ්‍රීලංගුහ කඳවුර මීරිගම | 2018 සැප්තැම්බර් |
| 16 | ශ්‍රීලංගුහ කඳවුර වීරවිල | 2018 ඔක්තෝබර් |
| 17 | ශ්‍රීලංගුහ කඳවුර දියතලාව | 2018 ඔක්තෝබර් |
| 18 | ශ්‍රීලංගුහ කඳවුර පිදුරුතලාගල | 2018 ඔක්තෝබර් |
| 19 | ශ්‍රීලංගුහ කඳවුර පලාලි | 2018 නොවැම්බර් |
| 20 | ශ්‍රීලංගුහ කඳවුර ඉරණමඩු | 2018 නොවැම්බර් |
| 21 | ශ්‍රීලංගුහ කඳවුර මුලතිව් | 2018 නොවැම්බර් |
| 22 | ශ්‍රීලංගුහ විද්‍යාපීඨය චීනවරාය | 2018 දෙසැම්බර් |
| 23 | ශ්‍රීලංගුහ කඳවුර මොරවැව | 2018 දෙසැම්බර් |
| 24 | ශ්‍රීලංගුහ කඳවුර අම්පාර | 2018 දෙසැම්බර් |
| 25 | ශ්‍රීලංගුහ කඳවුර මඩකලපුව | 2018 දෙසැම්බර් |

## (ඇ) 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව තත්‍ය කාර්යසාධනය

පහත සඳහන් ක්‍රියාකාරකම් 2018 වර්ෂය තුලදී සාර්ථකව නිම කර ඇත.

| අනු අංකය | ක්‍රියාකාරකම් | මුදල(ලංරුමි) |
|---|---|---|
| 1 | රිබන්,ටෝනර්,කාට්‍රිජ් සහ ජාලකරණය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම | 13.50<br>0.57 |
| 2 | මයික්‍රොසොෆ්ට් වින්ඩෝස් යෙදවුම හා සර්වර් මෘදුකාංග යාවත්කාලීන කිරීම | 6.12 |
| 3 | Firewall සහ Load Balancing පද්ධති යාවත්කාලීන කිරීම | 6.65 |
| 4 | virus guard යාවත්කාලීන කිරීම් මිලදී ගැනීම | 0.38 |
| 5 | සයිබර් ආරක්ෂණ අධීක්ෂණ මෙවලම් හා බලපත්‍ර මිලදී ගැනීම | 0.26 |
| 6 | අමතර කොටස් මිලදී ගැනීම | 4.26 |
| 7 | ජාලකරණ අමතර කොටස් මිලදී ගැනීම | 2.80 |
| 8 | අවම වටිනාකමක් සහිත අමතර කොටස් මිලදී ගැනීම | 8.26 |
| 9 | ශ්‍රීලංගුභ දත්ත ජාලකරණ සහ තොරතුරු තාක්ෂණ උපකරණ අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම | 0.29 |
| 10 | දත්ත ගබඩා මිලදී ගැනීම හා සවි කිරීම | 6.84 |
| 11 | තොරතුරු පර්යන්ත මිලදී ගැනීම හා සවි කිරීම | 2.48 |
| 12 | අලුත්වැඩියා කල නොහැකි තත්වයේ පවතින උපකරණ වෙනුවට හා නව අවශ්‍යතාවයන් සඳහා තොරතුරු තාක්ෂණ උපකරණ මිලදී ගැනීම | 25.13 |
| 13 | 2018 වර්ෂය සඳහා වන නඩත්තු හා සේවා ගිවිසුම | 2.35 |

(ඉ) 2018 වර්ෂය තුළ නිම කරන ලද ක්‍රියාකාරී සැලැස්ම මඟින් පුරෝකථනය නොකළ ක්‍රියාකාරකම්

| අනු අංකය | ක්‍රියාකාරකම් | මුදල (ලංරු.මි) |
|---|---|---|
| 1 | මෘදුකාංග මිලදී ගැනීම සහ බලපත්‍ර යාවත්කාලීන කිරීම | 1.21 |
| 2 | අමතර කොටස් මිලදී ගැනීම | 2.22 |
| 3 | සයිබර් ආරක්ෂණ අධීක්ෂණ මෙවලම් මිලදී ගැනීම | 4.57 |
| 4 | හැඳුනුම්පත් මුද්‍රණය කිරීමේ හා කියවීමේ යන්ත්‍ර (Reader) මිලදී ගැනීම | 3.86 |
| 5 | අකුණු ආරක්ෂණ පද්ධති සවි කිරීම | 1.69 |

(ඊ) 2018 වර්ෂය සඳහා වන ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් පහත පරිදිය

| විස්තරය | වෙන්කිරීම (ලංරු.මි) | පරිපූරක (ලංරු.මි) | තත්‍ය වියදම (ලංරු.මි) |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 40.00 | | 40.00 |
| අමතර කොටස් | 24.01 | 6.81 | 30.82 |
| RPC/SVP | 8.34 | | 8.26 |
| අලුත්වැඩියා | 0.30 | | 0.30 |
| පාරිභෝජ්‍ය ද්‍රව්‍ය | 13.50 | 0.57 | 14.07 |
| එකතුව | **86.15** | **7.38** | **93.45** |

(උ) 2018 වර්ෂය තුළ මෘදුකාංග ලබා ගැනීම්

| විස්තරය | ප්‍රමාණය | වටිනාකම (ලංරු.මි) |
|---|---|---|
| Acunetix WVS | 1 | 2.36 |
| Hak5 Field Kit | 1 | 0.81 |
| Metasploit Pro | 1 | 5.16 |
| crosoft Visual Studio Enterprise 2017 With MSDN | 1 | 1.21 |

## (ඌ) 2018 වර්ෂය තුල සිදු කල අලුත්වැඩියාවන් හා සේවා කිරීම්

| අලුත්වැඩියා ව්‍යාපෘතිය | දරන ලද වියදම (රු) |
|---|---|
| හැඳුනුම්පත් SD 360 මුද්‍රණ යන්ත්‍රය අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම | 97,175.00 |
| හැඳුනුම්පත් මුද්‍රණයන්ත්‍රය සහ Data Card CD800 With Inline Lanation අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම | 97,548.75 |
| ශ්‍රීලංගුහ දත්ත ජාලකරණය අලුත්වැඩියා කිරීම | 81,000.00 |

## (එ) 2018 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද තොරතුරු තාක්ෂණය සම්බන්ධ ප්‍රධාන ව්‍යාපෘතීන්

i. 2018 වර්ෂයේ පෙබරවාරි මස ආරක්ෂක අමාත්‍යාංශයේ සයිබර් මෙහෙයුම් මධ්‍යස්ථානය ශ්‍රී ලංකා ගුවන්හමුදා මුලස්ථාන පරිශ්‍රයේදී ස්ථාපිත කිරීම



ii. 2018 වර්ෂයේ අගෝස්තු මස තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂය ස්ථාපිත කිරීමග



iii. 2018 වර්ෂයේ සැප්තැම්බර් මස කොළඹ ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරේ තොරතුරු තාක්ෂණ අංශය ස්ථාපිත කිරීම.



iv. 2018 වර්ෂයේ ජනවාරි මස දත්ත ගබඩා කිරීමේ ධාරිතාවය පුළුල් කිරීම



v. 2018 වර්ෂයේ ජනවාරි මස ස්වයංක්‍රිය පද්ධති පුළුල් කිරීම සඳහා තොරතුරු තාක්ෂණික උපකරණ හා පරිඝනක මිලදී ගැනීම.

vi. 2018 වර්ෂයේ ඔක්තෝබර් මස ශ්‍රීලංගුහ මුලස්ථාන/කඳවුරු වලට තොරතුරු පර්යන්ත (Information Ternals) හඳුන්වා දීම.

vii. 2018 වර්ෂයේ අප්‍රේල් මස ශ්‍රීලංගුහ හැඳුනුම්පත් සඳහා ආරක්ෂිත සුහුරු කාඩ් පද්ධතිය හඳුන්වා දීම (SLAF:F. 1250).



viii. 2018 වර්ෂයේ දෙසැම්බර් මස ශ්‍රීලංගුහ සිවිල් සේවකයින් සඳහා ආරක්ෂිත සුහුරු හැඳුනුම්පත් හඳුන්වා දීම




ix. 2018 වර්ෂයේ ජනවාරි මස රත්මලාන ශ්‍රීලංගුහ මුලික කඳවුරේ තොරතුරු තාක්ෂණ පක්ෂාංගයේ හා ප්‍රධාන තොරතුරු තාක්ෂණ ඒකක වල අකුණු සන්නායක සහ භූගත කිරීම් පද්ධති සවි කිරීම



x. 2018 වර්ෂයේ ඔක්තෝබර් මස ශ්‍රීලංගුහ දත්ත සබඳතාවයන් පුළුල් කිරීම



## (ඒ) 2018 වර්ෂය තුල මෘදුකාංග සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම

i. 2018 මාර්තු මස සුහසාධක කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම

ii. 2018 අප්‍රේල් මස විදේශ පුහුණු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම

iii. 2018 ජුනි මස සාමාන්‍ය පුහුණු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම

iv. 2018 අගෝස්තු මස නිලධාරීන්ගේ/විශ්‍රාමික නිලධාරීන්ගේ නිවාඩු නිකේතන වෙන් කරවා ගැනීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම

v. 2018 අගෝස්තු මස වෙබ් අඩවි සංවර්ධනය (ගුවන් බාලදක්ෂ වෙබ් අඩවිය, ගුවන්හමුදාධිපති කුසලාන වෙබ් අඩවිය,ගුවන් සම්මේලන වෙබ්අඩවිය)

vi. 2018 සැප්තැම්බර් මස Pre Promotion Board යෙදවුම ක්‍රියාත්මක කිරීම

vii. 2018 සැප්තැම්බර් මස ඉංග්‍රීසි භාෂා පුහුණු පද්ධතිය ක්‍රියාත්මක කිරීම

viii. ඔක්තෝබර් මස තොරතුරු තාක්ෂණ විගණන කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම

ix. 2018 ඔක්තෝබර් මස පෞද්ගලික තොරතුරු වාර්තා කිරීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම

x. 2018 නොවැම්බර් මස දුරකථන නාමාවලි යෙදවුම ක්‍රියාත්මක කිරීම

xi. 2018 නොවැම්බර් මස වැඩසටහන් ප්‍රේක්ෂක ප්‍රතිචාර පද්ධතිය ක්‍රියාත්මක කිරීම

xii. 2018 දෙසැම්බර් මස බීම හල් වල බිල්පත් නිකුත් කිරීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම

xiii. 2018 දෙසැම්බර් මස වෛද්‍ය කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම

(18) ක්‍රීඩා අධ්‍යක්ෂකය

(අ) 2018 වර්ෂය තුල ශාරීරික අභ්‍යාස පුහුණුකරුවන් විසින් හදාරන ලද පාඨමාලාවන්

| අනු අංකය | පාඨමාලාවේ නම | ආයතනය | කාලසීමාව | පත් කිරීම් | පාඨමාලා ගාස්තු (රු) |
|---|---|---|---|---|---|
| 1 | ක්‍රීඩා පිළිබඳ ඩිප්ලෝමාව | ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය | අවු 01 | 02 | 60, 000.00 |
| 2 | ශරීර ශක්තිය හා ස්වභාවය පිලිබඳ ඩිප්ලෝමාව | ශ්‍රී ලංකා පදනම් ආයතනය | අවු 01 මාස 06 | 02 | 66 ,500.00 |
| 3 | ශරීර සුවතා පුහුණුකරුවන් සඳහා සහතිකපත්‍ර පාඨමාලාව | ශ්‍රී ලංකා පදනම් ආයතනය | මාස 04 | 10 | 16 ,000.00 |
| 4 | ක්‍රීඩා සම්බාහකයින් හා භෞතික චිකිත්සක සහායකවරුන් සඳහා සහතිකපත්‍ර පාඨමාලාව | ශ්‍රී ලංකා පදනම් ආයතනය | මාස 7 1/2 | 06 | 80 ,500.00 |
| 5 | තුවාල කළමනාකරණය පිලිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය | මාස 03 | 10 | 15 000.00 |
| 6 | ගොඩබිම් පුහුණු උපදේශක පාඨමාලාව- ඉන්දියාව | ශාරීරික යෝග්‍යතාව පිලිබඳ ගුවන් හමුදා පාසල | අවු 01 | 01 | - |
| 7 | උසස් වෘත්තිය පුහුණු පාසල- බංග්ලාදේශය | බංග්ලාදේශ ගුවන් හමුදාව- සුහුරුල්ලාහ් | මාස 08 | 01 | - |

(ආ) උපයෝගී කරගත් ක්‍රීඩා අයිතම වැය ශීර්ෂ

| අනු අංකය | විස්තරය | ප්‍රමාණය | මුළු මුදල |
|---|---|---|---|
| 01 | චෙස් පුවරු | 15 | 26,250.00 |
| 02 | Weight Bar | 3 | 67,800.00 |
| 03 | අන්තර් ඒකක පදක්කම් | 891 | 512,325.00 |
| 04 | බැඩ්මින්ටන් ෂටල | 326 | 118,990.00 |
| එකතුව | | | **725,365.00** |

(ඇ) උපයෝගී කරගත් ක්‍රීඩා උපකරණ වැය ශීර්ෂ

| අනු අංකය | විස්තරය | ප්‍රමාණය | මුළු මුදල |
|---|---|---|---|
| 01 | Shoulder Wheel | 1 | 151,000.00 |
| 02 | Machine Rowing | 1 | 320,000.00 |
| 03 | Treadll Machine | 5 | 1,975,000.00 |
| 04 | Mini Cable Cross Over | 1 | 320,000.00 |
| 05 | Multy Gym Mashine | 3 | 1,149,600.00 |
| එකතුව | | | **3,915,600.00** |
| මුළු එකතුව | | | **4,640,965.00** |

## (19) මුදල් අධ්‍යක්ෂකය

හැඳින්වීම    මෙම අධ්‍යක්ෂකය විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය ක්‍රියාකාරකම් රාජ්‍ය භාණ්ඩාගාරය හා සම්බන්ධ වෙමින් කළමනාකරණය කිරීම කරනු ලබයි. අයවැය ගත සියලුම වියදම් සඳහා පවතින ද්‍රවශීලතාවය තහවුරු කර ගැනීම හා අදාළ වියදම් සිදු කරන ආකාරය පිලිබඳ උපදෙස් ලබා දීම මෙම අධ්‍යක්ෂකය මගින් සිදු කෙරේ.

## (20) සිවිල් පරිපාලන අධ්‍යක්ෂකය

හැඳින්වීම    විවිධ අධ්‍යක්ෂකයන් යටතට ගැනෙන විවිධ සේවාවන් ඉටු කිරීම සඳහා අවශ්‍ය සිවිල් සේවකයින් ලබා දීම සිවිල් පරිපාලන අධ්‍යක්ෂකය විසින් සිදු කරනු ලබයි. කාර්යක්ෂම පරිපාලනයක් සඳහා සහ සිවිල් සේවකයින්ගේ විනය පාලනය සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා ද මෙම අධ්‍යක්ෂකය ගුවන්හමුදාධිපතිට වග කියනු ලබයි.

## (21) අයවැය අධ්‍යක්ෂකය

| විස්තරය | වෙන් කිරීම (ලංරුමි) | මුරෙ 66 ප්‍රකාරව මාරු කිරීම් (ලංරුමි) | මුරෙ 66 ප්‍රකාරව පිටතට මාරුකිරීම් (ලංරුමි) | අතිරේක ප්‍රතිපාදන (ලංරුමි) | මුළු ප්‍රතිපාදන (ලංරුමි) | සත්‍ය වියදම (ලංරුමි) |
|---|---|---|---|---|---|---|
| මුළු වියදම | 43,200.44 | 1,517.80 | 1,517.80 | 627.40 | 43,827.84 | 41,281.86 |
| පුනරාවර්තන වියදම | 36,512.60 | 1,447.80 | 791.00 | - | 35,855.80 | 34,624.00 |
| ප්‍රාග්ධන වියදම | 6,687.84 | 70.00 | 726.80 | 627.40 | 7,972.04 | 6,857.86 |

## (22) විධායක බඳවා ගැනීමේ අංශය

### (අ) හැඳින්වීම

i. බඳවා ගැනීම් සිදු කිරීම විධායක බඳවා ගැනීමේ නිලධාරියාගේ වගකීම වේ. බඳවා ගැනීමේ අංශයෙහි කාර්යභාරය වන්නේ ගුවන්හමුදාපතිවරයාගේ අණ පරිදි ශ්‍රී ලංකා ගුවන් හමුදා නිත්‍ය/ස්වේච්ඡා සේවයන්ට නිලධාරී, කාන්තා නිලධාරිනියන්, ගුවන්භට, ගුවන්කාන්තා යන පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමයි. ගැසට් නිවේදන, පුවත්පත්/ රූපවාහිනී දැන්වීම් සහ විශේෂ බඳවා ගැනීම් ප්‍රවාහයන් හරහා මෙම අරමුණ ඉටු කර ගනු ලැබේ.

ii. බඳවා ගැනීම් සිදු කිරීම විධායක බඳවා ගැනීමේ නිලධාරියාගේ 2018 වර්ෂය ශ්‍රී ලංකා ගුවන් හමුදාව පුද්ගලයින් 1,651 දෙනෙකු බඳවා ගෙන ඇති අතර ඉන් 169 දෙනෙකු නිලධාරීන් ලෙස හා 1,482 දෙනෙකු සෙසු නිලයන් සඳහා බඳවාගෙන ඇත. නිලධාරීන් බඳවා ගැනීම ඉඳුරාම බඳවාගත් වෘත්තිමය නිලධාරීන්, කැඩෙට් නිලධාරීන් හා කොතලාවල ආරක්ෂක පීඨයේ කැඩෙට් නිලධාරීන් ලෙස වර්ග 3ක් යටතේ සහ සෙසු නිලයන් ඉඳුරාම බඳවා ගැනීම් හා සාමාන්‍ය බඳවා ගැනීම් ලෙස වර්ග 2ක් යටතේ බඳවා ගෙන ඇත. ඒ පිලිබඳ විස්තර පහත දැක්වේ.

(ආ) වර්ෂය තුල බඳවා ගැනීම් පහත පරිදිය.

| බඳවා ගැනීම් වර්ගය | | සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|
| | | නිත්‍ය | ස්වේච්ඡා | එකතුව | මුළු එකතුව |
| නිලධාරීන් | ඉඳුරාම බඳවාගත් නිලධාරීන් | 15 | 03 | 18 | **169** |
| | ශ්‍රීලංගුභ කැඩෙට් නිලධාරීන් | 95 | - | 95 | |
| | ශ්‍රීලංගුභ කාන්තා නිලධාරී කැඩෙට් | 30 | - | 30 | |
| | KDU කැඩෙට් | 20 | - | 20 | |
| | KDU කාන්තා කැඩෙට් | 06 | - | 06 | |
| | | | | | |
| ගුවන්භට/ගුවන් කාන්තා | ගුවන්භටයින් | 930 | 68 | 998 | **1,482** |
| | ගුවන් කාන්තා | 396 | 43 | 439 | |
| | ඉඳුරාම බඳවාගත් ගුවන්භටයින් | 45 | -- | 45 | |
| | ඉඳුරාමබඳවාගත් කාන්තා ගුවන් | | | | |

## (23) විධායක ගුවන් ආරක්ෂණ පරීක්ෂණ අංශය (CFSI)

### (අ) හැඳින්වීම

i. විධායක ගුවන් ආරක්ෂණ පරීක්ෂණ අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරන විධායක ගුවන් ආරක්ෂණ පරීක්ෂණ නිලධාරියා විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් ආරක්ෂණ සංවිධානයේ ද මූලසුන හොබවන අතර එම විෂය පථය යටතට ගැනෙන සියලුම කාර්යයන් සඳහා ඔහු ගුවන්හමුදාධිපතිට වග කියනු ලබයි. ගුවන් ආරක්ෂණය සඳහා වන පියාසර කිරීම් හා ඉංජිනේරු කටයුතු හැසිරවීම් සඳහා මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකු සිටිය යුතුය.

ii. පියාසර කිරීම්, ඉංජිනේරු හා වෛද්‍ය ශාඛා නියෝජනය කරමින් ප්‍රධාන ගුවන් ආරක්ෂණ පරීක්ෂණ නිලධාරීන් තිදෙනෙකු සිටිය යුතු අතර ඔවුන් ප්‍රතිපත්ති, ක්‍රියාපිළිවෙත් සකස් කිරීම හා විධායක ගුවන් ආරක්ෂණ පරීක්ෂණ අංශයේ සමාලෝචන හා වෙනත් කාර්යයන් ඉටු කිරීම සඳහා විධායක ගුවන් නිරීක්ෂණ පරීක්ෂණ නිලධාරියා සමග සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කරයි. තවද, Fixed Wing, Rotor Wing, Jet Aircraft සහ Air Traffic Control නියෝජනය කරමින් සිව් දෙනෙකු ගුවන් ආරක්ෂණ පරීක්ෂණ අංශයේ සිටින අතර ඔවුන් ප්‍රධාන ගුවන් ආරක්ෂණ පරීක්ෂණ නිලධාරියා යටතේ කටයුතු කරයි.

## (ආ) 2018 වර්ෂයේ කාර්යසාධනය

i. සියලුම මුලික කඳවුරු/කඳවුරු සහ පියාසර අනුබණ්ඩ වල සිදු කල ගුවන් සේවා ආරක්ෂණය පිලිබඳ වාර්ෂික සමීක්ෂණ

i. සියලුම මුලික කඳවුරු/කඳවුරු සහ පියාසර අනුබණ්ඩ වල ගුවන් සේවා ආරක්ෂණය පිලිබඳ වාර්ෂික සමීක්ෂණ 31ක් සිදු කර ඇත

iii. ඉන්ධන බවුසර් සහ ගුවන්යානා ඉන්ධන ටැංකි වලට ජලය මිශ්‍රවීම හා එම ඉන්ධන ගබඩා කිරීමේ ක්‍රමවේදයන් පිලිබඳව මුලික කඳවුරු/කඳවුරු 09ක සහ පියාසර අනුබණ්ඩ 11ක හදිසි විමර්ශන සිදු කර ඇත.

## (ඇ) ගුවන් ආරක්ෂණ වැඩමුළු පැවැත්වීම

රත්මලාන අංක 61 වන බලපන්ති ශ්‍රවණාගාරයේදී නිලධාරීන් සඳහා ගුවන් ආරක්ෂණය පිලිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් පවත්වන ලද අතර අධිකාරී නොලත් නිලධාරී කළමනාකරණ පාසලේදී අධිකාරී නොලත් නිලධාරීන් සඳහා ගුවන් ආරක්ෂණය පිලිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු 02ක් පැවැත්වීම. නිලධාරීන් 26 දෙනෙකු හා අධිකාරී නොලත් නිලධාරීන් 102 දෙදෙනෙකු මෙම වැඩමුළු සඳහා සහභාගී වී ඇත.

i. විශේෂ සිද්ධි වාර්තා ඇගයීම (SORs).
විශේෂ සිද්ධි වාර්තා 18ක් ඇගයීමට ලක් කර ඇත.

ii. 2018 මැයි මස ගුවන් ආරක්ෂණ විද්‍යුත්- සඟරාව එළිදැක්වීම

## (ඈ) පුරෝකථනය නොකළ ව්‍යාපෘති/ක්‍රියාකාරකම්

i. එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් රාජකාරි සඳහා පිටත්ව යාමට නියමිත සිව්වවන බලසණයට අයත් නිලධාරීන් හා ගුවන්භටන් සඳහා පෙබරවාරි මාසයේදී ශ්‍රීලංගුභ රත්මලාන මුලික කඳවුරේ අංක 61 බලපන්තියේදී ගුවන් කාර්ය මණ්ඩල සම්පත් කළමනාකරණය පිලිබඳ පුහුණු වැඩසටහන පැවැත්වීම

ii. අනතුරු/සිද්ධි සම්බන්ධ දත්ත සංචිතයක් පවත්වාගෙන යාම. (අඛණ්ඩ ක්‍රියාවලියකි).

## (24) විධායක තත්ව නිර්ණ නිරීක්ෂණ ඒකකය

### (අ) හැඳින්වීම

ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුල තත්ත්ව නිරීක්ෂණය පිලිබඳ කාර්යන් ඉටු කිරීම සඳහා විධායක තත්ත්ව නිර්ක්ෂණ ඒකකය ස්ථාපිත කර ඇත. මෙම ඒකකයේ ප්‍රධානියා ලෙස විධායක තත්ත්ව නිරීක්ෂණ නිලධාරියා කටයුතු කරයි. ඔහු තත්ත්ව නිරීක්ෂණ කාර්යයන් සම්බන්ධයෙන් ඒකකයේ මෙහෙයුම් කාර්යක්ෂමතාව පිලිබඳ ඍජුවම ගුවන්හමුදාධිපතිට වග කියනු ලබයි.

### (ආ) ගුවන්යානා ඉංජිනේරු තාක්ෂණය සම්බන්ධ තත්ත්ව විගණනයන් සහ වෙනත් ක්‍රියාකාරකම්

i. තත්ත්ව විගණන පරික්ෂා කිරීම්

(i) පියාසර මෙහෙයුම් වලට අදාලව සියලුම තත්ත්ව නිරීක්ෂණ පද්ධති ආවරණය වන පරිදි ශ්‍රීලංගුහ සියලුම ගුවන්යානා ඉංජිනේරු අංශ වල තත්ත්ව විගණන පරික්ෂා කිරීම් සිදු කිරීම

(ii) 2018 වර්ෂය තුලදී පියාසර අංශ, ඉංජිනේරු අංශ වල මෙහෙයුම් මෙන්ම එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් සඳහා පහසුකම් සැපයීම සඳහා ලැබුණු ගුවන්යානා වෙනස්කම් පත්‍රිකා, අක්ෂාංශ ඉල්ලීම් පත්‍රිකා, කාලසටහන් නඩත්තු වැඩ වාර්තා සටහන්, ගුවන්යානා කාර්යයන්ට අදාල වැඩ වාර්තා සටහන්

ii. කාර්යමණ්ඩලය සහතික කිරීම

නියමිත කාල සීමාව තුල පුහුණු පාඨමාලා සාර්ථකව නිම කල ඉංජිනේරු නිලධාරීන්/තාක්ෂණික ශිල්පින් සඳහා ගුවන්යානා යෝග්‍යතාවන් නිකුත් කිරීම

iii. වැඩිදියුණු කිරීම් හා සංවර්ධනයන්

(i) MI-17 ගුවන්යානා ඇණියට අදාල වැඩ වාර්තා සටහන් ප්‍රමිතිකරණය කිරීම සිදු කරමින් පවතී

(ii) ශ්‍රීලංගුහ සියලුම පියාසර හා ගුවන් ඉංජිනේරු අංශ වල තාක්ෂණික ඉංජිනේරු කාර්ය මණ්ඩල වල දක්ෂතාවයන් අධීක්ෂණය කිරීම සඳහා දත්ත සංචිතයක් ඇති කිරීම.

(iii) ගුවන් හමුදා නියෝග වෙළුම IV ඉංජිනේරු නියෝග සංශෝධනය කිරීම හා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම

(ඇ) සාමාන්‍ය ඉංජිනේරු සම්බන්ධ තත්ත්ව විගණනයන් සහ වෙනත් ක්‍රියාකාරකම්

i. තත්ත්ව විගණන පරීක්ෂා කිරීම්

මෝටර් රථ අංශ, ආයුධ ගබඩා, ගිනි නිවීමේ අංශ, බෝම්බ නිෂ්ක්‍රිය කිරීමේ අංශ සහ ගොඩබිම් උපකරණ අංශ වල සාමාන්‍ය ඉංජිනේරු සම්බන්ධ සියලුම තත්ත්වයන් ආවරණය වන පරිදි සියලුම මූලික කඳවුරු/කඳවුරු/අංශ සහ චීන වරාය විද්‍යා පීඨයේ තත්ත්ව විගණන පරීක්ෂා කිරීම් සිදු කිරීම

ii. 2018 වර්ෂය තුළ යුධෝපකරණ පිළිබඳ යාන්ත්‍රික ශිල්පීන් සඳහා CPD පුහුණු වැඩසටහන පැවැත්වීම

iii. 2018 වර්ෂය තුළ මෝටර් රථ කාර්මික ශිල්පීන් 39 දෙනෙකු සඳහා CPD පුහුණු වැඩසටහන් පැවැත්වීම

iv. 2018 වර්ෂය තුළ සාමාන්‍ය කාර්මික ශිල්පීන් 62 දෙදෙනෙකු සඳහා CPD පුහුණු වැඩසටහන් පැවැත්වීම

(ඈ) තාක්ෂණික පුස්තකාල

i. පුස්තකාල ක්‍රියාපටිපාටියට අනුකූලව වර්ෂය තුළ පහත සඳහන් ප්‍රධාන කාර්යයන් නිම කර ඇත.

(i) සංස්කරණ/සංශෝධන ලබා ගැනීම
(ii) ගුවන්යානා පිළිබඳ ප්‍රකාශන බෙදා හරීම
(iii) ප්‍රකාශන පිළිබඳ නිවේදන
(iv) ප්‍රකාශන තාවකාලිකව පිටතට ලබා දීම
(v) ඉල්ලුම මත මිලදී ගැනීම

ii. පහත සඳහන් කාර්ය සංග්‍රහයන් OEM මගින් මිලදී ගෙන ඇත.

| අනු අංකය | ගුවන්යානා වර්ගය | ප්‍රකාශන පිළිබඳ විස්තර | අදාළ අංශය |
|---|---|---|---|
| 01 | Bell 206 හෙලිකොප්ටර් යානා එන්ජිම (Rolls Royse M250-C20) | OMM හා IPC | අංක 4 බලසණ්ඩයල අංක 7 බලසණ්ඩය සහ ගුවන්යානා ඉංජිනේරු පක්ෂාංගය |

iii ගුවන්යානා ප්‍රකාශන සඳහා නොමිලේ අන්තර්ජාල ප්‍රවේශය ලබා ගැනීමට අලුතින් අමතර වෙබ් අඩවි නිර්මාණය කිරීම

## (ඉ) පුහුණු අංශය

i. ශ්‍රීලංගුභ කාර්යමණ්ඩලයේ 391 දෙනෙකු (නිලධාරීන් හා ගුවන්භට දෙපිරිසම) සඳහා ඵලදායිතාව ඉහල නැවීම හා වෘත්තිමය සංවර්ධනය පිලිබඳ පුහුණු වැඩසටහන් 7ක් පැවැත්වීම

ii. ශ්‍රීලංගුභ සේවා පුද්ගලයින් 204 දෙනෙකු සඳහා තත්ත්ව නිරීක්ෂණ සේවා පුහුණු වැඩසටහන් 8ක් පැවැත්වීම

iii. ශ්‍රීලංගුභ ඒකල වෘත්තීය පුහුණු පාසලේ මූලික හා උසස් පුහුණු පාඨමාලා හදාරන අභ්‍යාසලභින් 656 දෙනෙකු සඳහා තත්වය හා ඵලදායිතාව පිලිබඳ පුහුණු වැඩසටහන් 40ක් පැවැත්වීම

iv. ගුවන් වෙළදාමේ නියුතු පුද්ගලයින් 311 දෙනෙකු සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන් 19ක් පැවැත්වීම

v. ශ්‍රීලංගුභ සේවා පුද්ගලයින් 275 දෙනෙකු සඳහා තත්වය හා ඵලදායිතාවය පිලිබඳ පුහුණු වැඩසටහන් 4ක් පැවැත්වීම

vi. බාහිර පුහුණු වැඩසටහන්

| විස්තරය | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව | ස්ථානය |
|---|---|---|---|
| ක්‍රමාංකනය | 01 | 01 | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය |
| තත්ව කළමනාකරණය පිලිබඳ ඩිප්ලෝමාව | 01 | 05 | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය |
| අභ්‍යන්තර විගණනය | 03 | 04 | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය |
| ආරක්ෂාව හා සෞඛ්‍ය පිලිබඳ වැඩමුළුව | 01 | 01 | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය |
| Six Sigma පිලිබඳ වැඩමුළුව | 01 | 01 | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය |
| ඵලදායිතා නිර්ණායකයන් හා විශ්ලේෂණය | 01 | 01 | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය |
| **එකතුව** | **08** | **13** | |

vii. ආයතනික සමාජ වගකීම් වලට අදාලව පුහුණු වැඩසටහන් පැවැත්වීම.

| විස්තරය | දිනය | ස්ථානය | සහභාගී වුවන් සංඛ්‍යාව |
|---|---|---|---|
| සෞඛ්‍ය අමාත්‍යංශය | 23.02.18 | වලල්ලාවිට | 55 |
| නගර සභාව | 12.07.18 | නුවරඑලිය | 50 |
| **එකතුව** | | | **105** |

### (ඊ) තත්වය සහ එලදායිතාව

i. 2018 වර්ෂය තුල සියලුම ශ්‍රීලංගුහ මුලික කඳවුරු සහ කඳවුරු වල තත්වය හා එලදායිතාවය සම්බන්ධව විගණන පරීක්ෂණ සිදු කිරීම

ii. තත්ත්ව පාලන කව 47ක් ලියාපදිංචි කිරීම

### (උ) ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු

i. ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු CPD පුහුණු වැඩසටහන් 07ක් පැවැත්වීම

ii. ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු සම්බන්ධයෙන් නිකුත් කල යෝග්‍යතාවයන්

### (ඌ) වෙනත් විශේෂ ව්‍යාපෘති

i. තත්ව පාලන කවයන්ගේ ක්‍රියාවලිය සම්බන්ධව විද්‍යාපීඨයද ඇතුළුව සියලුම මුලික කඳවුරු හා අංශ දැනුවත් කිරීම හා 2018- ශ්‍රීලංගුහ විශිෂ්ටතා සම්මාන තරගාවලියට සහභාගීවීම දිරිගැන්වීම

ii. 2018 ජාතික එලදායිතා රන් සම්මාන තරගාවලියේ ජයග්‍රාහකයා බවට පත්වීම සඳහා හමුදාවේ තත්වය හා එලදායිතාවය වර්ධනයට අදාළ සියලුම මුලික මට්ටමේ කාර්යයන් විධායක තත්ත්ව නිරීක්ෂණ ඒකකය විසින් සමායෝජනය කිරීම.

## (25) විධායක නීති දෙපාර්තමේන්තුව

### (අ) හැඳින්වීම

i. 2007 ජනවාරි 01 දින විධායක නීති දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා ගුවන් හමුදා මුලස්ථානයේ දී පිහිටුවන ලදී. ඒ අනුව "ප්‍රධාන නීති නිලධාරී" යන තනතුර විධායක තනතුරක් ලෙස උසස් කරන ලද අතර "ප්‍රධාන නීති නිලධාරී" යන නාමය "නීති අධ්‍යක්ෂ" ලෙස නම් කර ඇත.

ii. නීති අධ්‍යක්ෂ ගේ ප්‍රධානීත්වයෙන් විධායක නීති දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වන අතර ඔහු ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අදාළ සියලුම නීති හා පරිපාලනමය කටයුතු සම්බන්ධයෙන් ගුවන්හමුදාධිපතිට සෘජුවම වගකියනු ලබයි.

iii. ශ්‍රීලංගුහ තුල ඕනෑම රාජකාරිමය කටයුත්තක් සම්බන්ධයෙන් අවශ්‍ය නීති උපදෙස් හා අදහස් ලබා දීමට සිටින එකම ආයතනය වන්නේ විධායක නීති දෙපාර්තමේන්තුවයි.

## (ආ) 2018 වර්ෂය තුල කාර්යසාධනය

i. යුධ අධිකරණ 04ක් පැවැත්වීම

ii. නිලධාරීන් සම්බන්ධ ලුහුඬු නඩු 06ක් සහ ප්‍රධාන බලලත් නිලධාරීන්/බලලත් නිලධාරීන් සම්බන්ධ ලුහුඬු නඩු 13ක් අවසන් කිරීම

iii. අභියාචනාධිකරණයට ඉදිරිපත් කර තිබූ නඩු 03ක් අවසන් කිරීම.

iv. 2018 වර්ෂය තුල පවත්වන ලද දේශනයන්

ගුවන් හමුදා නීතිය, සිවිල් නීතිය, වාණිජ නීතිය හා මානව අයිතිවාසිකම් සම්බන්ධයෙන් ශ්‍රීලංගුහ චීනවරාය විද්‍යා පීඨය, ශ්‍රීලංගුහ කඳවුර මුලතිව්, ශ්‍රීලංගුහ කඳවුර අම්පාර සහ සටන් පුහුණු පාසල දියතලාව යන ස්ථාන වල පිහිටි ශ්‍රීලංගුහ පුහුණු අංශ වලදී සිදු කරන ලද දේශණයන් පිලිබඳ විස්තර පහත පරිදිය.

## (ඇ) 2018 වර්ෂය තුල සංවර්ධනයන්

i. විධායක නීති දෙපාර්තමේන්තුව අවබෝධතා ගිවිසුම්, කොන්ත්‍රාත්/ ගිවිසුම් සැකසීමට සෘජුවම දායක වී ඇති අතර ගුවන් හමුදාව විසින් මෑත කාලීනව භාරගත් වාණිජ අරමුණු සඳහා ව්‍යාපාර පිහිටුවීමද වර්ෂය තුල සිදු කල ක්‍රියාකාරකමිය.

ii. වෙනත් පාර්ශවයන් සමඟ ශ්‍රී ලංකා රජය ඇති කරගැනීමට යෝජිත අවබෝධතා ගිවිසුම් හා ගිවිසුම් සම්බන්ධයෙන් විධායක නීති දෙපාර්තමේන්තුව විසින් ආරක්ෂක අමාත්‍යංශය වෙත උපදෙස් ලබා දී ඇති අතර එසේ ඇති කරගැනීමට නියමිත විශේෂ ගිවිසුම් කිහිපයක් පහත පරිදිය.

(i) ලංකා- රුසියානු යුධ සහයෝගිතා සැලැස්ම-2019

(ii) ශ්‍රී ලංකාව හා උගන්ඩා රාජ්‍යය අතර යුධ ආරක්ෂණ සහයෝගිතාව පිලිබඳ අවබෝධතා ගිවිසුම

(iii) ශ්‍රී ලංකාව හා ජෝර්දාන රාජ්‍යය අතර ආරක්ෂක සහයෝගිතාව පිලිබඳ ගිවිසුම් කෙටුම්පත

(iv) ඔස්ලෝ සම්මේලනයට සහභාගී වීම හා විනිවිදභාවය පිලිබඳ වාර්තා ඉදිරිපත් කිරීම.

(v) ශ්‍රීලංකා රජය හා තුර්කි රජය අතර පුහුණුව, තාක්ෂණය හා විද්‍යාව යන යුධ ක්ෂේත්‍ර වල සහයෝගිතාව සම්බන්ධයෙන් වන රාමුගත ගිවිසුම

(vi) ශ්‍රී ලංකා ආරක්ෂක අමාත්‍යාංශය හා ඕස්ට්‍රේලියානු ආරක්ෂක දෙපාර්තමේන්තුව අතර අන්‍යොන්‍ය වශයෙන් සැපයුම් සහය ලබාදීම සම්බන්ධයෙන් වන අවබෝධතා ගිවිසුම

(vii) සාමකාමී අරමුණු සඳහා න්‍යෂ්ටික ශක්තිය භාවිතා කිරීම සම්බන්ධයෙන් වන සහයෝගිතාවය පිලිබඳ ශ්‍රී ලංකා රජය හා රුසියානු රජය අතර යෝජිත ගිවිසුම් කෙටුම්පත

(viii) යුරෝපීය කවුන්සිලයේ පොදු හමුදා ලැයිස්තුව සමාලෝචනය කිරීම

(ix) ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ, 2006 අංක 04 දරන ජිනීවා සම්මුති පනතේ යෝජිත සංශෝධන

(x) ආරක්ෂක අමාත්‍යාංශය වෙත ත්‍රස්ත විරෝධී පනත සැකසීම සම්බන්ධයෙන් අදහස් ලබා දීම හා ඊට අවශ්‍ය දායකත්වය ලබා දීම

iii. ත්‍රිවිධ හමුදා සේවා පුද්ගලයින්ගේ නීති අධ්‍යාපනය අඛණ්ඩව පවත්වා ගෙන යාම වෙනුවෙන් ගුවන් හමුදා මුලස්ථානයේදී වැඩමුළු හා විශේෂ ආරාධිත දේශන පැවැත්වීම. අදාළ විෂයන් පිලිබඳ නීති විශාරදයින් විසින් පහත පරිදි දේශන පවත්වන ලදී.

| | |
|---|---|
| (i) රජයේ රස පරීක්ෂකවරයාගේ කාර්යභාරය හා ප්‍රවීණ සාක්ෂය පිලිබඳ හැඳින්වීම | - ඒ. වැලිඅංග මයා රජයේ රස පරීක්ෂක |
| (ii) කාන්තා අයිතිවාසිකම් (1) | - පොලිස් අධිකාරී ලංකාරාජිනි අමරසේන මිය |
| (iii) අධ්‍යක්ෂ ළමා හා කාන්තා කාර්යාංශය ශ්‍රී ලංකා පොලිසිය | - සහකාර පොලිස් අධිකාරී බිනුෂානි ජසිනාරච්චි<br>- මුලස්ථාන භාර නිලධාරී (අපරාධ ), ළමා හා කාන්තා කාර්යාංශය ශ්‍රී ලංකා පොලිසිය |
| (iv)කාන්තා අයිතිවාසිකම් (2) | - සහකාර පොලිස් අධිකාරී බිනුෂානි ජසිනාරච්චි<br>- මුලස්ථාන භාර නිලධාරී (අපරාධ ), ළමා හා කාන්තා කාර්යාංශය කාන්තා පොලිස් පරීක්ෂක ප්‍රියංකා බණ්ඩාර |

## (26) අභ්‍යන්තර විගණන අංශය

### (අ) හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මඟින් දක්වා ඇති ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයක් සම්පූර්ණ කර ගැනීමෙහිලා 2011 වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කරන ලදී. ඒ අනුව, අභ්‍යන්තර විගණන අංශය සෘජුවම ගුවන්හමුදාධිපතිට වාර්තා කරන ඒකකයක් වන අතර එය විධායක අභ්‍යන්තර විගණක ගේ ප්‍රධානීත්වයෙන් ක්‍රියාත්මක වේ. පසුව ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස රජයේ ගණකාධිකරයකු පත් කිරීම හේතුවෙන් 2017 වර්ෂයේ සිට "විධායක අභ්‍යන්තර විගණක" යන නාමය "විධායක අභ්‍යන්තර විගණක (සේවා)"ලෙස සංශෝධනය කර ඇත.

### (ආ) වර්ෂය 2018 තුල කාර්යසාධනය

i. මූල්‍ය විගණන

(i) රාජ්‍ය මුදල් සම්බන්ධ පහත ක්ෂේත්‍ර ආවරණය වන පරිදි 2018 වර්ෂය තුල ශ්‍රීලංගුහ විද්‍යාපීඨය/මූලික කඳවුරු හා කඳවුරු වල හදිසි විගණන පරීක්ෂා කිරීම් සිදු කිරීම

- පොදු අග්‍රිම හැසිරවීම
- ප්‍රසම්පාදනය
- ගබඩා කළමනාකරණය
- කාර්යමණ්ඩල පරිපාලනය
- මූල්‍ය පද්ධති සංවර්ධනයට අදාළ වර්ධනයන්

(ii) 2018 වර්ෂය තුල සිදු කරන ලද හදිසි විගණන පරීක්ෂා කිරීම් වලට අදාළ තොරතුරු පහත පරිදිය.

| Ser No | Camp | Camp Date of Audit Visit |
|---|---|---|
| 1. | ශ්‍රීලංගුහ කඳවුර පලාලි | 2018 ජනවාරි |
| 2. | ශ්‍රීලංගුහ කඳවුර ඉරණමඩු | 2018 මාර්තු |
| 3. | ශ්‍රීලංගුහ කඳවුර මුලතිව් | 2018 මාර්තු |
| 4. | ශ්‍රීලංගුහ කඳවුර මොරවැව | 2018 අප්‍රේල් |
| 5. | ශ්‍රීලංගුහ විද්‍යා පීඨය චීන වරාය | 2018 අප්‍රේල් |
| 6. | ශ්‍රීලංගුහ කඳවුර අම්පාර | 2018 අප්‍රේල් |
| 7. | ශ්‍රීලංගුහ කඳවුර මඩකලපුව | 2018 මැයි |
| 8. | ශ්‍රීලංගුහ මූලික කඳවුර හිඟුරක්ගොඩ | 2018 මැයි |
| 9. | ශ්‍රීලංගුහ මූලික කඳවුර වව්නියාව | 2018 මැයි |
| 10. | ශ්‍රීලංගුහ කඳවුර වන්නි | 2018 මැයි |
| 11. | ශ්‍රීලංගුහ කඳවුර සිගිරිය | 2018 ජූනි |

| | | |
|---|---|---|
| 12. | ශ්‍රීලංගුභ මූලික කඳවුර අනුරාධපුරය | 2018 ජූනි |
| 13. | ශ්‍රීලංගුභ මූලික කඳවුර කටුනායක | 2018 ජූනි |
| 14 | ශ්‍රීලංගුභ කඳවුර කටුකුරුන්ද | 2018 ජූලි |
| 15 | ශ්‍රීලංගුභ කඳවුර කොග්ගල | 2018 ජූලි |
| 16 | ශ්‍රීලංගුභ කඳවුර බජාගු | 2018 අගෝස්තු |
| 17 | ශ්‍රීලංගුභ කඳවුර පාලවී | 2018 අගෝස්තු |
| 18. | ශ්‍රීලංගුභ කඳවුර ඒකල | 2018 අගෝස්තු |
| 19. | ශ්‍රීලංගුභ කඳවුර දියතලාව | 2018 අගෝස්තු |
| 20. | ශ්‍රීලංගුභ කඳවුර පිදුරුතලාගල | 2018 අගෝස්තු |
| 21. | ශ්‍රීලංගුභ කඳවුර මීරිගම | 2018 සැප්තැම්බර් |
| 22 | ශ්‍රීලංගුභ කඳවුර වීරවිල | 2018 සැප්තැම්බර් |
| 23. | ශ්‍රීලංගුභ කඳවුර කොළඹ | 2018 සැප්තැම්බර් |
| 24. | ශ්‍රීලංගුභ මූලික කඳවුර රත්මලාන | 2018 ඔක්තෝබර් |

(iii) අභ්‍යන්තර විගණන අංශය මගින් එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් හරහා ලැබුණු ආදායම පිළිබඳව විගණනය කල අතර එම වාර්තාව 2018 සැප්තැම්බර් මස 06 වන දින නිකුත් කරන ලදී.

(iv) පහත ක්ෂේත්‍ර ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණන අංශය විසින් ශ්‍රීලංගුභ මුදල් අධ්‍යක්ෂකයේ විගණන කටයුතු සිදු කල අතර මූල්‍ය පද්ධති සංවර්ධනයට අදාලව නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

- වැටුප් හා වේතන
- රජයේ ආදායම් එකතු කිරීම
- පොදු තැන්පත් ගිණුම
- රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුම
- ගෙවීම් වවුචර් ගත කිරීම
- බැංකු සැසඳුම

(v) අභ්‍යන්තර විගණන අංශය විසින් පහත සඳහන් ශ්‍රීලංගුභ විද්‍යාපීඨය/මූලික කඳවුරු/කඳවුරු වල පොදු අග්‍රිම හැසිරවීම (සියලුම ගෙවීම්, ලැබීම් හා බැංකු සැසඳුම්) සම්බන්ධව රාජ්‍ය මුදල් ආවරණය වන පරිදි මාසිකව සියලුම අග්‍රිම ගිණුම් විගණනය කිරීම හා රාජ්‍ය මුදල් කළමනාකරණයේ ඵලදායිතාවය ඉහල නැංවීම පිණිස පවතින අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට අදාලව නියෝජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ(ගිණුම්) වෙත නිර්දේශ ලබා දීම සිදු කර ඇත.

- ශ්‍රීලංගුහ විද්‍යාපීඨය චීනවරාය
- ශ්‍රීලංගුහ මූලික කඳවුර කටුනායක
- ශ්‍රීලංගුහ මූලික කඳවුර රත්මලාන
- ශ්‍රීලංගුහ මූලික කඳවුර අනුරාධපුරය
- ශ්‍රීලංගුහ මූලික කඳවුර වව්නියාව
- ශ්‍රීලංගුහ මූලික කඳවුර හිඟුරක්ගොඩ
- ශ්‍රීලංගුහ කඳවුර කොළඹ
- ශ්‍රීලංගුහ කඳවුර පලාලි
- ශ්‍රීලංගුහ කඳවුර අම්පාර
- ශ්‍රීලංගුහ කඳවුර සිගිරිය
- ශ්‍රීලංගුහ කඳවුර පාලවී
- ශ්‍රීලංගුහ කඳවුර ඉරණමඩු
- ශ්‍රීලංගුහ කඳවුර මුලතිව්
- ශ්‍රීලංගුහ කඳවුර මඩකලපුව
- ශ්‍රීලංගුහ කඳවුර වීරවිල
- ශ්‍රීලංගුහ කඳවුර මොරවැව
- ශ්‍රීලංගුහ කඳවුර මීරිගම
- ශ්‍රීලංගුහ කඳවුර බජාගු
- ශ්‍රීලංගුහ කඳවුර පිදුරුතලාගල
- ශ්‍රීලංගුහ සටන් පුහුණු පාසල දියතලාව
- ශ්‍රීලංගුහ වෘත්තීය පුහුණු පාසල ඒකල
- ශ්‍රීලංගුහ රෙජිමේන්තු පුහුණු පාසල වන්නි

(vi) විදේශ හා දේශීය ප්‍රසම්පාදන ආවරණය වන පරිදි ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් විගණනය කිරීම

ii. <u>මාර්ග නිර්දේශ හා නියමයන්ට අනුකූලව සිදු කල විගණන</u>

(i) අභ්‍යන්තර විගණන අංශය මඟින් 2018 වර්ෂය සඳහා වන වාර්ෂික විගණන සැලැස්ම පිළියෙළ කර විගණන හා කළමනාකරණ කමිටුවේ අනුමැතිය ලබා ගෙන එය භාණ්ඩාගාර චක්‍රලේඛ DMA/ AMC/2017/5/5 ප්‍රකාරව විගණකාධිපතිටද පිටපතක් සහිතව භාණ්ඩාගාරයේ විගණන කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

(ii) 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට එරෙහිව තත්‍ය කාර්යසාධනය පිලිබඳ ප්‍රගති සමාලෝචනයක් ද සිදු කර ඇත.

(iii) භාණ්ඩාගාර චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි ප්‍රකාරව 2018 වර්ෂයේදී මාසික විගණන වාර්තා පිළියෙළ කිරීම හා පහත ආයතන වෙත එම වාර්තා ඉදිරිපත් කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය ක්‍රියා කර ඇත.

- විගණකාධිපති
- ලේකම් ආරක්ෂක අමාත්‍යංශය

(iv) කටුනායක ශ්‍රීලංගුහ සැපයුම් හා නඩත්තු ඩිපෝව සම්බන්ධයෙන් ගබඩා සත්‍යාක්ෂණ වාර්තා මාසිකව විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

(v) ශ්‍රීලංගුහ විද්‍යා පීඨය ඇතුළු සියලුම මූලික කඳවුරු/කඳවුරුවල බැංකු සැසඳුම් ප්‍රකාශ මාසිකව විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

(vi) කළමනාකරණ විගණන චක්‍රලේඛ ප්‍රකාරව ත්‍රෛයිමාසික ඇගයුම් වාර්තා පිළියෙළ කර පහත ආයතන වෙත ඉදිරිපත් කිරීමට ක්‍රියා කර ඇත.

- කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
- ලේකම් ආරක්ෂක අමාත්‍යාංශය

iii <u>ගබඩා සත්‍යාක්ෂණය</u> පහත සඳහන් ශ්‍රීලංගුහ ප්‍රධාන ගබඩා වල භෞතික තොග වල හරි වැරදි බැලීම සිදු කර 2018 සැප්තැම්බර් 20 දින වාර්තාවක් නිකුත් කර ඇත.

| අනු අංකය | ගබඩාව | තොග හරි වැරදි බලන ලද දිනය |
|---|---|---|
| 1. | සැපයුම් හා නඩත්තු ඩිපෝව (අංක 02 සැනඩි හිඟුරක්ගොඩ) | 2017/04/03 සිට 2017/04/07 දක්වා |
| 2. | සැපයුම් හා නඩත්තු ඩිපෝව (අංක 01 සැනඩි කටුනායක ) | 2018/07/05 සිට 2018/08/02 දක්වා |
| 3. | අංක 02 බලසණය ඉදිරි සැපයුම් ගබඩා | |
| 4. | අංක 05 බලසණය ඉදිරි සැපයුම් ගබඩා | |
| 5. | අංක 10 බලසණය ඉදිරි සැපයුම් ගබඩා | |
| 6. | අංක 12 බලසණය ඉදිරි සැපයුම් ගබඩා | |
| 7. | ගුවන්යානා ඉංජිනේරු පක්ෂාංගය ඉදිරි සැපයුම් ගබඩා | |
| 8. | සාමාන්‍ය ඉංජිනේරු පක්ෂාංගය ඉදිරි සැපයුම් ගබඩා | |
| 9. | විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු ඉදිරි සැපයුම් ගබඩා | |
| 10. | ගුවන්යානා පූර්ණ අලුත්වැඩියා පක්ෂාංගය ඉදිරි සැපයුම් ගබඩා | |
| 11. | ගුවන්යානා අමතර කොටස් ඩිපෝව ඉදිරි සැපයුම් ගබඩා | |
| 12. | සිවිල් ඉංජිනේරු පක්ෂාංගය ඉදිරි සැපයුම් ගබඩා | |
| 13. | භාණ්ඩ සැපයුම් හා ප්‍රතිසම්පාදන ඒකකය ඉදිරි සැපයුම් ගබඩා | |
| 14. | මෝටර් රථ කාර්මික හා නඩත්තු කිරීමේ පක්ෂාංගය ඉදිරි සැපයුම් ගබඩා | |

iv. ශක්‍යතා ගොඩනැගීම 2018 වර්ෂය තුල අභ්‍යන්තර විගණන අංශයට අයත් සේවා පුද්ගලයින් පහත පරිදි පුහුණු වැඩසටහන සඳහා සහභාගී වී ඇත.

| අනු අංකය | පුහුණු වැඩසටහන් | පවත්වන ලද්දේ | පැවැත්වූ දිනය | සහභාගිත්වය |
|---|---|---|---|---|
| 1 | ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය හා ව්‍යවස්ථා සම්පාදනය | ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය හා ව්‍යවස්ථා සම්පාදනය පිලිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණ කාර්යාලය | 18/ ජන /10 | 02521 බලසෘන නායක ඩබ් ඒ බී සී රූපසිංහ<br>02984 ෆ්ලයිට් ලෙෆ් එච් ඩී එම් ගමගේ<br>22332 බලලත් නිළධාරී පුෂ්පකුමාර |
| 2 | 2018 ඵලදායිතා රන් සම්මානය පිලිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | විධායක තත්ත්ව නිරීක්ෂණ අංශය | 18/ජුනි 12 | 02508 බලසෘන නායක ඩබ් එම් එම් එස් චන්ද්‍රසේකර |
| 3 | අභ්‍යන්තර විගණනය හා එහි කාර්ය ස්වභාවය කෙරෙහි වන වත්මන් ප්‍රවනතාවයන් පිලිබඳ පුහුණු වැඩසටහන | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව -මුදල් අමාත්‍යංශය | 18/ජුනි/13 | 02507 විංග් කමා ආර් ආර් සෝමතිලක |
| 4 | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් | ආරක්ෂක අමාත්‍යංශය | 18 ජුනි 22 සිට 23 දක්වා | 02521 බලසෘන නායක ඩබ් ඒ බී සී රූපසිංහ<br>02986 ෆ්ලයිට් ලෙෆ් එම් ජී කේ එල් මධුෂානි |
| 5 | සමීක්ෂණ මණ්ඩල සහ හානි හා කපා හැරීම් | මුල්‍ය අධ්‍යයන ආයතනය- මුදල් අමාත්‍යංශය | 2018 අගෝ 30 සහ 31 | ෆ්ලයිට් ලෙෆ් එච් ඩී එම් ගමගේ |
| 6 | ශ්‍රීලංගුභ දැනට පවතින පරිඝනක ගත කල තොරතුරු පද්ධතිය | තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂකය | 18/සැප්/10 | සියලුම අභ්‍යන්තර විගණන අංශ කාර්යමණ්ඩලය |
| 7 | ජාතික විගණන පනත පිලිබඳ දැනුවත් කිරීම | ජාතික විගණන කාර්යාලය | 18/සැප්/10 | 02507 විංග් කමා ආර් ආර් සෝමතිලක |

| | | | | |
|---|---|---|---|---|
| 8 | ලංසු ලේඛන හා ටෙන්ඩර් පටිපාටි | මූල්‍ය අධ්‍යයන ආයතනය- මුදල් අමාත්‍යංශය | 18 නොවැ 07,08, හා 09 | 02521 බලසන නායක ඩබ් ඒ බී සී රූපසිංහ |
| 9 | ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් හා අභ්‍යන්තර විගණකවරුන් සඳහා පුහුණු වැඩසටහන | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව- මුදල් අමාත්‍යංශය | 2018/11/15 | 02521 බලසන නායක ඩබ් ඒ බී සී රූපසිංහ |
| 10 | ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් හා අභ්‍යන්තර විගණකවරුන් සඳහා පුහුණු වැඩසටහන | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව- මුදල් අමාත්‍යංශය | 2018/12/18 | විංග් කමා ආර් ආර් සෝමතිලක<br>02983 ෆ්ලයිට් ලෙෆ් එම් එම් ඩී එල් මධුශංක |
| 11 | ත්‍රිවිධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ අධිකාරී නොලත් නිලධාරීන් හා බලලත් නිලධාරීන් සඳහා වැඩමුළුව | පුහුණු අධ්‍යක්ෂකය | 2018/11/26 | 22332 බලලත් නිලධාරී එච් එම් පී පුෂ්පකුමාර |

v. <u>විගණන රැස්වීම්</u>

(i) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශ චක්‍රලේඛ DMA/2009(1) මගින් නියම කර ඇති පරිදි අභ්‍යන්තර විගණන අංශය විසින් ත්‍රෛමාසික විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 2018 වර්ෂය තුල පහත පරිදි පවත්වන ලදී.

| අනු අංකය | කාර්තුව | කමිටු රැස්වීම පැවැත්වූ දිනය |
|---|---|---|
| 1 | 2017 සිව්වන කාර්තුව | 2018 අප්‍රේ 26 (2017 වර්ෂයට අදාලව) |
| 2 | 2018 පළමු කාර්තුව | 2018 අප්‍රේ 26 |
| 3 | 2018 දෙවන කාර්තුව | 2018 අගෝ 13 |
| 4 | 2018 තුන්වන කාර්තුව | 2018 නොවැ 30 |

(3) වෙල්ලමනාල්, ග්‍රාමෝධය සෞඛ්‍ය මධ්‍යස්ථානය අලුත්වැඩියා කර තීන්ත ආලේප කිරීම හා ගැබිණි මව්වරුන් 60 දෙනෙකු සඳහා සුළු ආහාර වේලක් ලබා දීම.

(4) මොරවැව උතුර පාසලේ පුස්තකාලය සඳහා කියවීමේ පොත් සහ පොත් කබඩ් ප්‍රදානය කිරීම.

(5) 2018 ජුලි මස 25 වන දින චීන වරාය, බෞද්ධ විහාරය, ශාන්ත අන්තෝනි දේවස්ථානය හා ගණදෙවි කෝවිල යන පරිශ්‍ර වල ශ්‍රමදාන වැඩසටහන් පැවැත්වීම.

(6) ත්‍රිකුණාමලය මිහිඳුපුර පාසලේ පාසල් වැසිකිලි හා නාන කාමර අලුත්වැඩියා කිරීම. පාසලේ අත්පන්දු පිටිය හා ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම හා 2018 අගෝස්තු 19 දින පාසලට අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ පරිත්‍යාග කිරීම.

(7) 2018 සැප්තැම්බර් 15 දින චීනවරාය රේවත ළමා නිවාසයේ දරුවන් 26 දෙනෙකු සඳහා දිවා ආහාරයළුළු, බාරදීමට උපකාර වීම හා පාසැල් උපකරණ බෙදා දීම.

(8) 2018 ජනවාරි 07 දින චීනවරාය ශ්‍රීලංගුහ විද්‍යාපීඨයේ ගොඩබිම් පුහුණු පක්ෂාංගය විසින් ත්‍රිකුණාමලය සමුද්‍රාසන්න ශ්‍රී විවේකාරාමයෙහි ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම.

(9) චීනවරාය ශ්‍රීලංගුහ විද්‍යා පීඨ රෝහල විසින් ත්‍රිකුණාමලය රේවත ළමා නිවාසය සඳහා දානය ලබා දීම.

(10) 67 වැනි ගුවන් හමුදා සංවත්සරය වෙනුවෙන් චීනවරාය ත්‍රි/සිද්ධාර්ථ විද්‍යාලයේ පළමු වසර දරුවන් සඳහා පන්ති කාමර පහසුකම් සැපයීම.

(11) ත්‍රිකුණාමලය රේවත ළමා නිවාසයේ ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම හා දානය පිරිනැමීම.

ආ. 2018 වර්ෂය තුල කටුනායක ශ්‍රීලංගුහ මූලික කඳවුර විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යපෘති පිලිබඳ තොරතුරු

| දිනය | ක්‍රියාකාරකම් |
|---|---|
| 2018.01.26 | 18 වන සැතපුම් කනුව, බෝධිරාජාරාමයේදී සිදු කල පිංකම |
| 2018.02.26 | 67 වැනි ගුවන් හමුදා සංවත්සරය වෙනුවෙන් පැවැත්වූ ලේ දන්දීමේ වැඩසටහන (මීගමුව මූලික රෝහල හා ජාතික ලේ බැංකුව සමග එක්ව) |
| 2018.02.27 | 67 වැනි ගුවන් හමුදා සංවත්සරය වෙනුවෙන් මීගමුව මූලික රෝහල් පරිශ්‍රයේ පැවැත්වූ විශේෂ ශ්‍රමදාන වැඩසටහන |
| 2018.02.28 | 67 වැනි ගුවන් හමුදා සංවත්සරය වෙනුවෙන් පැවැත්වූ විශේෂ ශ්‍රමදාන වැඩසටහන (20 වන සැතපුම් කණුව අසල සිට ප්‍රධාන ආරක්ෂක මැදිරිය තෙක් වන මාර්ගය පවිත්‍ර කිරීම) |
| 2018.03.05 | 67 වැනි ගුවන් හමුදා සංවත්සරය වෙනුවෙන් "ආනන්දපුර" ආබාධිත ළමා නිවාසයේදී පැවැත්වූ විශේෂ ශ්‍රමදාන වැඩසටහන |
| 2018.05.30 | මීගමුව වෙරළ තීරය අවට පැවැත්වූ විශේෂ ශ්‍රමදාන වැඩසටහන |
| 2018.06.26 | "අඟුරුකාරමුල්ල විහාරස්ථානයේ" සිදු කල විශේෂ ශ්‍රමදාන වැඩසටහන |
| 2018.06.30 | "හිනටියාන විහාරස්ථානයේ" මිහිඳු පෙරහැර සඳහා සේවා පුද්ගලයින්ගේ සහභාගිත්වය |
| 2018.07.04 | ලේ දන්දීමේ වැඩසටහන (කොටුගොඩ, ළමා හා මාතෘ සායනය විසින් සංවිධානය කරන ලද) |
| 2018.07.19 | ලේ දන්දීමේ වැඩසටහන (මීගමුව තැප්‍රෝබේන් වැඩසටහන් කළමනාකරණ ආයතනය විසින් සංවිධානය කරන ලද) |
| 2018.07.29 | ලේ දන්දීමේ වැඩසටහන (කිඹුලාපිටිය, හොරහේන මහින්දාරාම විහාරස්ථානය විසින් සංවිධානය කරන ලද) |
| 2018.08.22 | රාගම, තේවත්ත බැසිලිකා දේවස්ථානයේදී පැවැත්වූ විශේෂ ශ්‍රමදාන වැඩසටහන |
| 2018.09.19 | හඟ්ගල්ල ශ්‍රී නාගවනාරාම විහාරස්ථානයේදී පැවැත්වූ විශේෂ ශ්‍රමදාන වැඩසටහන |
| 2018.09.20 | හඟ්ගල්ල ශ්‍රී නාගවනාරාම විහාරස්ථානයේදී පැවැත්වූ විශේෂ ශ්‍රමදාන වැඩසටහන |
| 2018.11.02 | අඟුරුකාර විහාරස්ථානයේදී හා කදිරාන විහාරස්ථානයේදී පැවැත්වූ විශේෂ ශ්‍රමදාන වැඩසටහන් |
| 2018.11.10 | 2018 විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ "කඨින පූජාව" වෙනුවෙන් සිදු කල විශේෂ වැඩසටහන. |
| 2018.11.19 | කටුනායක ශාන්ත පීතර හා පාවුළු දේවස්ථාන වල පැවැත්වූ විශේෂ ශ්‍රමදාන වැඩසටහන |
| 2018.11.27 | මීගමුව ගෝතමී ආරාමයේ පැවැත්වූ විශේෂ ශ්‍රමදාන වැඩසටහන |
| 2018.11.29 | විලගෙදර, ගෝනවිල "වෙල්කම් විලේජ්" වැඩිහිටි නිවාසයේ පැවැත්වූ විශේෂ ශ්‍රමදාන වැඩසටහන |
| 2018.11.30 | විලගෙදර, ගෝනවිල "වෙල්කම් විලේජ්" වැඩිහිටි නිවාසයේ පැවැත්වූ විශේෂ ශ්‍රමදාන වැඩසටහන |

| | |
|---|---|
| 2018.12.07 | මීගමුව මූලික රෝහලේ පැවැත්වූ විශේෂ ශ්‍රමදාන වැඩසටහන |
| 2018.12.30 | සීදූව,රද්දොලුව ශ්‍රී අමර මහා විහාරස්ථානයේ පැවැත්වූ විශේෂ ශ්‍රමදාන වැඩසටහන |
| 2018.12.31 | අඟුරුකාර විහාරස්ථානයේදී හා කදිරාන විහාරස්ථානයේදී පැවැත්වූ විශේෂ ශ්‍රමදාන වැඩසටහන් |

## ඇ . 2018 වර්ෂය තුල වව්නියාව ශ්‍රීලංගුහ මූලික කඳවුර විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති පිලිබඳ තොරතුරු

(1) ඉරට්ටපෙරියකුලම්, පැරකුම් විද්‍යාලයේ පැවැත්වූ ශ්‍රමදාන වැඩසටහන (තණකොළ කැපීම)

(2) පුන්තාට්ටන් පුනරුත්තාපන ඒකකයේ පැවැත්වූ ශ්‍රමදාන වැඩසටහන (තණකොළ කැපීම)

(3) 67 වැනි ගුවන් හමුදා දිනය වෙනුවෙන් ගුණානන්ද ප්‍රාථමික විද්‍යාලයේ පැවැත්වූ ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති





(4) වව්නියාව සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය හා වව්නියාව පොලිස් ස්ථානය හා එක්ව පැවැත්වූ ඩෙංගු ශ්‍රමදාන වැඩසටහන.

(5) වෙසක් උළෙල සැමරීම වෙනුවෙන් පහත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී

(6) වව්නියාව ප්‍රධාන ආරක්ෂක මැදිරියේදී හා මඩුකන්ද රජමහාවිහාරස්ථානයේදී පැවැත්වූ දන්සල් වැඩසටහන.





(7) වව්නියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා එක්ව වෙසක් උත්සවය වර්ණවත් කිරීම සඳහා වෙසක් පහන් කුඩු නිර්මාණය කිරීම.





(8) තේක්කවත්ත ග්‍රාමීය සංවර්ධන සංගමයේ අවුරුදු උත්සවය සඳහා කූඩාරම් ලබා දීම.

(9) 111 නියමුවන් රහිත ගුවන්යානා බලසෘණයේ 10 වන සංවත්සරය වෙනුවෙන් ගුණානන්ද ප්‍රාථමික පාසලේ ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම

(10) ශ්‍රී සාරිපුත්‍ර දහම් පාසලේ දරුවන් වෙනුවෙන් පාසල් උපකරණ බෙදා දීම හා දන්සල පැවැත්වීම. වැඩසටහනේ සියලු සංවිධාන කටයුතු කඳවුර මඟින් සිදු කර ඇත.

(11) වව්නියාව ලංකා බැංකු පරිශ්‍රයේදී ලේ දන්දීමේ වැඩසටහනක් පැවැත්වීම හා ඊට සේවා පුද්ගලයින් 50 දෙනෙකු සහභාගී වීම






(12) මඩුකන්ද විහාරස්ථානයේදී ලේ දන්දීමේ වැඩසටහනක් පැවැත්වීම හා ඊට සේවා පුද්ගලයින් 50 දෙනෙකු සහභාගී වීම





(13) පැසිෆික් ඒන්ජල් වැඩසටහන් 2018 වව්නියාව අලගල්ල මහා විද්‍යාලයේදී පැවැත්වීම. ඒ ඒ ක්ෂේත්‍ර වල පළපුරුදු වෘත්තිකයින් විසින් දන්ත,වෛද්‍ය හා අක්ෂි සායන පවත්වන ලදී. තවද, එම වැඩසටහන අතරතුර හානියට පත්වූ පන්ති කාමර පිළිසකර කිරීමේ කටයුතුද සිදු කරන ලදී.





(14) මාවතුඔය ද්‍රෝණිය පවිත්‍ර කිරීම සඳහා කණ්ඩායමක් සැපයීම.සේවා පුද්ගලයින් 10 දෙනෙකු ඊට දෛනිකව සහභාගී විය





(15) ආපදාවට ලක්වූ ප්‍රදේශ වල ජනතාව සඳහා පානීය ජලය බෙදා හැරීම. වැඩසටහනෙහි සියලු කටයුතු කඳවුර මඟින් සංවිධානය කරන ලදී.





(16) පාවක්කුලම යාය 07 විහාරස්ථානයේ ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම.





## ඇ. 2018 වර්ෂය තුල අනුරාධපුරය ශ්‍රීලංගුහ මුලික කඳවුර විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යපෘති පිලිබඳ තොරතුරු

(1) 2018 අප්‍රේල් 27 දින ගුවන්හමුදාධිපති විසින් ඉදිකිරීම් නිම කල නිවාස ශ්‍රියාලතා මහත්මිය වෙත ප්‍රදානය කිරීම

(2) පාසැල් දරුවන් දෙදෙනෙකු හට ශිෂ්‍යත්ව 02ක් ප්‍රදානය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම හා 2018 අප්‍රේල් 05 දින ජපානයේ හිතවතුන් කණ්ඩායමක් විසින් පරිත්‍යාග කරන ලද ඇස්කණ්නාඩි 100ක් භාර ගැනීම

(3) 2018 ජුනි 27 දින සඳහිරු සෑය අභියසදී දිවා රාත්‍රී පොසොන් මහා දන්සැල පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම

(4) 2018 ජුනි මස 27 දින මිහින්තලේ විහාරස්ථානයේ පැවති ආලෝක පූජාව හා පාන් දන්සල ආරම්භ කිරීමේ උත්සවය සඳහා කඳවුරු අණ දෙන නිලධාරි හා කඳවුරු සුභසාධන නිලධාරි සහභාගී වීම

(5) ශ්‍රීලංගුභ අනුරාධපුර මුලික කඳවුරේ නිලධාරීන්, ගුවන්භටයින්, කාන්තා ගුවන්, සහ සිවිල් කාර්ය මණ්ඩලය සඳහා 2018 මාර්තු 26, ජුනි 18 හා දෙසැම්බර් 27 යන දින වල කඳවුරු ශ්‍රවණාගාරයේදී සුභසාධන සම්මන්ත්‍රණය පැවැත්වීම

(6) අනුරාධපුර රජයේ රෝහලේ ලේ බැංකුව වෙත ලේ පරිත්‍යාග කිරීම සඳහා සේවා පුද්ගලයින් 108 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ලේ දන්දීමේ වැඩසටහනක් පැවැත්වීම

(7) ශිෂ්‍යත්ව 05ක් (36000/= × 05) සහ ඇස් කණ්නාඩි 100ක් පරිත්‍යාග කිරීම සඳහා 2018 සැප් 6 දින ජපාන නියෝජිතන් පිරිසක් කඳවුර වෙත පැමිණීම

(8) 2018 නොවැ 03 දින මහින්ද මහා පිරිවෙනෙහි භික්ෂුන්වහන්සේ 100 දෙනෙකු සඳහා දන් පිරිනැමීම

(9) කඳවුරු සංවත්සරය සිහිකරමින් 2018 නොවැ 11 දින "සරණ" ළමා නිවාසයේ දරුවන්ට පාසැල් පොත් හා වියලි සලාක බෙදා දීම

(10) 2018 නොවැ 14 දින ඇස් කණ්නාඩි 200ක් පරිත්‍යාග කිරීම සඳහා ජපන් නියෝජිතයින් පිරිසක් කඳවුර වෙත පැමිණීම

(11) "My vision Optical" ආයතනයේ සහයද සහිතව සේවා පුද්ගලයින් හා සිවිල් සේවකයින් අතර නොමිලේ ඇස්කණ්නාඩි බෙදා දීම සඳහා 2018 නොවැ 30 දින විශේෂ අක්ෂි සායනයක් පැවැත්වීම

(12) දැනට සේවයේ නියුතු හා විශ්‍රාම ගිය සෙසු නිලයන් සඳහා නිවාඩු නිකේතනයක් ගුවන්හමුදාධිපති විසින් 2018 දෙසැ 21 දින විවෘත කිරීම

(13) 2018 දෙසැ 21 දින ගුවන්හමුදාධිපති විසින් "අබාන්ස්" ප්‍රදර්ශනාගාරයක් විවෘත කිරීම

(14) 2018 දෙසැ 22 දින රුවන්වැලිමහා සෑය ඉදිරිපිට පාන් දන්සැලක් පැවැත්වීම සංවිධානය කිරීම හා ගුවන්හමුදාධිපති ඇතුළු කාර්ය මණ්ඩලයේ 150 දෙනෙකු කංචුක පූජාව සඳහා සහභාගී වීම

## ඉ. 2018 වර්ෂය තුල හිඟුරක්ගොඩ ශ්‍රීලංගුහ මූලික කඳවුර විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති පිලිබඳ තොරතුරු

(1) පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ඇළහැර කොට්ඨාශයේ පෙරපාසල් දරුවන් සඳහා රජරට නවෝදය ව්‍යාපෘතිය මඟින් බකමූණ ප්‍රදේශයේ නව පෙර පාසලක් ඉදි කිරීම (ආයෝජනය කල මුදල රු.1,668,469.42)



(2) අරලගංවිල ප්‍රදේශයේ ජීවත්වන මූල්‍ය අපහසුතා සහිත පවුලක් සඳහා තමන්කඩුව කොට්ඨාශයේ රජරට නවෝදය ව්‍යාපෘතිය මඟින් නව නිවසක් ඉදි කර දීම (ආයෝජනය කල මුදල රු.1,603,484.83)



(3) බුබුල ප්‍රදේශයේ ජීවත්වන මූල්‍ය අපහසුතා සහිත පවුලක් සඳහා හිඟුරක්ගොඩ කොට්ඨාශයේ රජරට නවෝදය ව්‍යාපෘතිය මඟින් නව නිවසක් ඉදි කර දීම (ආයෝජනය කල මුදල රු.1,551,518.43)



(4) තමන්කඩුව කොට්ඨාශයේ රජරට නවෝදය ව්‍යාපෘතිය මඟින් සිංහරාජපුර පාසල පිළිසකර කිරීම (ආයෝජනය කල මුදල රු.1,387,408.14).



(5) මැදිරිගිරිය කොට්ඨාශයේ රජරට නවෝදය ව්‍යාපෘතිය මඟින් ප්‍රදේශවාසින් සඳහා අඹගස්වැව නීල සෙවන ඉදි කිරීම. (ආයෝජනය කල මුදල රු.1.295.737.46)



(6) හිඟුරක්ගොඩ කොට්ඨාශයේ රජරට නවෝදය ව්‍යාපෘතිය මඟින් මින්නේරිය දේවාලය පිළිසකර කිරීම (ආයෝජනය කල මුදල රු. 49.720.00 )



(7)	24 වන සංවත්සර සැමරුම් උළෙල නිමිති කොට ගෙන හිඟුරක්ගොඩ ශ්‍රීලංගුහ මූලික කඳවුරේ අංක 07 බලසනය විසින් ඇළහැර රන්දව්ගේඔය කනිෂ්ඨ විද්‍යාලයට රු.350.000.00ක් වටිනා පොත් සහ පොත් රාක්ක පරිත්‍යාග කිරීම, පුස්තකාල පහසුකම් වැඩි දියුණු කිරීම හා පුස්තකාලය පිළිසකර කිරීම.





(8)	23 වැනි සංවත්සර සැමරුම් උළෙල නිමිති කොට ගෙන අංක 09 බලසනය විසින් කුමුදුපුර ප්‍රාථමික විද්‍යාලයේ, බැබියවැව ප්‍රාථමික විද්‍යාලයේ, වඩිගවැව ප්‍රාථමික විද්‍යාලයේ සිසුන්, ගුරුවරුන් හා දෙමාපියන් ගේ ප්‍රයෝජනය සඳහා ලේසර් මුද්‍රණයන්ත්‍ර හා පාසැල් උපකරණ පරිත්‍යාග කිරීම හා ජල පිරිපහදු යන්ත්‍ර අලුත්වැඩියා කිරීම.





(9)	අංක 02 සැපයුම් හා නඩත්තු ඩිපෝව විසින් හිඟුරක්ගොඩ මිණිහිරි කාන්තා සුරැකුම් මධ්‍යස්ථානයේ විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන්ට දානමය පිංකමක් (රු 35,000.00ක වටිනාකමින්) පැවැත්වීම හා පොලොන්නරුව කොට්ටපිටිය පෙර පාසල සඳහා පාසැල් උපකරණ (රු.20,000.00ක වටිනාකමින්) පරිත්‍යාග කිරීම



(10) අංක 02 සැපයුම් හා නඩත්තු ඩිපෝව විසින් හිඟුරක්ගොඩ "ප්‍රාර්ථනා බෝධිය" අවට පරිශ්‍රයේ ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම



## ඊ. 2018 වර්ෂය තුල රත්මලාන ශ්‍රීලංගුහ මූලික කඳවුර විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යපෘති පිලිබඳ තොරතුරු

(1) රත්මලාන තරුණ බෞද්ධ සංගමය, රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගල්කිස්ස ශ්‍රී ධර්මාරාම විහාරය, පරම ධම්ම චේතිය පිරිවෙන, විජය නන්දසිරි මයාගේ නිවාස පන්සල පාර ගල්කිස්ස, නාරාහෙන්පිට ලේ පරිත්‍යාග කිරීමේ මධ්‍යස්ථානය, බෙල්ලන්විල රජමහා විහාරය හා සදහම් විහාරය යන ස්ථානවල පැවති ලේ දන්දීමේ වැඩසටහන් සඳහා සේවා පුද්ගලයින් 205 දෙනෙකු සහභාගී වීම

(2) <u>ඩෙංගු මර්ධන වැඩසටහන්</u>

රත්මලාන, මොරටුව, රාවතාවත්ත, බොරලැස්ගමුව, ජඳුරලිය සහ ගල්කිස්ස යන ප්‍රදේශ වල ක්‍රියාත්මක කරන ලද ඩෙංගු මර්ධන වැඩසටහන් සඳහා සේවා පුද්ගලයින් 1.506 දෙනෙකු සහභාගී වීම

(3) <u>ආගමික ක්‍රියාකාරකම්</u>

| දිනය | විස්තරය | ස්ථානය | සහභාගී වුවන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 2018.03.01 | පිච්ච මල් පූජාව | කැළණිය රජ මහා විහාරය | 25 |
| 2018.05.05 | අනුස්මරණ උත්සව | බෙල්ලන්විල රජමහා විහාරය | 24 |
| 2018.09.07 | ඇසල පෙරහැර | කොල්ලුපිටිය වාළුකාරම මහා පිරිවෙන | 30 |
| 2018.10.05 | මිහිඳු පෙරහැර | කපුගම ශ්‍රී සුමංගලාරාම විහාරය | 100 |
| 2018.10.27 | කඨින පිංකම | අත්තිඩිය මල්ලිකාරාම විහාරය | 30 |

(4) <u>ශ්‍රමදාන වැඩසටහන්</u>

| දිනය | විස්තරය | ස්ථානය | සහභාගී වූවන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 2018.01.06 සිට 2018.01.07 | ශ්‍රමදාන වැඩසටහන | මාම්පේ විජේවර්ධනාරාමය | 15 |
| 2018.05.28 සිට 2018.05.31 | කැළණිය ප්‍රදේශයේ පැවති ශ්‍රමදාන වැඩසටහන | කැළණිය පෙතියාගොඩ රජ මහා විහාරය | 40 |

(5) <u>විවිධ කටයුතු</u>

| දිනය | විස්තරය | ස්ථානය | සහභාගී වූවන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 2018.05.25 | සබරගමු පළාත් රණවිරු උපහාර වැඩසටහන | රත්නපුර නව නගරය | 55 |
| 2018.04.29 | වෙසක් දන්සල | රත්මලාන ශ්‍රීලංගුහ කඳවුරු පරිශ්‍රය | සියලුම සේවා පුද්ගලයින්, ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින් හා සිවිල් සේවකයින් |

## උ. 2018 වර්ෂය තුල කොළඹ ශ්‍රීලංගුහ කඳවුර විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යපෘති පිලිබඳ තොරතුරු

(1) 2018 මාර්තු 7 හා 8 දින වලදී ශ්‍රී පාදස්ථානය පිරිසිදු කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.



(2) 2018 මාර්තු 13 දින කොළඹ රජයේ රෝහල අලුත්වැඩියා කිරීමේ කටයුතු සිදු කිරීම




(3) 2018 ඔක්තෝබර් 01 දින දරුවන් සඳහා විශේෂ ළමා දින වැඩසටහනක් පැවැත්වීම. එම වැඩසටහනට අමතරව නවගත්තේගම රළපනාව ප්‍රාථමික පාසලේ දරුවන් 50 දෙනෙකු ප්‍රථම වරට කොළඹ නගරය අවට නැරඹීම සඳහා රැගෙන යාමෙන් ඔවුන්ට අමතක නොවන අත්දැකීමක් ලබා දීම



(4) කුඩමාදුව විහාරස්ථානය, ගංගාරාම විහාරස්ථානය, රාජගිරිය විහාරස්ථානය සහ කිරුළපන සුමිත්‍රාරාම විහාරස්ථානය යන විහාරස්ථානවල ඉදිකිරීම් ව්‍යාපෘති ආරම්භ කිරීම

(5) සී ඩබ් ඩබ් කන්නන්ගර විද්‍යාලයේ දන්ත සායනයක් පැවැත්වීම



(6) කැළණිය විහාරස්ථානයේ පිච්ච මල් පූජාවක් පැවැත්වීම.



(7) කලවාන විහාවී පුහුණු මධ්‍යස්ථානයේ පැවති වැඩසටහන

(8) ශ්‍රීලංගුහ කොළඹ කඳවුරේ හා කොළඹ නගරය අවට පැවති වෙසක් කලාපය.



## උෟ. 2018 වර්ෂය තුල පලාලි ශ්‍රීලංගුහ කඳවුර විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යපෘති පිලිබඳ තොරතුරු

(1) 2018 අගෝස්තු 12 දින තෙල්ලිප්පලෙයි කොට්ඨාශයේ ජනතාවගේ යහපත පිණිස යාපනය තෙල්ලිප්පලෙයි මූලික රෝහලේ පිරිමි වාට්ටුවේ පිළිසකර කිරීමේ කටයුතු ආරම්භ කිරීම. 2018 ඔක්තෝබර් 11 වන දින අලුත්වැඩියා කටයුතු අවසන් කරන ලද අතර එදිනම අලුත්වැඩියා කරන ලද වාට්ටුව රෝහල් වෛද්‍ය අධිකාරී වෙත භාර දීම.



(2) 2018 නොවැ 15 දින කුල්ලියාන්, විග්නේශ්වර මහා විද්‍යාලයේ ප්‍රාථමික අංශ ගොඩනැගිල්ල ඉදි කිරීම. මේ වන විට එම ව්‍යාපෘතියෙන් 60%ක් අවසන් කර ඇත.



එ. 2018 වර්ෂය තුළ දියතලාව ශ්‍රීලංගුහ සටන් පුහුණු පාසල විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යපෘති පිළිබඳ තොරතුරු

(1) රෝහල් සායනය, බදුල්ල



(2) නිවාස ව්‍යාපෘතිය ආරම්භ කිරීම, දියතලාව



(3) හපුතලේ ප්‍රදේශයේ පවත්වන ලද ශ්‍රමදාන වැඩසටහන.



(4) ආයුර්වේද රෝහලේ පවත්වන ලද ශ්‍රමදාන වැඩසටහන



(5) හපුතලේ බස් නැවතුම්පොළ විවෘත කිරීම.



(6) දියතලාව නගරයේ පවත්වන ලද ශ්‍රමදාන වැඩසටහන



(7) දියතලාව වැඩිහිටි නිවාසයේ පවත්වන ලද ශ්‍රමදාන වැඩසටහන

(8) දියතලාව සටන් පුහුණු පාසලේ අලුතින් ඉදි කරන ලද කබානා හා නිලධාරීන් සඳහා වන තුන් මහල් ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය .



(9) දියතලාව සටන් පුහුණු පාසලේ පිරිත් පිංකම් වැඩසටහන



(10) දියතලාව තැපැල් කාර්යාල පරිශ්‍රයේ පැවති ශ්‍රමදාන වැඩසටහන



## ඒ. 2018 වර්ෂය තුල ඉරණමඩු ශ්‍රීලංගුහ කඳවුර විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යපෘති පිලිබඳ තොරතුරු

| දිනය | වැඩසටහන |
|---|---|
| 2018 ජනවාරි 08 | රාමනාදපුරම් මහා විද්‍යාල ක්‍රීඩා පිටියේ ක්‍රිකට් තණ තීරුව රු. 250,000.00 ක වියදමින් ඉදි කිරීම. |
| 2018 පෙබරවාරි 23 | අලගපුරි ප්‍රාථමික විද්‍යාලයේ දරුවන් හා එම ප්‍රදේශයේ ජීවත් වන ප්‍රදේශවාසීන් සඳහා වෛද්‍ය හා දන්ත සායනයක් සංවිධානය කිරීම |
| 2018 මාර්තු 07 | ඉරණමඩු ශ්‍රීලංගුහ කඳවුරේ සේවා පුද්ගලයින් විසින් රාමනාදපුරම්, අලගපුරි ප්‍රාථමික විද්‍යාලයේ ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම |
| 2018 මාර්තු 09 | ඉරණමඩු ශ්‍රීලංගුහ කඳවුරේ සේවා පුද්ගලයින් විසින් රාමනාදපුරම් ප්‍රදේශයේ ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම |
| 2018 ජුනි 18 | කිලිනොච්චිය කනගපුරම් මහා විද්‍යාලයේ තාප්පයක් සහිත පාසල් භූමිය රු. 2,074,630.00 ක වියදමින් ඉදි කිරීම හා එය අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා විසින් විවෘත කිරීම |
| 2018 ජුලි 28 | රාමනාදපුරම්, අලගපුරි විද්‍යාලයේ ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම |
| 2018 ජුලි 30 | රාමනාදපුරම් අලගපුරි විද්‍යාලයේ හා ඉරණමඩු වැව ආශ්‍රිත හිස් භූමිය ආවරණය වන පරිදි පැල සිටුවීමේ වැඩසටහනක් පැවැත්වීම |
| 2018 සැප්තැම්බර් 30 | 2018 සැප් 30 දින අලගපුරි ප්‍රාථමික විද්‍යාලයේ රැස්වීම් ශාලාව ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම. ඊට ඇස්තමේන්තු ගත මුදල රු 4,334,989.48 වන අතර 2019 ජනවාරි 02 දින ඉදිකිරීම් අවසන් කර ඇත. |
| 2018 නොවැම්බර් 12 | ඉරණමඩු වැව ආශ්‍රිත ප්‍රදේශයේ පැල සිටුවීමේ වැඩසටහන කඳවුරු අණ දෙන නිලධාරීගේ හා ඉරණමඩු ශ්‍රීලංගුහ කඳවුරේ කාර්යමණ්ඩලයේ සියලු දෙනාගේ සහභාගිත්වයෙන් පැවැත්වීම |

## ඹ. 2018 වර්ෂය තුල අම්පාර ශ්‍රීලංගුහ කඳවුර විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යපෘති පිළිබඳ තොරතුරු

(1) අම්පාර හිමිදුරාව මහා විද්‍යාලයේ අලුතින් ඉදි කල රැස්වීම ශාලාව ගුවන්හමුදාධිපති විසින් 2018 මාර්තු 03 දින විවෘත කිරීම



(2) ශ්‍රීලංකා ගුවන් හමුදා 67 වැනි සංවත්සරය සඳහා ගුවන් සංදර්ශනය හා අධ්‍යාපනික ප්‍රදර්ශනය



(3) 2018 මාර්තු 3 දින සමනබැද්ද විහාරස්ථානයේ හා ගෝනගොල්ල රෝහලේ ශ්‍රමදාන වැඩසටහන් පැවැත්වීම



(4) 2018 මාර්තු 07 දින උහන, සරණ වැඩිහිටි නිවාසයේ දානමය පිංකමක් පැවැත්වීම



(5) 2018 ජුනි 16 දින අම්පාර පුමා 1 හන්දියේ පොසොන් පොහොය නිමිති කොට ගෙන කෝපි දන්සැලක් පැවැත්වීම



(6) 2018 අප්‍රේල් 30 වෙසක් පොහොය නිමිති කොට ගෙන දීඝවාපිය පරිවාර චෛත්‍යය අභියස විශේෂ ආගමික වැඩසටහනක් පැවැත්වීම

(7) 2018 ජුනි 06 දින උප ආරක්ෂක මැදිරියේ සිට හිමිදුරාව හන්දිය තෙක් මාර්ගය දෙපස පිරිසිදු කිරීමේ ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම

(8) 2018 ජුනි 23 බුද්ධංගල විහාරස්ථානයේ ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම

(9) 2018 ජුනි 27 දින පොසොන් පොහොය නිමිති කොට ගෙන කෝපි දන්සැලක් පැවැත්වීම.



(10) 2018 ජුලි 18 දින දහම් මැදුර විහාරස්ථානයේ පැවති රාමඤ්ඤය නිකායේ උපසම්පදා උත්සවය සඳහා සහභාගී වූ භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් දන් පිළිගැන්වීම.

(11) 2018 අගෝස්තු 10 වන දින අම්පාර ශ්‍රීලංගුභ කඳවුරේ අණ දෙන නිලධාරීතුමාගේ මග පෙන්වීම මත ආබාධිත පුද්ගලයෙකු සඳහා රෝද පුටුවක් පරිත්‍යාග කිරීම



(12) 2018 නොවැම්බර් 08 දින හිමිදුරාව විහාරස්ථානයේදී ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම

(13) 29 වන සංවත්සරය නිමිත්තෙන් 2018 නොවැම්බර් 12 දින දමන රෝහලේ ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම



(14) කඳවුරු රෝහලේ 29 වන සංවත්සරය සැමරීම වෙනුවෙන් 2018 නොවැම්බර් 15 දින ලේ දන්දීමේ වැඩසටහනක් පැවැත්වීම



## ඕ. 2018 වර්ෂය තුළ මුලතිව් ශ්‍රීලංගුභ කඳවුර විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යපෘති පිලිබඳ තොරතුරු

(1) මුලතිව් ශ්‍රීලංගුභ කඳවුර ඉදිරිපිට සිවිල් ජනයා සඳහා පානීය ජලය බිමට ගත හැකි ස්ථානයක් ඉදි කිරීම



(2) වැලිඔය ප්‍රදේශයේ විහාරස්ථාන 05ක් සඳහා වැසිකිලි ඒකක ඉදි කරදීම (කිරිඉබ්බන්වැව, නිකවැව, ඇතාවැටුණුවැව, මොනරවැව, ඇහැටුගස්වැව)



(3) පුදිකුඩිඉරිප්පු මාධ්‍ය මහා විද්‍යාලය සඳහා නලලිඳක් සවි කිරීම

## ඔෟ. 2018 වර්ෂය තුල සිගිරිය ශ්‍රීලංගුහ කඳවුර විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යපෘති පිලිබඳ තොරතුරු

(1) 2018 මාර්තු 05 දින කිඹිස්ස රෝහලේ ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම

(2) 2018 මාර්තු 06 දින දඹුල්ල රෝහලේ වෛද්‍යවරුන්ගේ සහයෝගයෙන් මෙම කඳවුරේදී ලේ දන්දීමේ වැඩසටහනක් පැවැත්වීම

(3) 2018 මාර්තු 08 දින තල්කොටේ ප්‍රාථමික විද්‍යාලයේ ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම

(4) 2018 අප්‍රේල් 20 දින කිඹිස්ස ශ්‍රීමහින්දාරාම විහාරස්ථානය විසින් සංවිධානය කරන ලද ශ්‍රමදාන වැඩසටහන සඳහා සහභාගී වීම

(5) 2018 අප්‍රේල් 20 දින මිල්ලවාන ශ්‍රී ගනේවිහාරය විහාරස්ථානය විසින් සංවිධානය කරන ලද ශ්‍රමදාන වැඩසටහන සඳහා සහභාගී වීම

(6) 2018 අප්‍රේල් 22 දින මාතලේ සමථ විපස්සනා භාවනා මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද ශ්‍රමදාන වැඩසටහන සඳහා සහභාගී වීම

(7) 2018 අප්‍රේල් 24 දින දඹුල්ල නගර සභාව විසින් සංවිධානය කරන ලද ශ්‍රමදාන වැඩසටහන සඳහා සහභාගී වීම

(8) 2018 අප්‍රේල් 28 දින කිඹිස්ස නාගලවැව විහාරස්ථානය විසින් සංවිධානය කරන ලද ශ්‍රමදාන වැඩසටහන සඳහා සහභාගී වීම

(9) 2018 මැයි 15 දින දඹුල්ල රෝහලේ වෛද්‍යවරුන්ගේ සහයෝගීත්වයෙන් මෙම කඳවුර තුල අක්ෂි සායන වැඩසටහනක් පැවැත්වීම

(10) හබරණ වෙසක් සතිය වෙනුවෙන් ශ්‍රී බෝධිරාජ ආරණ්‍ය සේනාසනය විසින් සංවිධානය කරන ලද ශ්‍රමදනා වැඩසටහන සඳහා සහභාගී වීම

(11) 2018 සැප්තැම්බර් 11 දින දඹුල්ල රෝහලේ වෛද්‍යවරුන්ගේ සහයෝගිත්වයෙන් මෙම කඳවුරේදී විශේෂ වෛද්‍ය සායනයක් පැවැත්වීම

## ක. 2018 වර්ෂය තුල වීරවිල ශ්‍රීලංගුහ කඳවුර විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යපෘති පිලිබඳ තොරතුරු

(1) 2018 මාර්තු 05 දින තිස්සමහාරාමය, සඳගිරිගම සුභද්‍රා වැඩිහිටි නිවාස පරිශ්‍රයේ පැවති ශ්‍රමදාන වැඩසටහන සඳහා සියලුම නිලයන් හා සිවිල් සේවකයින් සහභාගී වීම



(2) 2018 මාර්තු 3,4,5,6,7 සහ 8 යනාදින වලදී කාවන්තිස්සපුර, දෙබරවැව, පන්නිගමුව, යෝදකන්දිය, තිස්සමහාරාමය, මාගම යන ප්‍රදේශ ආවරණය කරමින් සිදු කල ඩෙංගු මර්ධන වැඩසටහන සඳහා සේවා පුද්ගලයින් සහභාගී වීම



(3) 2018 අප්‍රේල් 29 දින කඳවුර ඉදිරිපිට සේවා පුද්ගලයින් හා සිවිල් සේවකයින් එක්ව වෙසක් දින වැඩසටහන් පැවැත්වීම



(4) 2018 මැයි 05 දින වීරවිල විහාරස්ථානය විසින් එම විහාරස්ථානය තුල සංවිධානය කරන ලද පෙරහරේ රාජකාරී කටයුතු සඳහා සේවා පුද්ගලයින් සහභාගී වීම හා විහාරස්ථානයේදී බීම දන්සැලක් පැවැත්වීම



(5) 2018 මැයි 30 දින තිස්සමහාරාමය, සඳසිරිගම සුභද්‍රා වැඩිහිටි නිවාසයේ පවත්වන ලද ශ්‍රමදාන වැඩසටහන සඳහා සේවා පුද්ගලයින් හා සිවිල් සේවකයින් සහභාගී වීම



(6) 2018 මැයි 31 දින තිස්සමහාරාමය, සඳගිරිගම සුභද්‍රා වැඩිහිටි නිවාසයේ සේවා පුද්ගලයින් හා සිවිල් සේවකයින් විසින් වැඩසටහනක් පැවැත්වීම



(7) 2018 ජුනි 17 දින වීරවිල විහාරස්ථානයේ දහම් පාසල් දරුවන් හා ප්‍රදේශවාසින් සඳහා පානීය ජල පද්ධතියක් ස්ථාපිත කිරීම



(8) 2018 ජුනි 17 දින තිස්සමහාරාමය පරිනිර්වාන ප්‍රතිපදා භාවනා මධ්‍යස්ථානය සඳහා කඳවුරේ සේවා පුද්ගලයින්ගේ සහයෝගීත්වයෙන් නාන කාමර සංකීර්ණයක් ඉදිකිරිම.



(9) 2018 ඔක්තෝබර් 4 හා 6 දින වල දෙමලිය, වන්දම, මොණරාගල යන ප්‍රදේශ වල පැළ 5000 ක් රෝපණය කිරීම



## ඛ. 2018 වර්ෂය තුල කොග්ගල ශ්‍රීලංගුහ කඳවුර විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යපෘති පිලිබඳ තොරතුරු

| දිනය | වැඩසටහන |
|---|---|
| 2018 මාර්තු 05 | 67 වන ගුවන් හමුදා සංවත්සරය නිමිති කොට ගෙන කොග්ගල ශ්‍රීලංගුහ කඳවුරු කාර්ය මණ්ඩලය විසින් කොග්ගල සිට හබරාදුව දක්වා වෙරළ තීරය පිරිසිදු කිරීමේ විශේෂ ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම |
| 2018 මාර්තු 06 | ගාල්ල සම්බෝධිය ළමා නිවාසයේ විශේෂ ශ්‍රමදාන වැඩසටහනක් මෙම කඳවුරේ සේවා පුද්ගලයින් විසින් සිදු කිරීම |
| 2018 අප්‍රේල් 29 | **Catalina Grill** අවන්හල ඉදිරිපිට කඳවුරු සේවා පුද්ගලයින් විසින් බිස්කට් සමඟ කොත්තමල්ලි බීම දන්සැලක් පැවැත්වීම. |
| 2018 මැයි 17 | ප්‍රදේශයේ භික්ෂුන් වහන්සේලා සඳහා වෛද්‍ය ආධාර ලබා දීමේ වැඩසටහනක් පැවැත්වීම. කඳවුරු අණදෙන නිලධාරීගේ මඟ පෙන්වීම මත මෙම වැඩසටහන හිරුගල් දේවාලය විහාරස්ථානයේදී පවත්වන ලදී. |
| 2018 ජුනි 07 | මඩොල් දුව දූපත කැලිකසළ වලින් තොර ප්‍රදේශයක් බවට පත් කිරීමේ අරමුණින් කඳවුරේ සේවා පුද්ගලයින් විසින් විශේෂ ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම. දූපත තුල කසළ බැහැර කිරීමේ බඳුන් ස්ථානගත කිරීම |

| | |
|---|---|
| 2018 අගෝස්තු 24 | ශ්‍රීලංගුහ සේවා වනිතා ඒකකය මඟින් ගුවන්හට නිවසන පරිශ්‍රයේදී චිත්‍ර තරගයක් පැවැත්වීම. ඊට දරුවන් 33 දෙනෙකු සහභාගී වන ලදී. |
| 2018 අගෝස්තු 26 | කොග්ගල දේවගිරි විහාරයේ පවත්වන ලද විශේෂ ආගමික වැඩසටහනක් සඳහා කඳවුරු කාර්ය මණ්ඩලය සහභාගී වීම. |
| 2018 සැප්තැම්බර් 10 | හබරාදුව දිසා රෝහල් පරිශ්‍රය පිරිසිදුව හා පිළිවෙලට පවත්වාගෙන යාමේ අරමුණින් ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම |
| 2018 සැප්තැම්බර්16 | බරවා රෝගය පරික්ෂා කිරීමට ලේ සාම්පල ලබා ගැනීම සඳහා ගාල්ල වෛද්‍ය නිලධාරී කාර්යාලයේ වෛද්‍ය නිලධාරීන් හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් කඳවුර නිරීක්ෂණය කිරීම |
| 2018 ඔක්තෝබර් 19 | 2018 ඔක්තෝබර් 19 දින කොග්ගල ශ්‍රීලංගුහ කඳවුරේ 34 වන සංවත්සරය සමරන ලදී. හබරාදුව පොදු සුසානභූමිය, හබරාදුව දුම්රිය ස්ථානය, කොග්ගල වෙරල තීරය හා වෙල්හේන්ගොඩ වැඩිහිටි නිවාසය යන ස්ථානවල ශ්‍රමදාන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සංවත්සර සැමරුම ආරම්භ කිරීම.<br><br>කඳවුරු පරිශ්‍රය තුල භික්ෂුන් වහන්සේලා 34 නමක් වෙනුවෙන් දානමය පිංකමක් පැවැත්වීම හා සියලුම සේවා පුද්ගලයින්/සිවිල් සේවකයින් හා ප්‍රදේශවාසීන්ගේ සහභාගිත්වයෙන් සර්වරාත්‍රික පිරිත් සජ්ඣායනාවක් සිදු කිරීම . |

## ග. 2018 වර්ෂය තුල බජාගු ශ්‍රීලංගුහ කඳවුර විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යපෘති පිලිබඳ තොරතුරු

(1) 2018 පෙබරවාරි 9 දින ගම්පහ උන්නොරුව ළමා නිවාස දරුවන් සඳහා දානය දීමේ වැඩසටහනක් පැවැත්වීම



(2) 2018 මාර්තු 09 දින කටාන විරෝදාර රණවිරු වැඩිහිටි නිවාසය සඳහා දානය පිළිගැන්වීම



(3) 2018 දෙසැම්බර් 19 දින ආඬිඅම්බලම දේවස්ථානයේදී පවුල් 15ක් සඳහා වියලි සලාක මළු ලබා දීම



## ස. 2018 වර්ෂය තුල පිදුරුතලාගල ශ්‍රීලංගුහ කඳවුර විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යපෘති පිලිබඳ තොරතුරු

| දිනය | විස්තරය | ස්ථානය |
|---|---|---|
| 2018.01.04 | ශ්‍රමදාන වැඩසටහන | පිදුරුතලාගල ශ්‍රීලංගුහ කඳවුරේ ප්‍රධාන මුර කුටියේ සිට කඳු මුදුන තෙක් වන ප්‍රවේශ මාර්ගය පිරිසිදු කිරීමේ ශ්‍රමදාන වැඩසටහන |
| 2018.01.19 | ශ්‍රමදාන වැඩසටහන | නිදහස් දින සැමරුම නිමිති කොට ගෙන නුවරඑළිය "**MEN CAFEP**" පාසලේ ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම. |
| 2018.07.14 | පාසැල් ළමා පුස්තකාලය අලුත්වැඩියා කිරීම | සුරියගහපතන විද්‍යාලයේ පුස්තකාලය ඉදි කිරීම හා අලුත්වැඩියාවන් සිදු කිරීම |
| 2018.09.11 | ළමා ක්‍රීඩා පිටිය අලුත්වැඩියා කිරීම | නුවරඑළිය **Caritas** කන්‍යාරාමයේ ළමා ක්‍රීඩා පිටිය පිළිසකර කිරීම සඳහා අවශ්‍ය ශ්‍රම දායකත්වය හා සහය ලබා දීම . |

## න. 2018 වර්ෂය තුල ඒකල ශ්‍රීලංගුහ වෘත්තීය පුහුණු පාසල විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යපෘති පිලිබඳ තොරතුරු

(1) 2018 වර්ෂය තුල ඒකල ශ්‍රීලංගුහ වෘත්තීය පුහුණු පාසලේ ගුවන්යානා හා ගුවන් ගමන් ආශ්‍රිත ක්‍රියාකාරකම් වල සංවර්ධනය

(අ) පුහුණු සම්පත් ලෙස ප්‍රායෝගික පුහුණුවීම් සඳහා යොදා ගැනීමේ හා ප්‍රදර්ශනය කිරීමේ අරමුණිනින් **SBT** - 1610 **PT** - 06 ගුවන්යානය අලුත්වැඩියා කිරීම.

මෙම ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන්ම ගුවන්යානා සැකිලි සම්බන්ධ කාර්මික ශිල්පින්ගේ මෙන්ම හෙලිටුවර්ස් පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු පාඨමාලා හා සමගාමීව අනෙකුත් ගුවන් වෘත්තීන්වල පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහාද උපකාරී වේ. මෙමඟින් මුලික ගුවන්ගමන් පාලනයන් හා ගුවන් මෙහෙයුම් හා ගුවන්යානා නඩත්තු කිරීම සම්බන්ධයෙන් ප්‍රායෝගික හැදෑරීමක් සිදු කිරීමට ද අවකාශය සලසයි.



## ණ. 2018 වර්ෂය තුල මීරිගම ශ්‍රීලංගුහ කඳවුර විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යපෘති පිලිබඳ තොරතුරු

(1) 2018 පෙබරවාරි 27 දින කඳවුරු පරිශ්‍රයේදී ලේ දන් දීමේ වැඩසටහනක් පැවැත්වීම හා 67 වැනි ගුවන් හමුදා දිනය නිමිත්තෙන් 2018 පෙබරවාරි 28 දින මීරිගම සෙත්සෙවන වැඩිහිටි නිවාසයේ හා "අපේ ළමයි" ළමා නිවාසයේ ශ්‍රමදාන වැඩසටහන් පැවැත්වීම.

(2) මීරිගම කඳවුරේ 11 වන සංවත්සරය සැමරීම අරමුණින් 2018 මැයි 30 දින වෙදහන්දිය සිට කඳවුරු පරිශ්‍රය තෙක් ප්‍රවේශ මාර්ගය අලුත්වැඩියා කර අවට ප්‍රදේශය පවිත්‍ර කිරීම සඳහා ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම.

(3) ගුවන් ආරක්ෂණ අණ හා පාලන මධ්‍යස්ථානය සිය සංවත්සරය නිමිත්තෙන් 2018 ජුනි 26 දින කිතුලවල ආරණ්‍ය සේනාසන පරිශ්‍රයේ ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම.

(4) 2018 ජුලි 7 දින ගුවන්භටයින් 15 දෙනෙකුගේ සහභාගිත්වයෙන් මීරිගම සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලයේ ආවරණ ප්‍රදේශය තුල ඩෙංගු පාලන වැඩසටහනක් පැවැත්වීම.

(5) 2018 ජුලි 20 හා 21 දින වලදී ගුවන් බාලදක්ෂ නායක පුරෝගාමී වැඩමුළුව සාර්ථකව පැවැත්වීම.

(6) මීරිගම මුලික රෝහලේ ළමා රෝග විශේෂඥ වෛද්‍යවරයා සිදු කල ඉල්ලීම මත නිහාරිකාරක යන්ත්‍ර 04ක් අලුත්වැඩියා කර නැවත රෝහල වෙත භාර දීම.

(7) 2018 සැප්තැම්බර් 29 දින ගුවන්භටයින් 15 දෙනෙකුගේ සහභාගිත්වයෙන් මීරිගම සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලයේ ආවරණ ප්‍රදේශය තුල ඩෙංගු පාලන වැඩසටහනක් පැවැත්වීම.

(8) 2018 ඔක්තෝබර් 03 දින මීරිගම මුලික රෝහලේ තීන්ත ආලේප කිරීම සඳහා ගුවන්භටයින් 15 දෙනෙකු සහභාගී වීම.

(9) 2018 ඔක්තෝබර් 15 දින දිවුලපිටිය පළාත් සභාවේ සහයෝගයද සහිතව වෙද හන්දිය සිට මීරිගම ශ්‍රීලංගුහ කඳවුර දක්වා මාර්ගය නැවත කාපට් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

(10) 2018 දෙසැම්බර් 15 දින දිවුලපිටිය පළාත් සභාව, දිවුලපිටිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය යන ආයතන වල සහයෝගීත්වයෙන් දිවුලපිටිය ප්‍රදේශයේ තරුණ තරුණියන් 135 දෙනෙකු සඳහා මීරිගම ශ්‍රීලංගුහ කඳවුරේදී එක් දින නායකත්ව පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.

(11) 2018 නොවැම්බර් 12 දින පරිසර හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශයේ සහයද ඇතිව ඉඩම් සංරක්ෂණ ව්‍යාපෘතියේ සමාලෝචන රැස්වීම පැවැත්වීම හා රුක් රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

ත. 2018 වර්ෂය තුල පාලවි ශ්‍රීලංගුහ කඳවුර විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යපෘති පිළිබඳ තොරතුරු

(1) ශ්‍රී ලංකා "ගුවන් හමුදා පාපැදි සවාරිය" 1 වන අදියර හා 2 අදියර පාලවි ශ්‍රීලංගුහ කඳවුර විසින් පැවැත්වීම




(2) හිදායත් නහර් මුස්ලිම් මහා විද්‍යාලයේ එළිමහන් පන්ති කාමරයක් ඉදි කිරීම



(3) හිදායත් නහර් මුස්ලිම් මහා විද්‍යාලයේ ළමා උද්‍යානයක් ඉදි කිරීම

(4) හිදායත් නහර් මුස්ලිම් මහා විද්‍යාලයේ වැසිකිළි පිළිසකර කිරීම



(5) 2018 මාර්තු 29 හා 30 දෙදින පාලවී ශ්‍රීලංගුහ කඳවුරේ බෝම්බ නිෂ්ක්‍රීය පුහුණු පාසලේ දී වාර්ෂික පිරිත් සජ්ජායනාව සිදු කිරීම



(6) 2018 අප්‍රේල් 10 දින පාලවී ශ්‍රීලංගුහ කඳවුරේදී සූර්ය මංගල්‍යය -2018 අවුරුදු උළෙල සැමරීම

(7) 2018 දෙසැම්බර් 11 දින පාලවී ශ්‍රීලංගුහ කඳවුරේ වාර්ෂික සුහද හමුව හා ළමා සාදය පැවැත්වීම



ද. 2018 වර්ෂය තුල කටුකුරුන්ද ශ්‍රීලංගුහ කඳවුර විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති පිලිබඳ තොරතුරු

| දිනය | වැඩසටහන |
|---|---|
| 2018 ජනවාරි 08 | ඇතාගම අමරසේකර විද්‍යාලයේ හා කළුතර තාක්ෂණික විද්‍යාලයේ ශ්‍රමදාන වැඩසටහන් (තණකොළ කැපීම) පැවැත්වීම |
| 2018 ජනවාරි 18 හා 19 | කළුතර දිස්ත්‍රික්කයේ ඩෙංගු ශ්‍රමදාන වැඩසටහන |
| 2018 පෙබරවාරි 22 හා 23 | කළුතර දිස්ත්‍රික්කයේ ඩෙංගු ශ්‍රමදාන වැඩසටහන |
| 2018 පෙබරවාරි 24 | ශ්‍රීලංගුහ ගුවන් බාලදක්ෂ කණ්ඩායම සඳහා සුදුසුකම්ලත් දරුවන් බඳවා ගැනීමේ අරමුණින්, ගුවන් බාලදක්ෂ කණ්ඩායමේ සමාරම්භක උත්සවය හා බඳවාගැනීම් ප්‍රධාන බාලදක්ෂ නායක ගෲප් කපිතාන් ජේ ඒ පී එස් ජයවර්ධන හා කඳවුරු අණ දෙන නිලධාරී ගෲප් කපිතාන් බී ඒ එම් පී බාලසූරිය යන නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වීම |
| 2018 මාර්තු 06 | 67 වැනි ගුවන් හමුදා සංවත්සරය වෙනුවෙන් ජයන්ති ළමා නිවාසයේ ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම |
| 2018 මාර්තු 07 හා 08 | 67 වැනි ශ්‍රී ලංකා ගුවන් හමුදා සංවත්සරයට සමගාමීව "සොබා දහම සුරැකීමට කඳු මුදුනට නැගීම" යන තේමාව යටතේ ශ්‍රී පාදස්ථානය පිරිසිදු කිරීමේ වැඩසටහනක් පැවැත්වීම. මෙම කඳවුර නියෝජනය කරමින් සේවා පුද්ගලයින් 33 දෙනෙකු මෙම වැඩසටහනට සහභාගී විය |
| 2018 මාර්තු 09 | 67 වැනි ගුවන් හමුදා සංවත්සරයට සමගාමීව තලහිටිය විද්‍යාලයේ ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම |
| 2018 මාර්තු 15 | ශ්‍රීලංකා ගුවන් හමුදා සේවා වනිතා ඒකකයේ ගුවන්හමුදාධිපති නිවාස ව්‍යාපෘතිය යටතේ ඉදි කල දෙවන නිවස AW 01952 නායක ගුවන්කාන්තා මධුෂානි එම් එස් හට ප්‍රදානය කිරීම. මෙම ව්‍යාපෘතිය සඳහා මුල්‍ය දායකත්වය ශ්‍රීලංගුහ සේවා වනිතා ඒකකය මඟින් ලබා දෙන අතර ඉදි කිරීම් සිවිල් ඉංජිනේරු පක්ෂාංගය හා කටුකුරුන්ද ශ්‍රීලංගුහ කඳවුර මඟින් සිදු කර ඇත. |
| 2018 මාර්තු 22 හා 23 | කළුතර දිස්ත්‍රික්කයේ ඩෙංගු ශ්‍රමදාන වැඩසටහන |
| 2018 අප්‍රේල් 02 හා 09 | කළුතර දිස්ත්‍රික්කයේ ඩෙංගු ශ්‍රමදාන වැඩසටහන |
| 2018 මැයි 10 හා 11 | කළුතර දිස්ත්‍රික්කයේ ඩෙංගු ශ්‍රමදාන වැඩසටහන |
| 2018 මැයි 19 | රට වෙනුවෙන් දිවි පිදූ රණවිරුවන්ගේ මිල කල නොහැකි කැප කිරීම සංකේතවත් කරමින් කළුතර බෝධිය අභියස බෝධි පූජා වැඩසටහනක් පැවැත්වීම. |
| 2018 ජූනි 07 හා 08 | කළුතර දිස්ත්‍රික්කයේ ඩෙංගු ශ්‍රමදාන වැඩසටහන |
| 2018 ජූනි 21 හා 22 | කළුතර දිස්ත්‍රික්කයේ ඩෙංගු ශ්‍රමදාන වැඩසටහන |
| 2018 ජූනි 22 | කළුතර නගර සභාවේ පවිත්‍ර කිරීමේ වැඩසටහන සඳහා ට්‍රැක්ටරයක් ලබා දීම |

| | |
|---|---|
| 2018 ජුනි 27 | කළුතර නගර සභාවේ, රූපවාහිනි වෙසක් කලාපය සඳහා වෙසක් පහන් කූඩු 03 ක් නිර්මාණය කර ලබා දීම |
| 2018 ජුලි 12 හා 13 | කළුතර දිස්ත්‍රික්කයේ ඩෙංගු ශ්‍රමදාන වැඩසටහන |
| 2018 ජුලි 18 | කළුතර තාක්ෂණික විද්‍යාලයේ ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම |
| 2018 ජුලි 22 | ඇතාගම විහාරස්ථානයේ ඇසල පෙරහැර වැඩසටහන සඳහා සහභාගී වීම |
| 2018 ජුලි 10 | කළුතර මහමෙව්නා අසපුව විසින් සංවිධානය කරන ලද ලේ දන්දීමේ වැඩසටහන සඳහා සහභාගී වීම |
| 2018 සැප්තැම්බර් 26,27,28 හා 29 | කළුතර දිස්ත්‍රික්කයේ ඩෙංගු ශ්‍රමදාන වැඩසටහන |
| 2018 ඔක්තෝබර් 31 | ත්‍රිවිධ හමුදාවේ හා බැතිමතුන්ගේ සහභාගිත්වයෙන් පැවති කොස්ගොඩ විහාරස්ථානයේ ධාතු නිදන් කිරීමේ උත්සවයට සහභාගී වීම සඳහා ගුවන්හමුදාධිපති එයාර් මාර්ෂල් කේ වී බී ජයම්පති කඳවුරට පැමිණීම |
| 2018 නොවැම්බර් 05 | කටුකුරුන්ද ශාන්ත මයිකල් දේවස්ථානයේ ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම. |
| 2018 නොවැම්බර් 12 | කටුකුරුන්ද ජයන්ති ළමා නිවාසයේ ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම. |
| 2018 දෙසැම්බර් 13,14 | කළුතර දිස්ත්‍රික්කයේ ඩෙංගු ශ්‍රමදාන වැඩසටහන |

## ප. 2018 වර්ෂය තුල මඩකලපුව ශ්‍රීලංගුහ කඳවුර විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති පිලිබඳ තොරතුරු

(1) සිප්පිමඩු උන්නච්චි ප්‍රදේශයේ ප්‍රතිවනරෝපණ වැඩසටහන

(අ) ස්ථානයඃ සිප්පිමඩු උන්නච්චි

ආ) ආරම්භක දිනය ඃ 2018 මැයි 21

(ඇ) වැඩසටහන පිලිබඳ කෙටි විස්තරයඃ සිප්පිමඩු උන්නච්චි ප්‍රදේශයේ ආසන්න වශයෙන් හෙක්ටයාර 05ක් ආවරණය වන පරිදි පැළ 5000ක් සිටුවීමේ ප්‍රතිවනරෝපණ ව්‍යාපෘතිය මඩකලපුව ශ්‍රීලංගුහ කඳවුර විසින් දියත් කරන ලදී. ශ්‍රීලංගුහ විසින් පැළ රෝපණය කිරීම අවසන් කිරීමෙන් පසු අද වන විට මෙම ව්‍යාපෘතිය ප්‍රාදේශීය වන සංරක්ෂණ කාර්යාලය විසින් භාර ගෙන ඇත.

(2) වෙසක් පුර ලොස්වක පොහොය දිනයේදී බැතිමතුන් සඳහා බිස්කට් සමඟ කිරි කෝපි දන්සලක් සංවිධානය කිරීම

(අ) දිස්ත්‍රික්කය ඃ මඩකලපුව

(ආ) ප්‍රතිලාභීන් ඃ මඩකලපුව ප්‍රදේශයට පැමිණෙන බැතිමතුන්

(ඇ) දින ඃ 2018 අප්‍රේල් 29 , 30 හා 2018 මැයි 01

(ඈ) වැඩසටහන පිලිබඳ කෙටි විස්තරයඃ ප්‍රධාන ආරක්ෂක මැදිරිය ඉදිරියෙන් ඇති මාර්ගයේ ගමන් කරන බැතිමතුන් හා ගම්වාසීන් සඳහා ස්කට් සමඟ කිරි කෝපි පිළිගැන්වීම

(3) ලෝක ළමා දිනය සැමරීම අරමුණින් දෙමළ ජාතික පෙර පාසැල් දරුවන් සඳහා දෙදින විනෝද චාරිකාවක් සංවිධානය කිරීම

(අ) ආසන්න වශයෙන් ව්‍යාපෘති වියදම ඃ රු. 75000.00

(ආ) ප්‍රතිලාභීන් ඃ දෙමළ ජාතික දෙමාපියන් හා දරුවන්(60දෙනෙකු)

(ඇ) වැඩසටහන පිලිබඳ කෙටි විස්තරය ඃ ශ්‍රීලංගුහ රයිෆල් ග්‍රීන් ක්‍රීඩාංගනයේ පැවති ලෝක ළමා දින සැමරුමට සමගාමීව මෙම ප්‍රදේශයේ වාසය කරන දෙමළ ජාතික පෙර පාසැල් දරුවන් සඳහා දෙදින විනෝද චාරිකාවක් සංවිධානය කිරීම වායුසමීකරණය කල බස් රථ දෙකක්, ආහාර හා නවාතැන් පහසුකම් ශ්‍රීලංගුහ විසින් සපයන ලදී.

(4) කඳවුර අසල ජීවත් වන දෙමළ ජාතික වැඩිහිටියන් හා දරුවන් සඳහා විනෝද වැඩසටහනක් සංවිධානය කිරීම.

(අ) ත්‍යාග සඳහා ආසන්න වියදම : රු. 15000.00

(ආ) ප්‍රතිලාභීන් : දෙමළ ජාතික වැඩිහිටියන් හා දරුවන් (45 දෙනෙකු)

(ඇ) වැඩසටහන පිලිබඳ කෙටි විස්තරය :කඳවුර අසල ජීවත්වන දෙමළ ජාතික වැඩිහිටියන් හා දරුවන් සඳහා විනෝද වැඩසටහනක් සංවිධානය කිරීම හා වාර්ෂික කඳවුරු ළමා සාදය පැවැත්වීමේදී ඔවුන් අතරද ත්‍යාග බෙදා දීම.

(5) ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතියක් ලෙස දෙම ජාතික දරුවන් සඳහා පෙර පාසලක් පවත්වාගෙන යාම.

(අ) ප්‍රතිලාභීන් : දෙමළ ජාතික දරුවන් (දරුවන් 40)

(ආ) වැඩසටහන පිලිබඳ කෙටි විස්තරයඃ ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතියක් ලෙස මෙම ප්‍රදේශයේ ජීවත් වන දෙමල ජාතික දරුවන් සඳහා පෙර පාසලක් පවත්වාගෙන යාම (ප්‍රාග්ධන වියදම හා මිනිස් ශ්‍රමය ශ්‍රීලංගුහ විසින් සපයයි)

## ඛ. 2018 වර්ෂය තුල ශ්‍රීලංගුහ විධායක කෘෂි ඒකකය විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යපෘති පිලිබඳ තොරතුරු

2018 වර්ෂය තුල මෙම ඒකකය විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති පිලිබඳ විස්තර පහත පරිදිය.

| දිනය | ස්ථානය | වැඩසටහන |
|---|---|---|
| 2018 මාර්තු 03 සහ 05 | ශ්‍රීලංගුහ කඳවුර අම්පාර | ගුවන් හමුදා ප්‍රදර්ශනය හා සැණකෙළිය 2018 |
| 2018 ජුලි 20 සහ22 | ශ්‍රීලංගුහ කඳවුර වීරවිල | ගුවන් හමුදා ප්‍රදර්ශනය හා සැණකෙළිය 2018 |
| 2018 අගෝස්තු 03 සහ 05 | බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව | **Ayurveda Expo** 2018 ප්‍රදර්ශනය |
| 2018 සැප්තැම්බර් 24 සහ 28 | විධායක කෘෂි ඒකකය ශ්‍රීලංගුහ මුලික කඳවුර කටුනායක | කිරි නිෂ්පාදනය සම්බන්ධයෙන් සේවා පුද්ගලයින් සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන |
| 2018 දෙසැම්බර් 07 හා 09 | බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව | ජාතික ආහාර ප්‍රදර්ශනය 2018 - (ප්‍රදර්ශනයේ පැවති හොඳම ප්‍රදර්ශන කුටියට හිමි රන් සම්මානය) |
| 2018 දෙසැම්බර් 18 | විධායක කෘෂි ඒකකය ශ්‍රීලංගුහ මුලික කඳවුර කටුනායක | මීගමුව ආවේ මරියා කන්‍යාරාමයේ ගුරුවරියන් හට බොන්සායි තාක්ෂණය පිලිබඳ පුහුණු වැඩසටහන. |

## 6. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආයතනික ව්‍යුහය

ශ්‍රීලංකා ගුවන් හමුදාවේ ආයතනික ව්‍යුහය "ඇමුණුම අ"ලෙස මෙම වාර්තාවට යා කර ඇත..

## 7. විගණන හා කළමනාකරණ කමිටුව

### අ. විගණන කමිටු හා කළමනාකරණ කමිටු ප්‍රඥප්තිය

2009 ජූලි 09 දින මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල විගණන කමිටු හා කළමනාකරණ කමිටු චක්‍රලේඛය හා ඉන් පසුව 2019 ජනවාරි 09 දින නිකුත් කල චක්‍රලේඛය මඟින් විගණන කමිටු හා කළමනාකරණ කමිටු විෂය පථය පාලනය කරනු ලබයි. රජයේ දෙපාර්තමේන්තු වලට අදාලව එම චක්‍රලේඛ මඟින් දන්වා ඇති අවශ්‍යතාවයන්, ඉහත කමිටුවට අයත් කාර්යයන්ගේ විෂය පථය හා සීමාවන් මඟින් ඉටු වන බවටද කමිටුව තහවුරු කරයි.

### ආ. මූලික අවධානය

විගණකාධිපති හා අභ්‍යන්තර විගණකවරුන් විසින් වාර්තා කරන ලද මූල්‍ය විනය පිලිබඳ අවදානමක් සහිත ක්ෂේත්‍ර මෙන්ම කමිටුවේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පෞද්ගලිකව අවධානය යොමු කිරීමට හා ඒවා සම්බන්ධයෙන් කඩිනම් විසඳුම් ගැනීමටද කමිටුවට හැකියාව පවතී.

### ඇ. වාර්තාකරණ මාධ්‍යය

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වල කාර්යපටිපාටින්, මණ්ඩල රැස්වීමේදී සභාගත කර ඇති අතර එහිදී සියලු ප්‍රධාන කරුණු, සැලකීම්, සිදු කල ක්‍රියාවන්, අත්කරගත් හා අත්කරගැනීමට තිබෙන ප්‍රතිඵල සහ ආරම්භ කල පසු විපරම් ආදිය සම්බන්ධයෙන් පැහැදිලි කිරීම හා සාකච්ඡා කිරීම සිදු කර ඊට මණ්ඩලයේ අනුමැතියද ලබා ගෙන ඇත.

### ඈ. සංයුතිය

(1) අදාළ භාණ්ඩාගාර චක්‍රලේඛය මඟින් ලබා දී ඇති උපදෙස් පරිදි ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම මාස තුනකට වරක් පවත්වනු ලබයි. කමිටු සංයුතිය පහත පරිදිය.

(ආ). ප්‍රධාන අභ්‍යන්තර විගණක - ආරක්ෂක අමාත්‍යංශ (කමිටු සාමාජික).

(ඇ). අධ්‍යක්ෂ මුදල් ශ්‍රීලංගුහ (කමිටු සාමාජික).

(ඈ ). මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශය - කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙක් (කමිටු සාමාජික).

(ඉ). අධ්‍යක්ෂ සැපයුම් (ශ්‍රීලංගුහ කමිටු සාමාජික).

(ඊ). අධ්‍යක්ෂ පරිපාලන (ශ්‍රීලංගුහ කමිටු සාමාජික).

(උ). අයවැය අධ්‍යක්ෂ (ශ්‍රීලංගුහ කමිටු සාමාජික ).

(ඌ). විධායක අභ්‍යන්තර විගණක (සේවා) ශ්‍රී ලංකා ගුවන් හමුදාව (කැඳවුම්කරු)

(එ). ප්‍රධාන අභ්‍යන්තර විගණක (සිවිල්) ශ්‍රී ලංකා ගුවන් හමුදාව (කැඳවුම්කරු)

(ඒ). විගණන අධිකාරී - විගණකාධිපති දෙපාර්තමේන්තුව (නිරීක්ෂක).

(2) මෙම කමිටුවේ සාමාජිකයකු වීමට අවශ්‍යයෙන්ම තිබිය යුතු මූල්‍ය පිළිබඳ නිපුණත්වය, අත්දැකීම, දක්ෂතාවය, පසුබිම සහ යෝග්‍ය මට්ටමේ ස්වාධීනත්වය මෙම සාමාජිකයින් සතුය.

## ඉ. විගණන කමිටු ලේකම්

මෙම කමිටුවේ හවුල් ලේකම්වරුන් (කැඳවුම්කරුවන්) ලෙස විධායක අභ්‍යන්තර විගණක (සේවා) හා ප්‍රධාන අභ්‍යන්තර විගණක (සිවිල්) ක්‍රියා කරන අතර ඔවුන් පිළිවෙලින් වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී හා රජයේ ගණකාධිකාරී (I පන්තිය) තනතුරු දරන නිලධාරීන් වේ.

## ඊ. අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන කාර්යයන් වල ස්වාධීනත්වය, වාස්තවිකත්වය හා කාර්යසාධනය මෙන්ම දෙපාර්තමේන්තු සම්පත් වල ප්‍රමාණවත්භාවය සමාලෝචනය කිරීම.

(1) රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශය විසින් නිකුත් කල අභ්‍යන්තර විගණන ප්‍රතිපත්තිය හා චක්‍රලේඛය මෙන්ම එමගින් ලබා දී ඇති උපදෙස් මත පිහිටා සිදු කල විගණනයන් පිළිබඳ සමාලෝචනය කිරීම

(2) 2018 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ඇති ඵලදායිතාව සමාලෝචනය කිරීම

(3) නිසි නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම සඳහා අභ්‍යන්තර විගණන මගින් අනාවරණය වූ සුවිශේෂී කරුණු හා ඒවාට කළමනාකාරිත්වය මගින් ලබා දුන් ප්‍රතිචාර සමාලෝචනය කිරීම

(4) විධායක අභ්‍යන්තර විගණක (සේවා) හා ප්‍රධාන අභ්‍යන්තර විගණක (සිවිල්) ගේ කාර්යසාධන ඇගයුම හා අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලයේ ඇගයුම් සමාලෝචනය කිරීම

(5) විමර්ශන අංශයේ කාර්ය මණ්ඩලයට විශේෂ අවධානය යොමු කරවමින් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ පුහුණු හා සංවර්ධන අවශ්‍යතා සහ විශේෂිත පුහුණු සඳහා වන ඉල්ලීම් මෙන්ම ශක්‍යතා ගොඩනැගීම සඳහා වන අවශ්‍යතාවය සමාලෝචනය කිරීම

## උ. බාහිර විගණනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති විසින් බාහිර විගණනයන් සිදු කර ඇත.

(1) 2017 වර්ෂය සඳහා සිදු කල විගණනයන්ට අදාලව විගණකාධිපති විසින් හඳුනාගත් විගණන කරුණු සමාලෝචනය කිරීම හා පසු විපරම් කිරීම

(2) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගිණුම් සම්බන්ධයෙන් විගණකාධිපති විසින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත යොමු කරන ලද වාර්තාව හා කළමනාකාරිත්වය විසින් එම වාර්තාවේ කරුණු සම්බන්ධයෙන් දැක්වූ ප්‍රතිචාර සමාලෝචනය කිරීම හා ඒවා නිවැරදි කිරීමට ශ්‍රීලංගුහ විසින් ගන්නා ලද පියවර පසු විපරම් කිරීම

(3) විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ලද ප්‍රධාන වාර්තා සමාලෝචනය කිරීම හා සාකච්ඡාවට භාජනය කිරීම හා අවශ්‍යයැයි හැඟෙන ක්‍රියාමාර්ග ආරම්භ කිරීම

(4) 2018 දෙසැම්බර් 31 දිනට අවසන් වන වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය ප්‍රකාශන හා මූලික කඳවුරු/කඳවුරු මට්ටමින් පැවති උප අග්‍රිම විගණනයට ලක් කිරීම සඳහා විධායක අභ්‍යන්තර විගණක (සේවා) හා ප්‍රධාන අභ්‍යන්තර විගණක (සිවිල්) විසින් විගණන සැලැස්ම - 2018 ඉදිරිපත් කිරීම

(5) අවශ්‍ය තොරතුරු කාලානුරූපිව ඉදිරිපත් කිරීම

(6) මෙහෙයුම් වලට අදාළ විගණන ක්‍රියාවලියේ ඵලදායි බව පිළිබඳ කළමනාකාරිත්වය දැක්වූ ප්‍රතිචාරය

(7) 2018 වර්ෂයේ විගණනයට අදාලව විගණකයින් විසින් හඳුනාගත් අතුරු හා අවසන් විගණන කරුණු

## ඌ. විශේෂ මූලාරම්භයන්

වංචා වැලැක්වීම සඳහා අභ්‍යන්තර පාලනයේ ඇති වැදගත්කම මත ශ්‍රීලංගුහ මෙහෙයුම් කාර්යමණ්ඩලය පුහුණු කිරීමට විධායක අභ්‍යන්තර විගණක(සේවා) හා ප්‍රධාන අභ්‍යන්තර විගණක (සිවිල්) කාර්යාල මෙහෙයවීම

## එ. පාලනය

අදාළ රජයේ චක්‍රලේඛ වලට විශේෂ අවධානය යොමු කරමින් කමිටුව විසින් ක්‍රියාත්මක කරන ලද යහපාලන ක්‍රියාමාර්ගයන් අඛණ්ඩව සමාලෝචනය කිරීම

## 8. සමාප්තිය

සමස්ථයක් ලෙස, ශ්‍රී ලංකා ගුවන් හමුදාව 2018 වර්ෂයේදී විශාල සාර්ථකත්වයක් ළගා කරගෙන ඇත. සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් සැලකිය යුතු ප්‍රමාණයක් සාර්ථකව සම්පූර්ණ කරන ලද අතර සැලසුම්කරණයේ අඛණ්ඩත්වය තහවුරු කරමින්, සිදු නොකල ක්‍රියාකාරකම් 2019 වර්ෂයට සුදුසු පරිදි ගෙන යන ලදී. වැඩිදුරටත් සංශෝධන අවශ්‍යව තිබූ ක්‍රියාකාරකම් සුදුසු පරිදි 2019 වර්ෂයේ සැලසුම් කටයුතු වලට යලි ඇතුලත් කරන ලදී. විධිමත් මූල්‍ය ප්‍රතිපත්තියක් සහ පුහුණු, අත්දැකීම් සපිරි මිනිස් ශ්‍රමය ඵලදායී ලෙස සේවයේ යෙදවීම මගින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව සමාලෝචිත වර්ෂයේදී උසස් මට්ටමකට ළගාවූ අතර දේශයේ පශ්චාත් යුධ ආර්ථික වර්ධනයට විවිධාකාර නව පැතිකඩයන්ගෙන් යහපත් දායකත්වයක් සපයන ලදී.

## 9. කෙටි යෙදුම්

| | |
|---|---|
| AAP | - වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම |
| A&I | - එකතු කිරීම් හා වැඩිදියුණු කිරීම් |
| ADOC | - එකතු කිරීම් හා වැඩිදියුණු කිරීම් |
| AEW | - ගුවන්යානා ඉංජිනේරු පක්ෂාංගය |
| AFHQ | - ගුවන් හමුදා මුලස්ථානය |
| AFBM | - ගුවන් හමුදා කළමනාකරණ මණ්ඩලය |
| AMC | - විගණන හා කළමනාකරණ කමිටුව |
| AMRACS | - රාජකීය ගුවන් සංගමයේ ආශ්‍රිත සාමාජික |
| AMSA | - ඕස්ට්‍රේලියානු සමුද්‍රීය ආරක්ෂක අධිකාරිය |
| AMSCC | - ගුවන් හා නාවික උපායමාර්ගික අණ මධ්‍යස්ථානය |
| AO | - ගණන්දීමේ නිලධාරී |
| AOW | - ගුවන් යානා අළුත්වැඩියා කිරීමේ පක්‍ෂාංගය |
| Aowc | - මිත්‍ර නිලධාරීන්ගේ යුධ පාඨමාලාව |
| ASW | - ගුවන් ඉංජිනේරු සහයක පක්ෂාංගය |
| ATC | - ගුවන් ගමන් පාලනය |
| B.A (Def.Stu) | - ශාස්ත්‍රවේදී උපාධිය (ආරක්ෂක අධ්‍යයනය) |
| CAASL | - සිවිල් ගුවන් සේවා අධිකාරිය, ශ්‍රී ලංකාව |
| CATIC | - චීන ජාතික ගුවන් තාක්ෂණික ආනයන හා අපනයන සමාගම |
| CAO | - ප්‍රධාන ගණන්දීමේ නිලධාරී |
| CBA (CASL) | - සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරී (වරලත් ගණකාධිකාරී ශ්‍රී ලංකාව) |
| CDO | - විධායක දන්ත වෛද්‍ය නිලධාරී |
| CDPO | - විධායක සංවර්ධන ව්‍යපෘති නිලධාරී |
| CEB | - ලංකා විදුලි බල මණ්ඩලය |
| CFSO | - විධායක ගුවන් ආරක්ෂණ නිලධාරී |
| CIA (C) | - ප්‍රධාන අභ්‍යන්තර විගණක (සිවිල්) |
| CIA (S) | - විධායක අභ්‍යන්තර විගණක (සේවා) |
| CIRE (FW) | - විධායක උපකරණ වර්ගීකරණ පරීක්ෂක (Fixed wing) |
| CIRE (RW) | - විධායක උපකරණ වර්ගීකරණ පරීක්ෂක (Rotary wing) |
| CITO | - ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරී |
| CMO | - සිවිල් - යුධ මෙහෙයුම් |
| COPA | - රාජ්‍ය ගිණුම් පිලිබඳ කාරක සභාව |
| COVAF | - අණ දෙන නිලධාරී ස්වේච්ඡා ගුවන් හමුදාව |
| CRD Cell | - විධායක පර්යේෂණ හා සංවර්ධන ඒකකය |
| CRDO | - විධායක පර්යේෂණ හා සංවර්ධන නිලධාරී |
| CRO | - ප්‍රධාන බඳවාගැනීමේ නිලධාරී |
| CSO | - විධායක ක්‍රීඩා නිලධාරී |
| CSR | - ආයතනික සමාජ වගකීම් |
| CQAI | - විධායක තත්ත්ව නිරීක්ෂණ ඒකකය |
| CQAO | - විධායක තත්ත්ව නිරීක්ෂණ නිලධාරී |
| CWPO | - විධායක සුභසාධන ව්‍යාපෘති නිලධාරී |
| D. Av. Med. | - ගුවන් සේවා වෛද්‍ය ඩිප්ලෝමාව |
| DA | - පරිපාලන අධ්‍යක්ෂ |
| DAE | - ගුවන් ඉංජිනේරු අධ්‍යක්ෂ |
| DAO | - ගුවන් මෙහෙයුම් අධ්‍යක්ෂ |

| | |
|---|---|
| D Bgt | - අයවැය අධ්‍යක්ෂ |
| DCA | - සිවිල් පරිපාලන අධ්‍යක්ෂ |
| DCE | - සිවිල් ඉංජිනේරු අධ්‍යක්ෂ |
| Def | - ආරක්ෂණ |
| DETE | - විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යක්ෂ |
| DF | - මුදල් අධ්‍යක්ෂ |
| DGE | - සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂ |
| DGO | - ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂ |
| DHS | - සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| DL | - සැපයුම් අධ්‍යක්ෂ |
| D Legal | - නීති අධ්‍යක්ෂ |
| DMC | - ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය |
| DT | - පුහුණු අධ්‍යක්ෂ |
| DW | - සුභසාධන අධ්‍යක්ෂ |
| ECM | - විද්‍යුත් ප්‍රති මිනුම් |
| EEZ | - අනන්‍ය ආර්ථික කලාපය |
| EOD | - බෝම්බ නිෂ්ක්‍රිය නියෝග |
| EPM | - විද්‍යුත් ආරක්ෂණ මිනුම් |
| FIR | - ගුවන් තොරතුරු කලාපය |
| FSI | - ගුවන් ආරක්ෂණ නිලධාරී |
| FTW | - පියාසර පුහුණු පක්ෂාංගය |
| GEW | - සාමාන්‍ය ඉංජිනේරු පක්ෂාංගය |
| HADR | - මානුෂිය ආධාර හා ආපදා සහන |
| HCA | - මානුෂිය ප්‍රජා සත්කාර |
| HUD | - තමන් ඉදිරියේ ඇති දර්ශනය හරහා විනිවිදයමින් දත්ත පෙන්වන තිරය |
| KDU | - කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය |
| IAD | - අභ්‍යන්තර විගණන අංශය |
| IAF | - ඉන්දීය ගුවන් හමුදාව |
| IAI | - ඊශ්‍රායලයේ ගුවන් කර්මාන්ත සම්බන්ධ නිෂ්පාදකයෙක් |
| ICAO | - ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය |
| IELTS | - ජාත්‍යන්තර ඉංග්‍රීසි භාෂාව පරික්ෂා කිරීමේ ක්‍රමවේදය |
| IT | - තොරතුරු තාක්ෂණය |
| ITU | - තොරතුරු තාක්ෂණ ඒකකය |
| JMSDF | - ජපන් ස්වයං ආරක්ෂක සාගරික බලකාය |
| LFD | - පුළුල් තිරය |
| LTTE | - දෙමල ඊලාම් විමුක්ති කොටි සංවිධානය |
| MACA | - සිවිල් අධිකාරියට යුධ ආධාර |
| M Eng | - ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු පශ්චාත් උපාධිය |
| M Sc (Def Stu) | - විද්‍යාපති උපාධිය (ආරක්ෂක අධ්‍යයන) |
| M Sc (Def Strat Stud) | - විද්‍යාපති උපාධිය (ආරක්ෂක හා උපායමාර්ග පිලිබඳ අධ්‍යයනය) |
| M.A. (London) | - ශාස්ත්‍රපති උපාධිය (ලන්ඩන්) |
| MAIAA | - ගුවන් ගමන් හා අභ්‍යාවකාශ ගමන් පිලිබඳ ඇමරිකානු ආයතනයේ සාමාජික |
| MSc. | - විද්‍යාපති උපාධිය |
| MAAT (SL) | - ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පිය ආයතනයේ සාමාජික |
| MBA | - ව්‍යාපාර පරිපාලනය පිලිබඳ පශ්චාත් උපාධිය |
| MBS (Col) | - ව්‍යාපාර අධ්‍යයනය පිලිබඳ පශ්චාත් උපාධිය (කොළඹ) |

| | |
|---|---|
| MBBS | - කායික වෛද්‍ය හා ශල්‍ය වෛද්‍ය උපාධිය |
| MDS | - ආරක්ෂක අධ්‍යයනය පිලිබඳ පශ්චාත් උපාධිය |
| M (SL) | - ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනයේ සාමාජික |
| Mgt | - කළමනාකරණය |
| MMSc(Strat Stu-China) | - යුධ විද්‍යාව පිලිබඳ පශ්චාත් උපාධිය (උපායමාර්ගික අධ්‍යයනය - චීනය) |
| MPhil | - දර්ශනපති උපාධිය |
| MSc.(MOA) | - විද්‍යාපති උපාධිය (යුධ මෙහෙයුම්) |
| MTROW | - රථවාහන ගමනාගමන හා අලුත්වැඩියා කිරීමේ පක්ෂාංගය |
| NCOs | - අධිකාරී නොලත් නිලධාරීන් |
| ndc | - ජාතික ආරක්ෂක විද්‍යාලයේ උපාධිධාරී |
| NDT | - විනාශකාරී නොවන පරික්ෂා කිරීම් |
| NVG | - රාත්‍රී කාලයේ ඇස් ආවරණ |
| NVQ | - ජාතික වෘත්තීය සුදුසුකම |
| OEM | - මුල් උපකරණ නිෂ්පාදකයා |
| PABX | - පෞද්ගලික ස්වයංක්‍රිය දුරකථන අංශ හුවමාරුව |
| PAF | - පකිස්තානු ගුවන් හමුදාව |
| PBU | - නොමේරූ ළදරු සත්කාර ඒකකය |
| PDM | - කලින් කල සිදු කරන ඩිපෝ නඩත්තුව |
| psc | - මාණ්ඩලික පාසල සමත් |
| qfi | - සුදුසුකම්ලත් පියාසර උපදේශක |
| Qhi | - සුදුසුකම්ලත් හෙලිකොප්ටර් යාන උපදේශක |
| R&D | - පර්යේෂණ හා සංවර්ධන |
| RDW | - පර්යේෂණ හා සංවර්ධන පක්ෂාංගය |
| RMW | - රේඩාර් නඩත්තු පක්ෂාංගය |
| RSP | - රණ ශූර පදක්කම |
| RWP | - රණ වික්‍රම පදක්කම |
| SAR | - ගුවන් පරීක්ෂණ |
| SAARC | - දකුණු ආසියාතික කලාපිය සහයෝගිතා සංගමය |
| SCAPC | - ස්ථාවර කැබිනට් අනුමැතිය ලද ප්‍රසම්පාදන කමිටුව |
| SLAF | - ශ්‍රී ලංකා ගුවන් හමුදාව |
| SLN | - ශ්‍රී ලංකා නාවික හමුදාව |
| SNLR | - සේවය තවදුරටත් අවශ්‍ය නැත |
| SLT | - ශ්‍රී ලංකා ටෙලිකොම් |
| S&MD | - සැපයුම් හා නඩත්තු ගබඩාව |
| SNCO | - ජ්‍යෙෂ්ඨ අධිකාරී නොලත් නිලධාරී |
| SORs | - විශේෂ සිද්ධි වාර්තා |
| TTS | - වෘත්තීය පුහුණු පාසල |
| UAV | - නියමුවන් රහිත ගුවන් යානා |
| UNSS | - දකුණු සුඩානයේ ක්‍රියාත්මක එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම |
| USAF | - ඇමරිකා එක්සත් ජනපද ගුවන් හමුදාව |
| USP | - උත්තම සේවා පදක්කම |
| USPACOM | - ඇමරිකා එක්සත් ජනපද ගුවන් හමුදාවේ පැසිෆික් ගුවන් අණ හට පිරිස් |
| VSV | - විශිෂ්ට සේවා විභූෂණය |
| VIP | - ඉතා වැදගත් පුද්ගලයා (විශේෂ) |
| VVIP | - ඉතාමත් වැදගත් පුද්ගලයා (ප්‍රභූ) |
| w.e.f | - සිට ක්‍රියාත්මක වන පරිදි |
| WWV | - වීර වික්‍රම විභූෂණ |

ඇමුණුම 'අ'

## ORGANIZATION STRUCTURE OF SRI LANKA AIR FORCE HEADQUARTERS

